# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,508 — 1965 සැප්තැම්බර් 17 වැනි සිකුරාදා — 1965.9.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II) වැනි ඡේදය--පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1229 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | 1259 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1238 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම ... ... ... | 1257 | විවිධ දැන්වීම් ... ... ... | 1261 |


[සැළකිය යුතුයි.—(1) 1963 ජනවාරි සිට ජූනි දක්වා නිකුත් අංක 13,457 සිට 13,690 තෙක් ඇති ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රිකාවන්ට සූචියක් මෙම ගැසට් පත්‍රයට අතිරේකයක් වශයෙන් පළවේ.

(2) මෙවර ප්‍රසිඩ කරනු ලබන ගැසට් පත්‍රයේ V වැනි කොටසේ ,, කුලී මෝටර් රථ සේවාවන් පැවැත්වීම සඳහා මගීන් ගෙනයාමේ අවසර පත් ඉල්ලීමේ අයදුම් පත් ලැයිස්තුවක් පළවේ .]

## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස්පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩදෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවාවෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, යථා යෝග්‍ය පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුලට පත් කරනු ලබන නව ප්‍රවේශකයන්ගේ ආධුනික/පරීක්ෂා කාලය අවුරුදු තුනක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථා වලට මෙන් ම මින්මතු පනවනු ලබන ව්‍යවස්ථා වලට ද අනුකූලව නව ප්‍රවේශකයන් ක්‍රියා කළ යුතුය.

(iii) (ඒ) ඔවුන් තම ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයයෙන් ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(බී) ආධුනික/පරීක්ෂා කාලය ගතවී අවසන් වූ විට සේවයෙහි ස්ථිර කරන්නේ වෙනත් කරුණු අතර කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වය තෙක් වර්ග කර ඇති සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් ඔවුන් නියමිත කාලසීමා ඇතුළත සමත්වීම උඩය. නියමිත කාලසීමාව ඇතුළත මෙම ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීමට අපොහොසත් වුවහොත් ඒවා සමත්වන තෙක්, ලැබිය යුතු පඩි වැඩිවීම් නොගෙවා හැරීම එහි ප්‍රතිඵලය වන්නේ ය. තම ආධුනික/පරීක්ෂා කාලය කෙළවර වන විට කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ විභාගයෙන් සමත් නොවන යම් නිලධාරියෙක් වේ නම් ඔහුගේ සේවය කෙළවර කළ හැකි වන්නේ ය.

**සංලක්ෂ්‍යය.**—සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා රාජ්‍ය සේවයට බැඳෙන අය සේවයෙහි ස්ථිර කිරීමට පෙර සිංහල ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත්වීමේ නියමයෙන් නිදහස් වෙති.

(iv) මෙම ධුරයෙහි සේවය ස්ථිර කරන දින සිට අවුරුදු දෙකක් ඇතුළත සිංහල භාෂාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකින් සමත් වීමටද ඔවුන්ට නියම වනු ඇත.

**5. අවශ්‍ය සුදුසුකම්.**—(i) තමා ලාංකිකයකු වූ බවට තැනෙහා සක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුතුය. "ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරමා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම අඩුම අධ්‍යාපනික සුදුසුකම ලෙස නියමකොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන්නකු

(ඈ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැන ගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයා ගෙන් හෝ මහාචාර්යවරයා ගෙන් විය යුතුයි.

(ඉ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඊ) සිංහල විෂයයෙන් සමත් උසස් ම විභාගය පිළිබඳ සහතිකය.

සැ. යු.—(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය;

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නො හැකි වන අපේක්ෂකයන් ගේ අයදුම් පත් සලකා බලනු නො ලැබේ.

6. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් තම ඉල්ලුම් පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේ නමුදු වුවත්, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට පළමු ඔහු වෙත ලැබෙන පරිදි ඉල්ලුම් පත්‍රයේ අනුපිටපතක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත කෙලින්ම ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම් පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක් ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියකු ගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම් පත් ලැබුණු බව දන්වනු ඇත. සත් දිනක් ඇතුලත තම අයදුම් පත ලැබුණු බව දන්වන ලිපියක් නො ලත් අයදුම්කරුවකු වේනම් වහා ම ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම් කරුවකු මේ අවශ්‍යතාවය පැහැර හැරියහොත් තම අයදුම් පත සලකා බලනුවස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1965 සැප්තැම්බර් මස 13 වැනි දා,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය,
තැපැල් පෙට්ටිය 500.

9–768/1—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒඒ. 51/එක්ස්. 1582/65.

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### ලී මෝල් අධිකාරි තනතුර

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ලී මෝල් අධිකාරී තනතුරක් සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනා කරනු ලැබේ. මෙම කාර්යාලය මඟින් සපයනු ලබන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි සකස් කළ ඉල්ලුම් පත් පහත සඳහන් දිනවල හෝ ඊට පෙර හෝ මා වෙත ලැබෙන සේ එවිය යුතුයි :—

(අ) **මෙරට අයදුම්පත්.**—1965 ඔක්තෝබර් මස 1 වැනිදා.

(ආ) **විදේශීය අයදුම්පත්.**—1965 ඔක්තෝබර් මස 8 වැනිදා.

**සටහන.**—

(i) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය නොහැකිය. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුය;

(ii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. තම ඉල්ලුම්පත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවීම සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නතම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයයට නියමිත කාලසීමාව ඇතුළතදී භාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන;

(iii) **වෛද්‍ය පරීක්ෂණය සහ නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත්කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන් ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියේ පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුවෙයි.

**2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :**

(i) මේ තනතුර විශ්‍රාම වැටුප් සහිත ස්ථිර තනතුරක් වේ. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම කරනු ලබන්නේ තුන් අවුරුදු ආධුනික කාලයකට යටත් කොටය. දැනට රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත් ඔහු නියමිත කාලයක් තනතුරේ වැඩ බැලීමට පත්කරනු ලැබේ;

(ii) තෝරාගනු ලබන අයදුම්කරු දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට සූදානම් විය යුතුය.

**3. වැටුප් සහ දීමනා.**—වර්ෂයකට රු. 9,360 සහ රු. 11,760 සත අවස්ථාවලදී කාර්යක්ෂමතා කඩඉම්ද, වර්ෂයකට රු. 11.280 දී වර්ෂ 2 ක් වැටුප් වැඩි නොවීමද සහිතව, වර්ෂයකට රු. 4,080—360 න් 12 සහ 480 න් 10—රු. 13,200 දක්වා වූ වැටුප් ක්‍රමයක් තනතුරට අයත් වේ. වර්ෂයකට රු. 8,880 වැටුප් පියවර ඉක්මවා යාමට සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබාගත යුතුය.

ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ සුදුසු පියවරක් ලැබීමට තෝරාගනු ලබන අයදුම්කරුගේ සුදුසුකම් හා පළපුරුද්ද සෑහේ නම්, එවැනි අනුග්‍රහයක් භාණ්ඩාගාරයේ උපදෙස් අනුව දෙනු ලැබේ.

**4. අවශ්‍ය සුදුසුකම් :**

සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටු දායක සාක්ෂි ඉදිරිපත් කළයුතුයි:—

(අ) විශිෂ්ඨ චරිතයෙන් සහ හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව;

(ආ) 1965.10.1 වැනි දිනට වයස අවුරුදු 25කට නොඅඩු බව හා 40 කට නොවැඩි බව; (දැනට රජයේ සේවයේ නියුක්ත අයවළුන්ට මෙම වයස් සීමාවන් අදාල නොවනු ඇත.)

(ඇ) (i) ලන්ඩනයේ යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයේ සහචර සාමාජිකත්වය ලබා ඇති බව; හෝ

(ii) යාන්ත්‍රික ඉංජිනේරු විෂයයන් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයකින් බී.එස්සී (ඉංජිනේරු) උපාධිය ලබා ඇති බව; හෝ

(iii) ලන්ඩනයේ යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයේ සහචර සාමාජිකත්ව විභාගයේ I වැනි සහ II වැනි කොටස් වලින් හෝ එම විභාගවලින් නිදහස් කෙරෙන විභාගයකින් සමත්වී ඇති බව; හෝ

(iv) යටත් පිරිසෙයින් වැඩපලක ෆෝර්මන් තත්ත්වයේ වසර 5 ක් සහිතව යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ වසර 15 ක පළපුරුද්දක් ලබා තිබීම.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට අපේක්ෂකයින් සූදානම් විය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා නිකුත් කරන ලද සහතිකය හෝ බව්තීස්ම සහතිකය භාරගනු නොලැබේ.);

(ආ) උපාධිය හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය;

(ඇ) චරිත සහතික දෙකක් (මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.);

(ඉ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය;

(ඊ) සිංහල විෂයයෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය;

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් තම ඉල්ලුම්පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළයුතුය. එසේනමුදු වුවත්, ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට පළමු ඔහු වෙත ලැබෙන පරිදි ඉල්ලුම් පත්‍රයේ අනුපිටපතක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත කෙලින්ම ඉදිරිපත් කළයුතුය.

7. අයදුම්පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර, මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්පත ලැබුණු බව දන්වනු ඇත. සත් දිනක් ඇතුලත තම අයදුම්පත ලැබුණු බව දන්වන ලිපියක් නොලත් අයදුම්කරුවෙකු වෙයි නම්, වහාම ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙකු මේ අවශ්‍යතාවය පැහැර හැරියොත්, තම අයදුම්පත් සලකා බලනුවස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1965 සැප්තැම්බර් මස 13 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කායඨාලය,
තැ. පෙ. අංක 500.

9–768/2—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒබී. 34/එක්ස්. 1583—92/65.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පර්යේෂණ ආධුනික/පර්යේෂණ නිලධාරි තනතුරු

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණ ආධුනික/පර්යේෂණ නිලධාරි තනතුරු දහ තුනක් සඳහා ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂයෙන්ම අයැදුම් පත් මෙයින් කැඳවනු ලැබේ.

පර්යේෂණ නිලධරයන් බඳවා ගැනීමට අදහස් කෙරෙනුයේ පහත දක්වෙන ක්ෂේත්‍රයන් සඳහායි :—

(1) පැලෑටි නිරෝධායනය ... (අංක එක්ස් 1583)
(2) කීට විද්‍යාව ... (අංක එක්ස් 1584)
(3) පැලෑටි රෝග නිදාන විද්‍යාව (අංක එක්ස් 1585)
(4) ශස්‍ය විද්‍යාව ... (අංක එක්ස් 1586)
(5) පාංශු ක්ෂුද්‍ර ජීව විද්‍යාව ... (අංක එක්ස් 1587)
(6) උද්‍යාන විද්‍යාව ... (අංක එක්ස් 1588)
(7) පැලෑටි පෝෂණය ... (අංක එක්ස් 1589)
(8) කෘෂිකාර්මික යන්ත්‍රීකරණය (අංක එක්ස් 1590)
(9) ආහාර විද්‍යාව ... (අංක එක්ස් 1591)
(10) විධිමත් උද්භිද විද්‍යාව ... (අංක එක්ස් 1592)

**සංලක්ෂ්‍යය.**—(i) එක තනතුරකට වැඩි ගණනකට ඉල්ලුම් කරන අයදුම්කරුවන් ඒ සඳහා වෙන වෙනම ඉල්ලුම් පත් ඉදිරිපත් කළ යුතු ය. අදාල අංකය ද සඳහන් කළ යුතුය.

**(ii) මේ එක් එක් ක්ෂේත්‍රය සඳහා නිලධරයන් එක් කෙනෙකු හෝ වැඩි දෙනෙකු බඳවා ගැනීම ඒ ඒ ක්ෂේත්‍රය සඳහා සුදුසු අපේක්ෂකයන් සිටීම මත රඳා පවතී.**

2. මෙම කාර්යාලයයෙන් සැපැයෙන මුද්‍රිත ආකෘති පත්‍රවල සකස් කළ යුතු. අයැදුම් පත් පහත දක්වෙන දිනයන්හි දී හෝ ඊට පෙර මා වෙත ලැබිය යුතුය :—

(අ) **මෙරට අයදුම් පත්**—1965 ඔක්තෝබර් මස 1 වැනිද.

(ආ) **පිට රට අයැදුම් පත්**—1965 ඔක්තෝබර් මස 8 වැනිද.

**සටහන :**

(i) අයැදුම් පතක් හෝ ඒ පිළිබඳ ලිපියක් හෝ තැපැලේදී නැතිවූ බවට නැතහොත් ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය නොහැකිය. අවසාන දින වන තෙක් සිය අයැදුම් පත් ප්‍රමාද කිරීම නිසා සිදු විය හැකි අනර්ථයන් ඒ ඒ අපේක්ෂකයන් විසින්ම විඳ දරා ගත යුතුය ;

(ii) පිටරට සිටින අපේක්ෂකයන්ට, අයැදුම් පත් සඳහා මුද්‍රිත ආකෘති පත්‍ර පිටරට සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. එම අපේක්ෂකයන් තම අයැදුම් පත් ලංකාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ, ලේකම් වෙත ඉදිරිපත් කිරීම සඳහා තම පදිංචි රටට ආසන්නතම වශයෙන් සිටින ලංකා නියෝජිතයාගේ කායඨාලයයට එවීමට අදහස් කරන්නේ නම් ඔවුන්ට එසේ කළ හැකිය ;

(iii) **වෛද්‍ය පරීක්ෂණය සහ යාත්‍රා පත්‍ර.**—ලංකාණ්ඩුව යටතේ පත් කරනු ලැබීම සඳහා පිටරට සිටින ලාංකික නිලධරයන් තෝරා ගනු ලැබූ විට එම සේවය සඳහා ඔවුන් ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැනගනු වස් පිළිගත් වෛද්‍යවරයකු විසින් කෙරෙන වෛද්‍ය පරීක්ෂණයකට ඔවුන් පෙනී සිටිය යුතුය. එවැනි පරීක්ෂණ සඳහා අය කෙරෙන ගාස්තු මෙන්ම ලංකාවට ඒමට වැය වන යාත්‍රා පත්‍ර වියදම් ද එම නිලධරයන් විසින්ම දැරිය යුතු වේ.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරුවලට අදාළ වැටුප් පරිමාණය පහත දක්වේ. අවුරුද්දකට රු. 4,080 පටන්ගෙන රු. 360වේ වාර්ෂික වැඩිවීම් 12කින් සහ රු. 480වේ වැඩිවීම් 10කින්ද යුක්තව රු. 13,200 දක්වා වැඩි වී යයි. (රු. 8,400 සහ රු. 11,760 යන වැටුප් තලයන්ට පෙර ක්‍රියාත්මක වන කායඝ්ක්ෂමතා කඩඉම් ඇති අතර රු. 11,280වේ වැටුප් තලය මත දෙවෂීයක රැඳීමක් ද වේ.)

**සටහන :**

(අ) තෝරා ගනු ලැබූ අපේක්ෂකයා සවකීය විද්‍යාත්මක කායඝ්ක්ෂේත්‍රය පිළිබඳ නියමිත පශ්චාත් උපාධියක් හෝ උසස් තත්ත්වයේ ඩිප්ලෝමාවක් ලබා ගතහොත් විනා ඔහු/ඇය ඉහත සඳහන් වැටුප් පරිමාණයෙහි රු. 8,400යේ වාර්ෂික වැටුප් තලයෙන් ඔබ්බට යාමට සුදුසු නොවේ.

4. **පත්වීම සහ සේවය පිළිබඳ කොන්දේසි :**

(i) මෙම තනතුරු ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත වේ. මෙම පත්වීම් ප්‍රථම වශයෙන් දෙනු ලබන්නේ අවුරුදු 3ක ආධුනික කාලයක් මතය ;

(ii) ආධුනික තත්ත්වය මත සිටින අවුරුදු 3ක කාලය තුළ පුහුණුවක් ලැබීමට ද තෝරා ගනු ලබන අපේක්ෂකයාට සිදු වෙයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිශ්චය කෙරෙන ආකාරයේ විදේශීය පුහුණුවක් හදාරා එමගින් වැඩිමනත් සුදුසුකම් ලබා ගැනීමටද ඔහුට/ඇයට සිදුවනු ඇත. පුහුණු කාලය සතුටුදායක ලෙස අවසන්කොට දෙපාර්තමේන්තුව තීරණය කරන ආකාරයේ වැඩිමනත් සුදුසුකම් ලබා ගැනීමෙන් පසු ඔහු/ඇය පර්යේෂණ නිලධාරි වශයෙන් සවකීය තනතුරෙහි ස්ථිර කරනු ලැබේ.

5. **සුදුසුකම්.**—හැම අපේක්ෂකයකු විසින්ම තමා පහත සඳහන් අවශ්‍යතාවන්ගෙන් යුක්ත වන බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ට ආධ්‍යාත්මික චරිතයකින් සහ මනා ශාරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය ;

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක පළමුවැනි හෝ දෙවෙනි පෙළ ගෞරව උපාධියක් දරණ අපේක්ෂකයන් සම්බන්ධයෙන් නම් 1965.10.1 දිනට වයස අවුරුදු 30ට නොවැඩි විය යුතුය. පිළිගත් විශ්ව විද්‍යාලයක පශ්චාත් උපාධියක් දරණ අපේක්ෂකයන් සම්බන්ධයෙන් නම් එදිනට වයස අවුරුදු 35ට නොවැඩි විය යුතුය. (රජයේ සේවයෙහි නියුක්ත ස්ථිර පත්වීම් දරණ අය ගැන මෙකී වයස් සීමාවන් නොතකා සලකා බලනු ලැබේ.)

(ඇ) (i)* පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ හෝ නැතහොත් පහත දක්වෙන විෂයයන් අතුරින් (අදාළ වන පරිදි) ඕනෑම එකක් ප්‍රධාන විෂය වශයෙන් ගෙන ලබා ගත් පළමු වැනි හෝ දෙවැනි පෙළ සහිත ගෞරව උපාධියක් දරණ උපාධිධරයකු විය යුතුය :—

(අ) **උද්භිද විද්‍යාව.**—පැලෑටි නිරෝධායනය, පැලෑටි රෝග නිදාන විද්‍යාව, ශස්‍ය විද්‍යාව, පාංශු ක්ෂුද්‍ර ජීව විද්‍යාව, පැලෑටි පෝෂණය සහ විධිමත් උද්භිද විද්‍යාව යන ක්ෂේත්‍රයන් සඳහායි.

(ආ) **සත්ව විද්‍යාව.**—පැලෑටි නිරෝධායනය සහ කීට විද්‍යාව යන ක්ෂේත්‍රයන් සඳහායි.

(ඇ) **කෘෂිකාර්මික ඉංජිනේරු විද්‍යාව.**—කෘෂිකාර්මික යන්ත්‍රීකරණය පිළිබඳ ක්ෂේත්‍රය සඳහායි.

(ඈ) **උද්භිද විද්‍යාව.**—අතිරේක විෂය වශයෙන් රසායන විද්‍යාව—ආහාර විද්‍යාව පිළිබඳ ක්ෂේත්‍රය සඳහායි.

**සැ. යු.*** ලංකාවේ විශ්ව විද්‍යාලවල අවසාන පරීක්ෂණයට පෙනී සිට ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින අයගෙන් ද අයැදුම් පත් භාරගනු ලැබේ. එහෙත් විශ්ව විද්‍යාලයෙන් ප්‍රතිඵල නිකුත් කළ වහාම එම පරීක්ෂණයෙන් තමා සමත් වී තිබේද යන වග ඔවුන් විසින් මා වෙත දැනුම් දිය යුතුය.

**නැතහොත්**

(ii) පහත දැක්වෙන ඕනෑම ක්ෂේත්‍රයක් පිළිබඳ පිළිගත් විශ්ව විද්‍යාලයක පශ්චාත් උපාධියක් තිබිය යුතුය :—

1. ශස්‍ය විද්‍යාව
2. ව්‍යවහාර කීට විද්‍යාව
3. පැළෑටි රෝග නිදාන විද්‍යාව
4. පාංශු ක්ෂුද්‍රජීව විද්‍යාව
5. උද්‍යාන විද්‍යාව
6. පැළෑටි පෝෂණය
7. ජීව රසායන විද්‍යාව
8. කෘෂිකාර්මික ඉංජිනේරු විද්‍යාව සහ
9. ආහාර විද්‍යාව.

**නැතහොත්**

(iii) අවුරුදු 10ක සේවයක් ඇත්තාවූද පර්යේෂණ කටයුතු කෙරෙහි උද්‍යොගයක් ඇත්තාවූ ද, පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳව **හෝ**
පහත දැක්වෙන විෂයයන්ගෙන් (අදාළ වන පරිදි) ඕනෑම එකක් ප්‍රධාන විෂය වශයෙන් ගෙන ලබා ඇති උපාධියක් දරණ, දෙපාර්තමේන්තුවේ නියුක්ත නිලධාරියකු විය යුතුය :—

(අ) **උද්භිද විද්‍යාව.**—පැළෑටි නිරෝධායනය, පැළෑටි රෝග නිදාන විද්‍යාව, ශස්‍ය විද්‍යාව, පාංශු ක්ෂුද්‍ර ජීව විද්‍යාව, පැළෑටි පෝෂණය සහ විධිමත් උද්භිද විද්‍යාව යන ක්ෂේත්‍රයන් සඳහා යි.

(ආ) **සත්ව විද්‍යාව.**—පැළෑටි නිරෝධායනය සහ කීට විද්‍යාව යන ක්ෂේත්‍රයන් සඳහායි.

(ඇ) **කෘෂිකාර්මික ඉංජිනේරු විද්‍යාව.**—කෘෂිකාර්මික යන්ත්‍රීකරණය සහ ක්ෂේත්‍රය සඳහායි.

(ඈ) **උද්භිද විද්‍යාව.**—අතිරේක විෂය වශයෙන් රසායන විද්‍යාව—ආහාර විද්‍යාව පිළිබඳ ක්ෂේත්‍රය සඳහායි.

**සටහන.—අදාළ විෂය පිළිබඳ පළපුරුද්දක් සහ/හෝ පශ්චාත් උපාධි සුදුසුකම් ඇති අපේක්ෂකයන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.**

6. පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් හෝ සියල්ලම හෝ ඉදිරිපත් කරන ලෙස නියම කළ විටක අපේක්ෂකයන් විසින් ඒවා ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්න ලියාපදිංචි කිරීමේ සහතිකය (සැ. යු.—බව්තිස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලාවල ප්‍රයෝජනය සඳහා නිකුත් කර ඇති උප්පැන්න සහතිකය හෝ භාරගනු නොලැබේ) ;

(ආ) උපාධි සහතිකය හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය ;

(ඇ) චරිත සහතික දෙකක්—මෙයින් එකක් අධ්‍යයන කටයුතු පිළිබඳ අධ්‍යක්ෂගෙන්, විද්‍යාලීය ආචාර්‍යවරයාගෙන් හෝ මහාචාර්‍යවරයාගෙන් ලබාගත්තක් විය යුතුය. (මෙම උප ඡේදය යටතේ දැනටමත් රජයේ සේවයේ නියුක්ත අපේක්ෂකයන් විසින් චරිත සහතික පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ) ;

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය ;

(ඉ) සිංහලෙන් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

**සටහන.**—(i) කිසිම ලියවිල්ලක් හෝ ලියවිලිවල පිටපත් හෝ අයැදුම්පතට නොඇමිණිය යුතුය.

(ii) ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස නියම කළ විට එසේ කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයැදුම් පත් ගැන සලකා බලනු නො ලැබේ.

7. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් තම ඉල්ලුම් පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එනෙකුදු වුවත්, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට පළමු ඔහු වෙත ලැබෙන පරිදි ඉල්ලුම් පත්‍රයේ අනුපිටපතක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත කෙළින්ම ඉදිරිපත් කළ යුතුය.

8. මේ සම්බන්ධ අයැදුම් පත් හෝ වෙනත් කවර ලියවිල්ලක් හෝ එවිය යුත්තේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ, ලේකම් වෙත විනා දෙපාර්තමේන්තුවේ කවර නිලධරයකුගේ හෝ පෞද්ගලික නමට නොවේ.

9. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයෙහි පළවී ඇති, රජයේ සේවයේ තනතුරුවලට අදාළ පොදු කොන්දේසි කෙරෙහිද අවධානය යොමු කරනු මැනවි.

10. හැම අයදුම්පතක්ම ලැබුණු බව දන්වනු ලැබේ. අයැදුම් පත් භාර ගන්නා අවසාන දිනයේ සිට දින 7ක් ඇතුළතදී එවැනි දැනුම් දීමක් නොලත් අයදුම්කරුවන් විසින් ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ, ලේකම් වෙත වහාම දන්විය යුතුය. මේ විධානය පිළිපැදීමට අපොහොසත්වීම, අදාළ අපේක්ෂකයාගේ අයිතිවාසිකම් සලකා බැලීම අහිමිවීමට හේතු වෙයි.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1965 සැප්තැම්බර් මස 13 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්‍යාලයේ දීය.
තැ. පෙ. 500.

9–768/3—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ වාප්පු පරිපාලක තනතුර

ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ වාප්පු පරිපාලක තනතුර සඳහා ඉල්ලුම් පත් භාරගනු ලැබේ. පහත සඳහන් ආකෘති පත්‍රයට අනුකූලවනසේ පිළියෙල කරණ ලද අයදුම්පත් 1965 සැප්තැම්බර් මස 30 වැනි දිනට හෝ ඊට ප්‍රථම ලියා පදිංචි කළ තැපෑලෙන් කොළඹ 1, සර් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ, ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරී වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

**2. සේවයෙහි නියුක්ත කරවීමේ වගන්ති හා සේවා කොන්දේසි :**

(i) තනතුර ස්ථිරය, එහෙත් විශ්‍රාම වැටුප් රහිතය. තෝරාගත් අපේක්ෂකයා රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය ;

(ii) පත්වීම අවුරුදු 3 ක පරීක්ෂණ කාල සීමාවකට යටත් ය. ස්ථිර නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත් නියමිත කාල සීමාවකට වැඩ බැලීමට ඔහු පත් කරණු ඇත ;

(iii) තෝරා ගනු ලබන අයදුම්කරු ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තියේ අවශ්‍යතාවයන්ට යටත් වේ.

(iv) ස්ථිර ලේකම් විසින් නියම කරණු ලබන ආකාරයට, ඔහු විසින් නියම කරණු ලබන ප්‍රමාණයකින්, තෝරාගත් අයදුම්කරු ඇප තැබිය යුතුයි.

3. **වැටුප් සහ දීමනා.**—වසකට රු. 3,900න් පටන් ගෙන රු. 180 බැගින්වූ වාර්ෂික වැඩිවීම් 8කින් හා රු. 240ක වාර්ෂික වැඩිවීම් 2 කින් රු. 5,820 දක්වා වැඩිවන වැටුප් ක්‍රමයක් මෙම තනතුරට අදාලය. වර්ෂයකට රු. 4,800ට පෙර කාර්‍යක්ෂමතා කඩ ඉමක් ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින්ම පහත සඳහන් කරුණු සනාථ කිරීම පිණිස සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව සහ එළිමහනේ වැඩ කිරීම සඳහා රුචියක් ඇති බව ;

(බී) (i) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙක් ; හෝ

(ii) ආණ්ඩුවේ හෝ වෙළඳ සේවා ආයතනයක විධායක ශ්‍රේණි තනතුරක හෝ පරිපාලක තනතුරක හෝ අවුරුදු 5ට නොඅඩු පළපුරුද්දක් ඇති ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී සිටිය යුතුය ;

(සී) 1965 සැප්තැම්බර් මස 30 වැනි දිනට තම වයස අවුරුදු 25ට අඩු නොවීම හා අවුරුදු 40ට නොවැඩි විය යුතුය. (මෙම වයස් සීමාවන් දැනට රජයේ සේවයේ සිටින අයට බලපාන්නේ නැත).

(ඩී) කම්කරුවන් පාලනය කිරීම, ප්‍රවාහණ සංවිධානය කිරීම ආදිය ගැන හැකියාවක් තිබිය යුතුය.

**සංලක්ෂ්‍යය.**—වාප්පු වැඩ පිළිබඳ පළපුරුද්ද අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලිවල පිටපත් අයදුම් පතට අමුණා එවිය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උප කෘත පාසැල් හි ප්‍රයෝජනය සඳහා නිකුත් කරණ ලද සහතික හෝ බව්තිස්ම සහතිකය භාරගනු නොලැබේ) ;

(බී) උපාධිය හෝ උසස්ම අධ්‍යාපන සහතිකය ;

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් හෝ විය යුතුය ;

(ඩී) වෘත්තීය හා/හෝ කාර්මික සහතිකය ;

(ඊ) පළපුරුද්ද පිළිබඳ සහතික ;

(ඇෆ්) සිංහල විෂයයෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

6. අයදුම් පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියවිලි සියල්ලක්ම ගබඩා අධිකාරීට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය. ලියුම් කවරයේ වම්පස උඩ කෙලවරේ "වාප්පු පරිපාලක තනතුර" කියා සඳහන් කළ යුතුය.

7. රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් විසින් එවනු ලබන ඉල්ලුම් පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන ඉල්ලුම් පත් භාරගනු ලබන්නේ එම ඉල්ලුම් පත් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට නියමිත දිනයේදී හෝ ඊට ප්‍රථම ලැබුණු බවට හා ප්‍රමාද වීමට හේතුවූ විලංගුවූ කරුණු ඉදිරිපත් කරමින් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් එය භාර ගන්නා ලෙස නිර්දේශ කිරීමෙන් පමණකි.

8. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරණ පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරණු ලැබේ.

ඇස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1965 සැප්තැම්බර් මස 13 වැනි දින,
කොළඹ 1, සර් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ,
ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ දීය.

ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

## වාප්පු පරිපාලක තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :———.
   (ඒ) වාසගම :———.
   (බී) අනිකුත් නම් :———.
2. ලිපිනය :—
   (ඒ) කාර්යාලීය :———.
   (බී) පුද්ගලික :———.
3. 1965.9.30 වෙනි දිනට වයස හා උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) :———.
4. උපන් ස්ථානය :—
   (ඒ) අයදුම්කරු :———.
   (බී) අයදුම්කරුගේ පියා :———.
   (සී) අයදුම්කරුගේ පියාගේ පියා :———.
   (ඩී) අයදුම්කරුගේ සීයාගේ පියා :———.
5. ජාතිය :———.
6. උත්පත්තියෙන්ද නැතහොත් ලියා පදිංචි කිරීමෙන්ද :———.
7. අධ්‍යාපනික සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුයි) : ———.
8. වෘත්තීය හා/හෝ කාර්මික සුදුසුකම් :———.
9. සිංහල භාෂාවෙන් සමත් උසස්ම විභාගය :———.
10. කම්කරුවන් පාලනය කිරීම, ප්‍රවාහන සංවිධානය කිරීම යනාදිය පිළිබඳව පළපුරුද්ද :———.
11. වාප්පු වැඩ පිළිබඳ පළපුරුද්දක් තිබේද :———.
12. දැනට දරණ තනතුර, ශ්‍රේණිය හා ඊට පත්වූ දිනය :———.
13. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ ලිපිනයන් (පිටපත් ඇමිණිය යුතුයි) :—
    1. ———.
    2. ———.

මෙම අයදුම්පතෙහි දැක්වෙන සියළුම තොරතුරු සත්‍ය සහ නිවැරදි බව මම සහතික කරමි. මෙහි සඳහන් කිසිම කරුණක් අසත්‍ය හෝ වැරදි සහගත බැව් තෝරා ගැනීමට පෙර එළිදරව් වුවහොත් මා මෙම තනතුර සඳහා නුසුදුස්සකු වන බවත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බව එළිදරව් වුවහොත්, කිසිම වන්දියක් නොගෙවා සේවයෙන් පහ කර ඇමීමට ඉඩකඩ ඇති බවත් මම දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

9–748—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

අංකය : ශිෂ්‍ය/515.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### විදේශීය ශිෂ්‍යත්ව

පහත සඳහන් ශිෂ්‍යත්ව ප්‍රදානයන් සම්බන්ධයෙන්, එකිනෙක ඉදිරියෙන් දක්වා ඇති දිනයන්හි ලංකා රජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනවල 3 (ඉ) ඡේදය මෙයින් අවලංගු කරනු ලැබේ :—

(අ) 1966 එක්සත් රාජධානි පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව ... ... 1965.8.13 දින ගැසට් පත්‍රය
(ආ) 1966 මලයාසියානු පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව ... ... 1965.8.20 දින ගැසට් පත්‍රය
(ඉ) ආර්ථික සංවර්ධන ශිෂ්‍යත්ව, ඉතාලිය ... 1965.8.20 දින ගැසට් පත්‍රය
(ඊ) 1966 නයිජීරියානු පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව ... ... 1965.8.27 දින ගැසට් පත්‍රය
(උ) 1966 කැනඩා පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව ... ... 1965.9. 9 දින ගැසට් පත්‍රය

2. මේ ප්‍රදානයන් සියල්ලම සඳහා අයදුම් පත් භාරගනු ලබන කාල සීමාව 1965.9.30 වැනි දින පස්වරු 4.30 දක්වා දීර්ඝ කරන ලදී.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965.9.9 වැනි දින,
කොළඹ 3, "සිරිමතී පායේ",
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ය.

9–731—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ විද්‍යා විෂයයන් පිළිබඳ කථිකාචාර්ය තනතුර

කොළඹ, ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ විද්‍යා විෂයන් සඳහා වූ කථිකාචාර්ය තනතුරක් සම්බන්ධයෙන් ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ. මෙම තනතුර සඳහා වූ සියලුම ඉල්ලුම් පත්‍ර පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කොට 1965 ඔක්තෝබර් 2 වනදාට හෝ ඊට පෙර මා වෙත එවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රුපියල් 3,180 න් පටන් ගෙන රු. 120 බැගින් වූ වාර්ෂික වැටුප් වැඩිවීම් 6 කින් හා රු. 180 බැගින් වූ වාර්ෂික වැටුප් වැඩිවීම් 5 කින් යුක්තව රු. 4,800 දක්වා වූ වාර්ෂික වැටුපක් මෙම තනතුරට හිමිය. රු. 4,080 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත.

3. **සේවාවේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනාත්දරු අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සියලුම අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් විද්‍යාව පිළිබඳව උපාධියක් ලබා සිටිය යුතු අතර උපාධි පරීක්ෂණයේදී උද්භිද විද්‍යා හා සත්ව විද්‍යාව හෝ රසායන විද්‍යාවෙන් හෝ භෞතික විද්‍යාවෙන් හෝ සාමාර්ථය ලබා සිටිය යුතුය. සිංහල භාෂාවෙන් ඉගැන්වීමේ හැකියාවක් තිබිය යුතුය.

(ආ) 1965.10.2 වයස අවුරුදු 25 කට නොඅඩු විය යුතු අතර, අවුරුදු 40 කට නොවැඩි වී සිටිය යුතුය. දැනට මෙම දෙපාර්තමේන්තුවේ සේවයෙහි නියුක්ත නිලධාරීන් කෙරෙහි මෙකී උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.

5. අයදුම් කරුවන්ගේ ඉල්ලුම් පත් වලට පහත සඳහන් සහතික පිටපත් (මුල් පිටපත් නොවේ) අමුනා එවිය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කරන ලද සහතික භාර ගනු නොලැබේ.)

(බී) ලබා ඇති අධ්‍යාපනික සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික.

(සී) මෑතකදී ලබාගත් චරිත සහතික පත් 3 ක්.

අයදුම්පත්‍ර හෝ ඒ පිළිබඳ වෙනත් ලියකියවිලි කොළඹ 8, කෝට්ටෙ පාර, අ යුර්වේද දෙපාර්තමේන්තුවේ ආයුර්වේද කොමසාරිස් තුමාගේ නිලනාමයට මිස මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරි යෙකුගෙ පුද්ගලික නමට නොඑවිය යුතුය.

මේ පිළිබඳව රජයේ ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II) වන ඡේදයේ සඳහන් පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි බලන්න.

**සැලකිය යුතුය.**—ඉල්ලුම් පත්‍ර සමග අමුනා එවන කිසිම ලියවිල්ලක් ආපසු එවනු නොලැබේ.

ආයුර්වේද කොමසාරිස්.

1965.9.11,
කොළඹ 8,
ආයුර්වේද දෙපාර්තමේන්තුව.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**විද්‍යා විෂයයන් පිළිබඳ කථිකාචාර්ය තනතුරක්—ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය**

(1) සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
(අ) පෙලපත් නාමය :————.
(ආ) අනික් නම් :————.
(2) ලිපිනය :————.
(3) උපන් දිනය සහ ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)
1965.10.2 සම්පූර්ණ වයස. අවු :——, මාස :——, දින :——.
(4) ජාතිය :————.
(5) අධ්‍යාපනික සුදුසුකම් :————.
(6) වෘත්තීය සුදුසුකම් :————.
(සහතික පිටපත් ඇමිණිය යුතුය)
(7) ඉගැන්වීමේ පළපුරුද්ද :————.
(8) වෙනත් සුදුසුකම් :————.

මා විසින් මෙම අයදුම් පතෙහි සඳහන් කර ඇති තොරතුරු සැබෑ බවද, නිවැරදි බවද, මෙයින් සහතික කර සිටිමි. මෙහි දක්වා ඇති තොරතුරු යම් හෙයකින් අසත්‍ය බව හෝ වැරදි බව හෝ තෝරා ගැනීමට පෙර දැනගන්නට ලැබුණහොත් මා පත්වීම ලැබීමට නුසුදුස්සෙකු වන බවද, පත්වීමට පසු දැනගන්නට ලැබුනහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා සේවයෙන් පහ කරනු ලබන බවද, මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–669—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**සංඛ්‍යාලේඛන නිලධාරි තනතුර**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන නිලධාරි තනතුරක් සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. පහත සඳහන් ආකෘති පත්‍රයේ අන්දමට තමන්ගේම අත් අකුරින් සම්පූර්ණ කරන ලද අයදුම්පත් 1965.10.9 දිනට පෙර ලැබෙන සේ "ජනලේඛන හා සංඛ්‍යා ලේඛන අධ්‍යක්ෂ, තැ. පෙ. 563, කොළඹ 7" යන ලිපිනයට ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතු අතර පුද්ගලිකව මා නමට හෝ මෙම කාර්යාලයේ අන් කිසි නිලධාරියකු නමට නොඑවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය, විශේෂ දීමනා හා සේවය පිළිබඳ කොන්දේසි :—**

රු. 3,180 න් පටන්ගෙන රු. 120 වාර්ෂික වැටුප් වැඩිවීම් 6 කින් ද, රු. 180 වාර්ෂික වැටුප් වැඩිවීම් 8 කින් හා රු. 240 වාර්ෂික වැටුප් වැඩිවීම් 6 කින් ද යුක්තව රුපියල් 6,780 දක්වා උසස් වන වාර්ෂික වැටුප් ක්‍රමයක් මේ තනතුරට අයත් වේ. රු. 4,080, රු. 4,800 හා රු. 5.580 වාර්ෂික වේතනයන්ට පළමු නියම කරන ලද කාර්යක්ෂමතා කඩඉම් විභාගයන්ගෙන් සමර්ථ විය යුතුය. තවද, පත්වීම් ලබන අයදුම්කරුවෝ ඉහත සඳහන් කාර්යක්ෂමතා කඩයිම්වලින් ඔබ්බට උසස් වීම් ලබනු සඳහා දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන හෝ වෙනත් නියම කරනු ලබන විභාග ආදියෙන් සමර්ථ විය යුත්තෝ වෙති.

3. **සේවාවට බඳවා ගැනීමේ කොන්දේසි :—**

මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන අයදුම්කරු අවුරුදු තුනක ආධුනික සේවා කාලයකට යටත්වනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම් :—**

සෑම අයදුම්කරුවෙක්ම ඔහු හෝ ඇය පහත සඳහන් සුදුසුකම් හිමි බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) ලාංකිකයකු බව ;

(ආ) 1965. 10. 9 දිනට අවුරුදු 22 ට නොඅඩු හෝ අවුරුදු 35 ට නොවැඩි බව (යටත් පිරිසෙයින් පස් අවුරුද්දක අඛණ්ඩ කාලයක් ජනලේඛන හා/හෝ සංඛ්‍යාලේඛන කටයුතුවල නිරත වූ දෙපාර්තමේන්තු නිලධාරීන් සම්බන්ධයෙන් මෙම වයස් සීමාව අත්හැර දමනවා ඇත) ;

(ඇ) සංඛ්‍යාති, ගණිතය, අර්ථ ශාස්ත්‍රය, ප්‍රජා විද්‍යාව, සමාජ විද්‍යාව හෝ මානව විද්‍යාව සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ඇති බව (ගෞරව උපාධිධාරීන් කෙරේ වැඩි සැලකිල්ලක් දක්වනු ඇත) ;

(ඈ) ඉතා හොඳ චරිතයක් ඇති බව.

5. අයදුම්කරුවන් විසින් පහත සඳහන් පරිදි තමාගේ සහතික පත්‍රවල පිටපත්, ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය :—

(1) ඉල්ලුම්කරුගේ උප්පැන්න සහතිකයේ පිටපත (බව්තීස්ම කිරීමේ සහතිකය හෝ ආධාර ලබන පාඨශාලා රීති අනුව නිකුත් කරන ලද උප්පැන්න සහතිකවල පිටපත් භාරගනු නොලැබේ),

(2) අයදුම්කරු ලබා ඇති උසස්ම අධ්‍යාපනික හෝ වෘත්තීය සහතිකවල පිටපත්,

(3) මෙම තනතුර සඳහා අයදුම්කරු තමාගේ අධ්‍යාපනික සුදුසුකම්, චරිතය, හැකියාව හා වෙනත් සුදුසුකම් මත ලැබූ චරිත සහතික පත් තුනක පිටපත් (මේ ඡේදය අනුව, දැනට රජයේ සේවයෙහි යෙදී සිටින අයදුම්කරුවන් සහතික පත් ඉදිරිපත් කිරීම අනවශ්‍යය).

**සංලක්ෂ්‍යය.**—ඉහත සඳහන් මුල් සහතික පත්‍ර පුද්ගලිකව පවත්වන සම්මුඛ පරීක්ෂණයෙහිදී ඉදිරිපත් කරනු මිසා තමන්ගේ ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් නොකළ යුතුය.

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ මුල පළකර ඇති, රාජ්‍ය සේවා තනතුරුවලට කෙරෙන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසිද බලන්න.

ඒ. ආර්. රත්නවේල්,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ.

1965 සැප්තැම්බර් මස 9 වෙනිදා,
කොළඹ 7, තැ. පෙ. 563,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.

## ආදර්ශ ආකෘති පත්‍රය

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව—සංඛ්‍යාලේඛන නිලධාරි තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍රය**

1. අයදුම්කරු කරන තනතුර හා ඒ ප්‍රසිද්ධ කරන ලද නිවේදනයට සැසඳුම :————.
2. සම්පූර්ණ නම, ජාතිය හා ලිපිනය :————.
(ඉතා පැහැදිලි ලෙස ලියන්න.)
3. උපන් දින, උපන් ස්ථානය :————.
හා 1965. 10. 9 දිනට වයස අවුරුදු :——, මාස :——, දින :——.
4. විවාහක නම්. විවාහවූ දිනය හා ළමයින් ගණන :————.
5. අධ්‍යාපනික සුදුසුකම් හා උපාධිය ලැබීම සඳහා ගත් විෂයයන් :————.
(සමර්ථ වූ දිනය හා ප්‍රධාන විෂයය වෙන් වෙන්ව සඳහන් කරන්න).
6. ඉගෙනුම ලැබූ විද්‍යාලයයන් හා එයින් අස්වූ දිනය :————.
7. දැනට යෙදී සිටින රක්ෂාව හා දැනට ලබන වාර්ෂික වැටුප් :————.
8. පාඨශාලා හැරයාමෙන් පසු යෙදී සිටි රක්ෂා හා ඉන් අස්වූ දින (රජයේ සේවයක යෙදී සිටියේ නම් ඒ පිළිබඳ සියලු තොරතුරු සඳහන් කළ යුතුයි.) :————.
9. සිංහල හෝ දෙමළ කියවීම. ලිවීම හා පරිවර්තනය පිළිබඳ ප්‍රවීණතාවය (සමර්ථවූ විභාග පිළිබඳ තොරතුරු සඳහන් කළ යුතුය.) :————.
10. විශේෂ සුදුසුකම් (වෘත්තිය, කාර්මික, ක්‍රීඩා, බාලදක්ෂ කටයුතු, සමාජසේවා වැඩ, ශුභ සාධක වැඩ) :————.
11. සංඛ්‍යාලේඛන පිළිබඳ පළපුරුදුකම්වල විස්තර :————.
12. පිටපත් අමුණා ඇති චරිත සහතික ලබාගත් අයවලුන් තිදෙනකු ගේ නම් හා ඔවුන්ගේ නිලතල :————.
13. අයදුම්කරු පුද්ගලික වශයෙන් හඳුනන දෙදෙනෙකුගේ නම් හා ඔවුන්ගේ නිලතල (සහතික ලබාගත් අයගේ නම් හැර) :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–655—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

## ලංකා ගමනාගමන මණ්ඩලය

### පුරප්පාඩු

මණ්ඩලීය සංවිධානයේ වෛද්‍ය කොට්ඨාශයේ බෙහෙත් සැල් කරු තනතුරක් සඳහා ඉල්ලුම් පත් එවන මෙන් ලංකාවේ පුරවැසියන්ට මෙයින් ආරාධනය කරනු ලැබේ.

2. **පඩි ක්‍රමය.**—මසකට (සියළු දීමනාවන් ඇතුළුව) රු. 250—10 × 15—රු. 400. රු. 310 ටත් රු. 360 ටත් පෙර කාර්යක්ෂමතා කඩයිම් සහිතය.

3. **සුදුසුකම්.**—(i) වයස 1965. 9. 1 වෙනිදා වනවිට අවුරුදු 25 නොඅඩුවූද, අවුරුදු 35 නොවැඩිවූද අය විය යුතුයි.

(ii) **වෘත්තීය සුදුසුකම්.**—ලංකා වෛද්‍ය විද්‍යාලයේ බෙහෙත් සැල් කරුවන්ගේ (Pharmacist) විභාගය.

(iii) **පළපුරුද්ද.**—අවුරුදු 2 කේ සිට 3 දක්වා.

4. **සේවා කොන්දේසි.**—තෝරන අපේක්ෂකයා 1 වෙනි වතාවේදී තුන් අවුරුදු ප්‍රවාසන කාලයක් පිට පත් කරනු ලැබේ. ඔහුට පහත පෙනෙන දේ කිරීමට නියම කරනු ලැබේ:—

(1) පත්වීමට කලින් ශාරීරික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකින් සමත් වීම ;

(2) දැනටමත් පනවා ඇත්තාවූද කලින් කළ පනවන්නාවූද මණ්ඩලීය ව්‍යවස්ථාවන් හා රෙගුලාසි පිළිපැදීම ;

(3) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම්වස්, ප්‍රවාසන කාලය තුලදී මණ්ඩලය විසින් නියම කරන ප්‍රමාණයට සිංහලෙන් ප්‍රවීණත්වයක් ලබාගැනීම ;

(4) මණ්ඩලීය අර්ථසාධක අරමුදල සඳහා පඩියෙන් සියයට 10 ක් දායක මුදල් ගෙවීම. ඔවුන් වෙනුවෙන් ගෙවන මණ්ඩලීය දායක මුදල සියයට 15 කි ;

(5) ලංකාවේ කොයි පෙදෙසෙහිත්, මණ්ඩලීය සංවිධානයේ කොයි කොට්ඨාසයෙහිත් සේවය කිරීම.

5. කොයි අපේක්ෂකයා විසිනුත් පහත සඳහන් මේවා ගැන සම්පූර්ණ තොරතුරු සඳහන් කළ යුතුයි:—

(අ) වයස, අධ්‍යයනික හා වෛද්‍යක සුදුසුකම්, ප්‍රායෝගික අභ්‍යාසය හා පළපුරුද්ද ;

(ආ) පාඨශාලාවෙන් අස්වූදා සිට කළ රක්ෂාවල් පිළිබඳ විස්තර, ලැබුණු පඩි හා දැරූ තනතුරු සහිතව ;

(ඇ) උසාවියකින් ක්‍රිමිනල් අපරාධයක් සම්බන්ධයෙන් වරදකරුවෙකු යයි නිශ්චය කර තිබේද යන වග. එසේ කර තිබේ නම් ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර. තවද කොයි අපේක්ෂකයා විසිනුත් තමා සඳහන් කළ විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් සහතික කරමින් තම ඉල්ලුම් පත්‍රයෙහි ප්‍රකාශයක්ද කළ යුතුයි. එහි සඳහන් වූ යම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව තෝරා ගැනීමට කලින් සොයා ගතහොත් එයින් තමා නුසුදුස්සකු විය හැකි නියාව හා තෝරා ගැනීමට පසුව සොයා ගතහොත් වන්දියක් නොමැතිව තම සේවාවෙන් පහකර දමනු ලැබිය හැකි නියාව තමා දන්නා බවත්.

6. ඉල්ලුම්කරුවන් විසින් තමන් ගැන තොරතුරු දැනගත හැකි දෙදෙනෙකුගේ නම්ද ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කළ යුතුයි. උප්පැන්න සහතික පත්‍රය ය, අධ්‍යයන සහතික පත්‍රය ය, යෝග්‍යතා සහතික පත්‍රය ය යන මේවායේ පිටපත් ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුයි.

7. සියළු ඉල්ලුම් පත්‍ර කොළඹ 5, නාරාහේන්පිට කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවක මණ්ඩල කළමනාකාර තැන වෙත 1965 හේ ඔක්තෝම්බර් මස 2 වෙනි සෙනසුරාදාට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුයි.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
සේවක මණ්ඩල කළමනාකාරතැන.

1965 හේ සැප්තැම්බර් මස 9 වෙනි දින,
කොළඹ 5, කිරුළ පාරේ,
200 වෙනි ස්ථානයේදිය.

9–742—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව

### II ශ්‍රේණියේ ලිපිකරු (කැෂියර්) තනතුර සඳහා ඇබෑර්තු

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ II ශ්‍රේණියේ ලිපිකරු (කැෂියර්) තනතුරක් සඳහා අපේක්ෂිත සුදුසුකම් ඇති ලාංකිකයන් ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

**වැටුප් ක්‍රමය.**—රු. 250—10 × 10, 15 × 10—රු. 500 (සියල්ල අඩංගු මාසික)

**සුදුසුකම් :**

(අ) අයදුම්කරුවන් වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය ;

(ආ) ජ්‍යෙෂ්ඨ සහතිකය හෝ අධ්‍යයන පොදු සහතික සාමාන්‍ය විභාගයේදී විෂයයන් 6 ක් සහිතව හා රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ පිළිගත් වෙළඳ ආයතනයක මුදල් පරිහරණය සම්බන්ධව අවුරුදු 5 ක පළපුරුද්දක් තිබිය යුතුය.

**ඇප.**—තෝරා ගනු ලබන අපේක්ෂකයා විසින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මගින් ලබා ගන්නා ලද රක්ෂණ ඔප්පුවක් මගින් රුපියල් 5,000 ඇප තැබිය යුතුයි.

රජයේ අංශයේ ඉල්ලුම් පත් ඔවුනොවුන්ගේ දෙපාර්තමේන්තු, සංස්ථා හෝ මණ්ඩල මගින් ඉදිරිපත් කළ යුතුයි.

මෙහි පහත සඳහන් ආකෘති පත්‍රය අනුව, සකස් කරන ලද ඉල්ලුම් පත්‍ර 1965 ඔක්තෝබර් 2 වැනි දිනට හෝ ඊට ප්‍රථම—

සභාපති,
ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව,
තැ. පෙ. 670,
242, හැව්ලොක් පාර,
කොළඹ 5

යන ලිපිනයට ලැබෙන ලෙස එවිය යුතුයි. තැපෑලේදී ප්‍රමාද වන හෝ නැතිවන ඉල්ලුම් පත්‍ර ගැන මෙම සංස්ථාව වග නොකියනු ලැබේ.

මෙම කාර්යාලයෙන් ඉල්ලුම් පත්‍ර නිකුත් නොකරන අතර, ඉල්ලුම් පත්‍ර ලැබුන බව දන්වා නොඑවන බැව් සැලකිය යුතුය.

ලේකම්.

1965.9.13.

### ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව

..................................................................තනතුර

1. සම්පූර්ණ නම :————.
   (අ) අගට යෙදෙන නම :————.
   (ආ) වෙනත් නම් :————.

2. තැපැල් ලිපිනය :————.

3. (අ) උපන් දිනය හා ස්ථානය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුය.)

4. ජාතිය :————.

5. කසාද බැඳලාද, නැද්ද යන වග :————.
   (කසාද බැඳලාද, තනිකඩද, භාර්යාව මළ කෙනෙක් ද යන්න සඳහන් කරන්න. කසාද බැඳලා නම් කසාද බැඳි දිනය හා ළමයින් ගණන සඳහන් කරන්න.)

6. ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් හා එය ලැබූ දිනයද, පෙනී සිටි විෂයයන් ද සඳහන් කරන්න :————
   (සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුයි)

7. පාසැලින් අස්වූවාට පසු සේවය පිළිබඳ විස්තර: සේවයට බැඳුන දින, අස්වූ දින, සේවය කළ සේව්‍යයාගේ නම හා ලිපිනය, ලැබූ වැටුප් හා කළ සේවා සඳහන් කරන්න :————
   (සහතිකවල පිටපත් තිබේ නම් අමුණා එවන්න.)

8. (අ) සිංහල පිළිබඳ ප්‍රවීණත්වය :————.
   (ආ) ඉංග්‍රීසි පිළිබඳ ප්‍රවීණත්වය :————.
   (සමත් වී ඇති ඉහළම පරීක්ෂණය සඳහන් කරන්න.)

9. චරිත සහතික දී ඇති අයගේ නම් හා තනතුරු. මෙම සහතික වල පිටපත් අමුණා එවිය යුතුයි :—
   (1) ————.
   (2) ————.
   (3) ————.

10. ඔබ සඳහන් කිරීමට කැමති වෙනත් විස්තර :————.

ඔබ තෝරා ගනු ලැබුවහොත් වැඩ භාර ගත හැකි ළඟම දිනය සඳහන් කරන්න :————.

මා විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කොට ඇති විස්තර නිවැරදි හා සත්‍ය බව සහතික කරමි. මෙහි සඳහන් කිසියම් විස්තරයක් අසත්‍ය හෝ වැරදි බැව් හෙළිවුවහොත් තෝරා ගැනීමට ප්‍රථම හෝ තෝරා ගැනීමෙන් පසු මා නුසුදුස්සෙකු කිරීමටත්, පත් කිරීමෙන් පසු වැරදි බැව් හෙළි වුවහොත් කිසිම වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් බවද මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

9–738—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

## ලංකා ගමනාගමන මණ්ඩලය
### පුරප්පාඩු

මණ්ඩලීය සංවිධානයේ වෛද්‍ය කොට්ඨාශයේ ඇපොතකරි තනතුරක් සඳහා ඉල්ලුම් පත් එවන මෙන් ලංකාවේ පුරවැසියන්ට මෙයින් ආරාධනය කරනු ලැබේ.

2. **පඩි ක්‍රමය.**—මසකට (සියළු දීමනාවන් ඇතුළුව) රු. 500—20×5 සහ 25×8—රු. 800, රු. 625 වත් රු. 750 වත් පෙර කාර්යක්ෂමතා කඩයිම් සහිතව. (තෝරාගනු ලබන අපේක්ෂකයා ඔහුට ඇති සුදුසුකම් හා පළපුරුද්ද අනුව යථෝක්ත පඩි ක්‍රමයේ සුදුසු පියවරක තැබිය හැක.)

3. **සුදුසුකම්—**

(i) වයස—1965.9.1 වෙනිදා වන විට අවුරුදු 25 ට අඩු නොවූද, අවුරුදු 35 ට නොවැඩිවූද විය යුතුයි.

(ii) වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද—යටත් පිරිසෙයින් අවුරුදු 3 නේ සිට 4 දක්වා කාලයක පළපුරුද්ද සහිතව ලංකා වෛද්‍ය විද්‍යාලයේ ඇපොතිකරි විභාගය.

(iii) සිංහල පිළිබඳ ප්‍රවීණත්වයක් ලබා තිබීම අතිරේක සුදුසුකමක් වනවා ඇත.

4. (ඒ) රාජ්‍ය සේවාවෙහි හෝ පළාත් පාලන සේවාවෙහි සිටින නිලධාරීන් එවන ඉල්ලුම් පත්‍ර සැලකිල්ලට භාජනය කරන්නේ ඔවුන් දැන් සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් 1957 නේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පණතේ 9 වෙනි වගන්තිය අනුව මණ්ඩලය යටතේ සේවය කිරීමට ඔවුන් නිදහස් කිරීමට එකඟ වෙතොත් පමණකි. නැතහොත් ඒ නිලධාරීන් ඔවුන් දැන් සිටින රාජ්‍ය සේවාවෙන් හෝ පළාත් පාලන සේවාවෙන් ඉල්ලා අස් වීමට කැමති වෙතොත් පමණකි.

රාජ්‍ය සේවාවේ පළාත් පාලන සේවාවේ සිටින නිලධාරීන් තෝරාගනු ලැබුවහොත් 1 වෙනි වනාවට ඔව්හු එක් අවුරුදු කාල පරිච්ඡේදයක් සඳහා ද්විතීයනය පිට පත් කළ හැකිය. එසේ පත් කළ හොත් ඔවුන්ගේ පඩිය හා සෙසු පත් කිරීම් කොන්දේසි භාණ්ඩාගාරයෙන් තීරණය කරන පරිදි වන්නේ ය.

(බී) සංයුක්ත මණ්ඩලවල සිටින්නාවූද දැන්වීම් අනුව සුදුසුකම් ඇත්තාවූද නිලධාරීන් එවන ඉල්ලුම් පත්‍ර සැලකිල්ලට භාජන කරන්නේ ඒ නිලධාරීන් දැන් සේවය කරන සංයුක්ත මණ්ඩලයේ සභාපති මහතා හෝ සාමාන්‍යාධිකාරී මහතා ඔවුන් (පත් කිරීමට) තේරුණොත් තම සේවාවෙන් නිදහස් කිරීමට එකඟ වෙතොත් පමණකි. ඉල්ලුම් පත්‍ර සංයුක්ත මණ්ඩලය මගින් එවිය යුතුයි.

5. **සේවා කොන්දේසි.**—තේරුන අපේක්ෂකයා 1 වෙනි වනාවේදී තුන් අවුරුදු ප්‍රවාසන කාලයක් පිට පත් කරනු ලැබේ. ඔහුට පහත පෙනෙන දේ කිරීමට නියම කරනු ලැබේ.

(1) පත්වීමට කලින් ශාරීරික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකින් සමර්ථවීම.

(2) දැනටමත් පනවා ඇත්තාවූද කලින් කල පනවන්නාවූද මණ්ඩලීය ව්‍යවස්ථාවන් හා රෙගුලාසි පිළිපැදීම.

(3) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම වස්, ප්‍රවාසන කාලය තුලදී මණ්ඩලය විසින් නියම කරන ප්‍රමාණයට සිංහලෙන් ප්‍රවීණත්වයක් ලබා ගැනීම.

(4) මණ්ඩලීය අර්ථසාධක අරමුදල සඳහා පඩියෙන් සියයට 10 ක් දායක මුදල් ගෙවීම. ඔවුන් වෙනුවෙන් ගෙවන මණ්ඩලීය දායක මුදල සියයට 15 කි.

(5) ලංකාවේ කොයි පෙදෙසෙහිත්, මණ්ඩලීය සංවිධානයේ කොයි කොට්ඨාශයෙහිත් සේවය කිරීම.

කොයි අපේක්ෂකයා විසිනුත් පහත සඳහන් මේවා ගැන සම්පූර්ණ තොරතුරු සඳහන් කළ යුතුයි :—

(අ) වයස, අධ්‍යයනික හා වෛධික සුදුසුකම්, ප්‍රායෝගික අභ්‍යාසය හා පළපුරුද්ද.

(ආ) පාඨශාලාවෙන් අස්වූදා සිට කළ රක්ෂාවල් පිළිබඳ විස්තර, ලැබුණ පඩි හා ඇරූ තනතුරු සහිතව.

(ඇ) මීට කලින් මණ්ඩලීය සේවාවේ යම් තනතුරක් ඉල්ලුවේද යන බවත්, එසේ නම් ඊට කුමක් වූයේද යන වග.

(ඈ) උසාවියකින් ක්‍රිමිනල් අපරාධයක් සම්බන්ධයෙන් වරදකරුවෙකු යයි නිශ්චය කර තිබේද යන වග. එසේ කර තිබේ නම් ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර .

තවද කොයි අපේක්ෂකයා විසිනුත් තමා සඳහන් කළ විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් සහතික කරමින් තම ඉල්ලුම් පත්‍රයෙහි ප්‍රකාශයක්ද කළ යුතුයි. එහි සඳහන් වූ යම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව තෝරා ගැනීමට කලින් සොයා ගතහොත් එයින් තමා නුසුදුස්සකු විය හැකි නියාව හා තෝරා ගැනීමෙන් පසුව සොයා ගතහොත් වන්දියක් නොමැතිව තම සේවාවෙන් පහකර දමනු ලැබිය හැකි නියාව තමා දන්නා බවත්.

6. ඉල්ලුම්කරුවන් විසින් තමන් ගැන තොරතුරු දැනගත හැකි දෙදෙනෙකුගේ නම්ද ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කළ යුතුයි. උප්පැන්න සහතික පත්‍රය ය, අධ්‍යයන සහතික පත්‍රය ය, යෝග්‍යතා සහතික පත්‍රය ය යන මේවායේ පිටපත් ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුයි.

7. සියළු ඉල්ලුම් පත්‍ර කොළඹ 5, නාරාහේන්පිට කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවක මණ්ඩල කළමනාකාරතැන වෙත 1965 හේ ඔක්තෝම්බර් මස 2 වෙනි සෙනසුරාදාට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුයි.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
සේවකමණ්ඩල කළමනාකාරතැන.

1965 හේ සැප්තැම්බර් මස 6 වෙනි දින,
කොළඹ 5, කිරුළ පාරේ, 200 වෙනි ස්ථානයේදීය.

9-602—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව
### අනියම් ඉංග්‍රීසි ලඝුලේඛකයෙකුගේ තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා ලාංකිකයන්ගෙන් ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ.

2. පහත දැක්වෙන අඩුම සුදුසුකම් අයදුම්කරුවනට තිබිය යුතුය.

(අ) (i) **අධ්‍යාපන සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (ඉංග්‍රීසි) විභාගයේ විෂයයන් හයක් සහිතව සමත් වී සිටීම. (සිංහල ගැන විශේෂ දැනීමක් ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.)

(ii) විනාඩියකට වචන 100 ක වේගයෙන් ලඝු සටහන් ගැනීම සහ විනාඩියකට වචන 30 ක වේගයෙන් ටයිප් කිරීමට හැකියාවක් තිබීම.

(ආ) වයස අවුරුදු 40 කට නොවැඩි විය යුතුයි.

3. **වැටුප්.**—දිනකට රුපියල් 3.50 වේතනයක්, අනිකුත් දීමනා සහිතව ලැබෙනු ඇත.

4. මෙම පත්වීම හුදෙක්ම අනියම් අන්දමිනි.

5. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ (II) වැනි ඡේදය ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්කිරීම්වලට අදාල පොදු කොන්දේසි වෙනද, අවධානය යොමු කරවමි.

6. පහත දැක්වෙන ෆෝර්මයට අනුකූලවන සේ සකස් කළ යුතු අයදුම්පත් 1965 සැප්තැම්බර් මස 28 වෙනි දිනට හෝ ඊට පෙර, කොළඹ 7, තැ. පෙ. 537, දරණ එඩින්බරෝ චන්ද්‍රවංකයෙහි ගොවිජන සේවා කොමසාරිස් වෙත ලැබෙන සේ එවිය යුතුය.

ගොවිජන සේවා කොමසාරිස්.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
42, එඩින්බරෝ චන්ද්‍රවංකය,
තැ. පෙ. 537,
කොළඹ 7.
1965 සැප්තැම්බර් 9 දින.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**අනියම් ඉංග්‍රීසි ලඝුලේඛකයෙකුගේ තනතුර—ගොවිජන සේවා දෙපාර්තමේන්තුව**

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් ස්ථානය හා දිනය :————.
4. ජාතිකත්වය හා වර්ගය :————.
5. අධ්‍යාපනික සුදුසුකම් :————.
6. ලඝුලේඛනය හා යතුරු ලේඛනය පිළිබඳ සුදුසුකම් :————.
7. පාඨශාලාවෙන් අස්වූවාට පසු කරන ලද රැකියාවල් පිළිබඳ විස්තර :————.
8. වෙනත් සුදුසුකම් :————.

ඉහත සඳහන් කරන ලද විස්තර නිවැරදි බවට මින් සහතික කරමි.

————
අයදුම්කරුගේ අත්සන.

දිනය :—

9-703—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**ගබඩා භාරකාර තනතුරු (ගොවිපලවල් හි හා ව්‍යාප්ති මධ්‍යස්ථාන)**

රජයේ දෙපාර්තමේන්තුවල තාවකාලික ගබඩා භාර කරුවන්ගෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ (ගොවිපලවල හා ව්‍යාප්ති මධ්‍යස්ථාන වල) ගබඩා භාරකරුවන් සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට අදාල වැටුප් ක්‍රමය වර්ෂයකට රුපියල් 888—72—2,184 ක් වේ. වැටුප් වර්ෂයකට රුපියල් 1,608 වීමට පෙර කාර්යක්ෂමතා කඩඉමෙන් සමත් විය යුතුය.

3. **සේවා කොන්දේසි.**—

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම අවුරුදු 3 ක ආධුනික කාලයකට යටත් වේ;

(ii) තෝරාගත් අයදුම්කරුවන් විසින් අවුරුදු තුනක සේවා කාලය තුළදී තමා සේවය කරන ප්‍රදේශයේ වැසියන් සමග සිංහලෙන් හා දෙමළෙන් රාජකාරි කටයුතු කිරීම සඳහා එකී භාෂාවන්ගෙන් ප්‍රවීණතාවයක් ලබාගත යුතුය.

4. **සුදුසුකම් :**—සෑම අපේක්ෂකයෙකුම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) (i) රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් ආයතනයක අඩු වශයෙන් තුන් අවුරුද්දක ගබඩා භාරකාර පළපුරුද්දක් හා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත් වී සිටීම, අවුරුදු පතා අවශ්‍යවන භාණ්ඩ වර්ග ඇස්තමේන්තු කිරීම, අගය තක්සේරු කිරීම, භාණ්ඩ ඉල්ලුම් පත්‍ර සකස් කිරීම හා කාර්යාලීය වැඩ පිළිබඳ පළපුරුද්ද ආදී අතිරේක සුදුසුකම් තිබීම, හෝ

(ii) රජයේ දෙපාර්තමේන්තුවක අවුරුදු 5 කට නොඅඩු ගබඩා භාරකාර සේවයේ පළපුරුද්දක් හා කණිෂ්ඨ පාඨශාලා විභාගයෙන් සමත් වී සිටීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත වීම.

5. සියලුම ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් අමුනා එවිය යුතුය :—

(i) උප්පැන්න සහතිකය (**සැලකිය යුතුයි—බව්තීස්ම සහතිකය** හෝ උපකෘත පාඨශාලා පිළිබඳ නීති සංග්‍රහය අනුව නිකුත් කළ උප්පැන්න සහතික පත්‍රය පිළිගනු නොලැබේ.)

(ii) අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් පිළිබඳ උසස්ම සහතික පත්‍ර වල පිටපත්.

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයෙහි පළවී ඇති රාජ්‍ය සේවා තනතුරුවලට අදාළ පොදු කොන්දේසි ද කියවා බලන්න.

7. පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුකූල වනසේ පිළියෙල කළ ඉල්ලුම් පත්‍ර 1965 සැප්තැම්බර් මස 30 වැනි දින හෝ ඊට පෙර පේරාදෙණියේ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා වෙත ලැබෙන ලෙස ඉල්ලුම් කරුගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ මාර්ගයෙන් එවිය යුතුය. මොනම කරුණක් නිසා හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂගේ පුද්ගලික නමට ඉල්ලුම් පත් එවිය යුතු නොවේ. මේ සඳහා විශේෂ ආකෘති පත්‍ර සපයනු නොලැබේ.

ඩී. සී. එල්. අමරසිංහ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1965 සැප්තැම්බර් මස 3 වැනි දින,
පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දීය.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව—පේරාදෙණිය

**ගබඩා භාරකාර තනතුරු (ගොවිපල හා ව්‍යාප්ති මධ්‍යස්ථාන) සඳහා ඉල්ලුම් පත්‍රයේ ආකෘතිය**

(1) සම්පූර්ණ නම :———.

(2) ලිපිනය :———.

(3) උපන් දිනය හා වයස :———.

(4) උපන් ස්ථානය :—

(අ) අයදුම්කරුගේ :———.

(ආ) අයදුම්කරුගේ පියාගේ :———.

(ඇ) අයදුම්කරුගේ පිය පාර්ශවයේ පියාගේ :———.

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශවයේ මුත්තාගේ :———.

අයදුම්කරු ලංකාවේ උපත ලබා සිටී නම්, (අ) වගන්තිය ඇතුළු (ආ) වගන්තිය හෝ (ඇ), (ඈ) වගන්ති දෙකද පිරවිය යුතුය. අයදුම්කරු ලංකාවේ උපත නොලැබුයේ නම් (අ) වගන්තිය ඇතුළු (ආ) සහ (ඇ) වගන්තිය හෝ (ඇ) (ඈ) වගන්ති දෙක පිරවිය යුතුය.

(5) අයදුම්කරු ලියා පදිංචි වීමෙන් හෝ පරම්පරාවෙන් ලංකාවේ පුරවැසි භාවය ලබා සිටී ද :———.

(6) අධ්‍යාපන සුදුසුකම් :———.

(7) අවුරුදු පතා අවශ්‍ය භාණ්ඩ වර්ග ඇස්තමේන්තු කිරීම හා අගය තක්සේරු කිරීමේ භාණ්ඩ ඉල්ලුම් පත්‍ර සකස් කිරීම හා කාර්යාලීය වැඩ පිළිබඳ පළපුරුද්ද :———.

(8) දැනට කරන රක්ෂාව :———.

(9) කලින් කළ රක්ෂාවල් හා ඒ පිළිබඳ විස්තර :———.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

මගේ අංකය :———.

කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙතටය.

(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය)

———,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :———.

9–660—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—රාජාංගන ව්‍යාපාරය

රාජාංගන ව්‍යාපාරයේ දකුණු ඉවුරු අතු ඇල අංක 3හි 2 වෙනි සැතපුම කැපීම. (ටෙන්ඩර් අංක ආර්. එල්. 18) සඳහා ටෙන්ඩර්පත් 65.10.5 වෙනි දින පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 30,000කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ හැක.

3. 1965.10.1 වෙනි දින තෙක් (එදින ඇතුළුව) කාර්යාලීය වේලාවන් තුළදී රාජාංගන වාරිමාර්ග ඉංජිනේරුතුමාගෙන් ලබාගත හැකි පෝර්ම වල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුයි.

ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් සේවය කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද? නැද්ද? යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරුතැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රු. 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියලුම වැඩි විස්තර, ගිවිසුම්, වැඩය පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කාර්යාලීය වේලාවන් තුළදී රාජාංගන වාරිමාර්ග ඉංජිනේරුතුමාගෙන් ලබාගත හැක.

ක. බ. එ. ද. සී. කරුණාරත්න,
වාරිමාර්ග ඉංජිනේරු—රාජාංගන ව්‍යාපාරය, ද. ඉ.

1965 සැප්තැම්බර් මස 3 වැනි දින,
වාරිමාර්ග කාර්යාලය,
රාජාංගන ව්‍යාපාරය, තඹුත්තේගම.

9–552/1—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—රාජාංගන ව්‍යාපාරය

රාජාංගන ව්‍යාපාරයේ දකුණු ඉවුරු අතු ඇල අංක 3හි 5 වන සැතපුම කැපීම. (ටෙන්ඩර් අංක ආර්. එල්. 19) සඳහා ටෙන්ඩර්පත් 65.10.5 වෙනි දින පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 35,000කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූකොන්ත්‍රාත් කරුවන්ට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ හැක.

3. 1965.10.1 වෙනි දින තෙක් (එදින ඇතුළුව) කාර්යාලීය වේලාවන් තුළදී රාජාංගන වාරිමාර්ග ඉංජිනේරුතුමාගෙන් ලබාගත හැකි පෝර්ම වල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුයි.

ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් සේවය කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද? නැද්ද? යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරුතැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රු. 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියලුම වැඩි විස්තර, ගිවිසුම්, වැඩය පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කාර්යාලීය වේලාවන් තුළදී රාජාංගන වාරිමාර්ග ඉංජිනේරුතුමාගෙන් ලබාගත හැක.

ක. බ. ඒ. ද. සී. කරුණාරත්න,
වාරිමාර්ග ඉංජිනේරු—රාජාංගන ව්‍යාපාරය, ද. ඉ.

1965 සැප්තැම්බර් මස 3 වැනි දින,
වාරිමාර්ග කාර්යාලය,
රාජාංගන ව්‍යාපාරය, තඹුත්තේගම.

9-552/2—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—රාජාංගන ව්‍යාපාරය

රාජාංගන ව්‍යාපාරයේ දකුණු ඉවුරු අතු ඇල අංක 3හි 6 වන සැතපුම කැපීම. (ටෙන්ඩර් අංක ආර්. එල්. 20) සඳහා ටෙන්ඩර්පත් 65.10.5 වෙනි දින පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 30,000කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත් පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ හැක.

3. 1965.10.1 වෙනි දින තෙක් (එදින ඇතුළුව) කාර්යාලීය වේලාවන් තුළදී රාජාංගන වාරිමාර්ග ඉංජිනේරුතුමාගෙන් ලබාගත හැකි පෝර්ම වල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුයි.

ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් සේවය කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද? නැද්ද? යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරුතැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රු. 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියලුම වැඩි විස්තර, ගිවිසුම්, වැඩය පිළිබඳ සැලසුම් විශේෂ විස්තර යනාදිය කාර්යාලීය වේලාවන් තුළදී රාජාංගන වාරිමාර්ග ඉංජිනේරුතුමාගෙන් ලබාගත හැක.

ක. බ. ඒ. ද. සී. කරුණාරත්න,
වාරිමාර්ග ඉංජිනේරු—රාජාංගන ව්‍යාපාරය, ද. ඉ.

1965 සැප්තැම්බර් මස 3 වැනි දින,
වාරිමාර්ග කාර්යාලය,
රාජාංගන ව්‍යාපාරය, තඹුත්තේගම.

9-552/3—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ 1 හි මහලේකම් කාර්යාලයේ අංක 355 දරණ කාමරයේ ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1965 ඔක්තෝබර් මස 5 වැනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කොළඹ උප කොට්ඨාශයේ රත්මලාන නිවාස යෝජනා ක්‍රමයේ සහ වැඩ පොළෙහි කුණු කසළ ක්‍රමවත් ලෙස බැහැර කිරීමේ ව්‍යාපාරයන් ඉදි කිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

රුපියල් 1,00,000 කට හෝ ඊට වැඩි ගණනකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පමණක් ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවන්ට මේ වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැකිය. කොළඹ 5 හේ ජාවත්ත පාරේ බස්නාහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි ටෙන්ඩර් පත් අනු පිටපතකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. වාරිමාර්ග අධ්‍යක්ෂ වෙත හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක රු. 250 ක් ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් තැන්පත් කර ඇති බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයවලුන්ට කාර්යාලීය වේලාව තුළ දී 1965 ඔක්තෝබර් මස 1 වැනි සිකුරදා හෝ ඊට පෙර දිනවල ටෙන්ඩර් පත් නිකුත් කරණු ලැබේ. මේ සම්බන්ධ වැඩිදුරටත් විස්තර කොළඹ 5 හේ ජාවත්ත පාරේ බස්නාහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ඩී. ජේ. රාමනායක,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

1965 සැප්තැම්බර් මස 7 වැනි දින,
කොළඹ දීය.

9-607—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මිනිපේ උප කොටස

1965-66 වර්ෂයේ මිනිපේ උප කොට්ඨාශයේ ගබඩා ප්‍රවාහනය කිරීම සඳහා ටෙන්ඩර් 1965 ඔක්තෝබර් මස 13 වෙනි දින පෙරවරු 10 දක්වා මහනුවර මධ්‍යම කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම එහිදී සිදු කරනු ලැබේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 15,000කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිති හා ග්‍රාමසංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක.

3. ගබඩා ද්‍රව්‍යය ප්‍රවාහනය කිරීම සඳහා ටෙන්ඩර් පත් ඉල්ලීමේදී අඩු වශයෙන් ඔවුන් සතු ලොරි දෙකක් තිබිය යුතු අතර ඒවායේ ලියා පදිංචි කිරීමේ බලපත්‍ර ඉදිරිපත් කළ යුතුය.

4. 1965 සැප්තැම්බර් 20 වෙනි දින සිට 1965 ඔක්තෝබර් මස 11 වැනි දිනතෙක් (එදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුළදී මිනිපේ, මාතලේ, හසලක, නුවර සහ නුවරඑළිය උප කොට්ඨාශය කාර්යාල යන්ගෙන් ලබාගත හැකි පෝරමවල ටෙන්ඩර් පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් පත් සහ දැනට තමා යටතේ ඇති දෙපාර්තමේන්තු වැඩ හා ප්‍රගතිය සඳහන් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු අතර රුපියල් 25 ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ වෙනුවට ලබාගත් කුවිතාන්සියක්ද ඉදිරිපත් කළ යුතුය.

5. මෙම වැඩය පිළිබඳ සියළුම විස්තර කාර්යාලය වේලාවන් තුළදී මිනිපේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

ජෝ. පරමදාස්,
වාරිමාර්ග ඉංජිනේරු තැන්,
මිනිපේ උප කොටස.

1965 සැප්තැම්බර් මස 7 වෙනි දින,
මිනිපේ වාරිමාර්ග කාර්යාලයේ දීය.

9-692—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වයඹ කොට්ඨාශයේ හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරයේ පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1965 ඔක්තෝබර් 19 වැනි දින දක්වා වයඹ කොට්ඨාශයේ කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් ටෙන්ඩර් භාරගෙන ඒ වේලාවේදීම විවෘතකර බලනු ලැබේ.

| වැඩ විස්තර | ලියාපදිංචි මුදල් ප්‍රමාණය | | ටෙන්ඩර් තැන්පත් මුදල් | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| 1. ප්‍රධාන දකුණු ඇලේ සැතපුම් 5 හේ දම්වැල් 0 සිට සැතපුම් 5 දම්වැල් 27 දක්වා ඇල ඉදිකිරීම ... ... ... | 34,000 | 0 ... | 50 | 0 |
| 2. ප්‍රධාන දකුණු ඇලේ සැතපුම් 5 දම්වැල් 27 සිට සැතපුම් 6 දක්වා ඇල ඉදිකිරීම ... ... ... ... | 46,000 | 0 ... | 50 | 0 |

1965 ක්වූ ඔක්තෝබර් මස 15 වෙනි දින දක්වා කායඁාවේලාවන්හි දී වයඹ කොට්ඨාශයේ සෑම උප කොට්ඨාශයකම වාරිමාර්ග ඉංජිනේරු කායඁාල වලින් ලබාගත් ටෙන්ඩර් පෝර්මවල ටෙන්ඩර් අයදුම්පත්‍ර සකස්කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේ දී, ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර්කරුවන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශණයක් ඔවුනට ටෙන්ඩර්කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද, යන්න සලකා බැලීම සඳහා සෑම උප කොට්ඨාශයකම වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළයුතුය. පෝර්ම ලබාගැනීමේ දී රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් පෝර්ම ලබාගන්නා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත හෝ එම මුදල ඕනෑම කච්චේරියක තැන්පත්කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

මේ ටෙන්ඩර් ගැන සියළුම තොරතුරු, වැඩි විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැලසුම්, යනාදිය කායඁාල වේලාවන්හිදී හක්වටුනා ඔය ව්‍යාපාරය භාර වාරි මාර්ග ඉංජිනේරු තැනගෙන් අසා දැනගත හැක.

ඇස්. සිවලිංගම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරය.

1965 සැප්තැම්බර් මස 8 දින,
මකුල්පොත.

9–661—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

බදුල්ල උප කොට්ඨාශයේ අඹේවෙල ජලාශයේ බැම්ම හා වාන සහිත පාලම සෑදීම සඳහා ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් අයැදුම් පත් කොළඹ, තැ. පෙ. අංක 500, මහා ලේකම් ගොඩනැගිල්ලේ අංක 355 දරණ කාමරයෙහි ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1965 ඔක්තෝබර් මස 12 වැනි කුජ දින පූර්ව භාග 10.00 වන තෙක් භාර ගනු ලැබේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙහි එකක රු. 100,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ පස් වැඩ කිරීමට යෝග්‍ය යන්ත්‍ර ඇති කොන්ත්‍රාත්කරුවනට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයැදුම් පත් ඉදිරිපත් කළ හැක. බණ්ඩාරවෙල ඌව කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත් ටෙන්ඩර් පෝර්ම, අනු පිටපතක් සමග පුරවා ඉදිරිපත් කළ යුතුය.

රුපියල් 250 ක ටෙන්ඩර් ඇප මුදලක් වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් කාර්යාලයීය වේලාවන් තුල 1965 ඔක්තෝබර් මස 8 වැනි කිවි දින හෝ ඊට පෙර බණ්ඩාරවෙල, ඌව කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයෙන් පෝර්ම ලබා ගත හැක.

මේ ගැන වැඩි විස්තර බණ්ඩාරවෙල ඌව කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

ඩී. ජේ. රම්නායක,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

1965 සැප්තැම්බර් මස 11 දින,
කොළඹ දීය.

9–712—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## ආණ්ඩුවේ මුද්‍රණාලය

### කායඁාලයීය භෝජනාගාරය

කොළඹ බොරැල්ලේ පිහිටි ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවෙහි ලිපිකරු සේවක මණ්ඩලයට 1965 ඔක්තෝම්බර් මස 16 වැනි දිනෙන් ආරම්භව 1966 ඔක්තෝම්බර් 15 දසින් අවසන් වන කාල පරිච්ඡේදය තුළ ආහාර සහ කෑම බීම ආදිය සැපයීම සඳහා මුද්‍රා (සීල්) තබන ලද ටෙන්ඩර් 1965 ඔක්තෝම්බර් මස 1 ද දහවල් 12 තෙක් මා විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් බහාලන කවරයේ වම් කෙළවරෙහි උඩ "ලිපිකරු භෝජනාගාරය සඳහා ටෙන්ඩර්" යන්න පැහැදිළිව සඳහන් කළ යුතුය.

2. ටෙන්ඩර් ආකෘති පත්‍ර ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ කාර්යාලයෙන් ලබාගත හැකිය. එම ටෙන්ඩර් ආකෘති පත්‍ර අනුපිටපතක් ද සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති, බොරැල්ල, කොළඹ, යන ලිපිනයට එවිය යුතුය. නිර්ව්‍යාජ ඉල්ලුම් කරුවන්ට රුපියල් 10ක මුදලක් තැන්පත් කළවිට ටැන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලබන අතර අසාර්ථක වූ ටැන්ඩර්කරුවන් වෙත එම මුදල ආපසු ගෙවනු ලැබේ.

3. ටැන්ඩර් ආකෘති පත්‍රයෙහි සඳහන් විස්තර අනුව ඒ ඒ ආහාර සහ කෑම බීම් සැපයිය හැකි මිල ගණන් ටැන්ඩර්කරුවන් විසින් සඳහන් කළ යුතුය.

4. තම ටැන්ඩරය භාරගත් බව දන්වා දින තුනක් ඇතුළත, සාර්ථක ටැන්ඩර්කරු විසින් රුපියල් 250ක මුදලක් ඇප වශයෙන් ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ කාර්යාලයෙහි තැන්පත් කළ යුතුය. මෙසේ තැන්පත් කළ මුදල කොන්ත්‍රාත්තුව සතුටුදායක ලෙස ඉටු කිරීමේ ඇපයක් වශයෙන් තබාගනු ඇත. කොන්ත්‍රාත්තුවට අනුව, නියමිත කාල පරිච්ඡේදය තුළ එහි සඳහන් පරිදි ක්‍රියා කිරීමට හෝ එය සම්පූර්ණ කිරීමට හෝ නොහැකි වුවහොත් තෝරාගත් කොන්ත්‍රාත්කරු අලාභ ගෙවීමට යටත් ය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ සතුටට හේතුවන පරිදි කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීමෙන් පසු මෙම මුදල ආපසු ගෙවනු ලබනවා ඇත.

5. කෑම පිසීමේ පහසුකම් ඇත්තේ සීමිත වශයෙන් පමණකි. එහෙත් භෝජනාගාර කාමරය හැරුනු විට තේ ආදිය පිළියෙල කර ගැනීමට භෝජනාගාරකරුට හැකිවනු පිණිස ගබඩා කාමරයක් ලැබෙනු ඇත.

6. සාර්ථක ටැන්ඩර්කරු රුපියල් 25ක මාසික ගෙවල් කුලියක් ගෙවීමට කැමති විය යුතුය. භෝජනාගාරයක් පවත්වාගෙන යාම සඳහා නගර සභාවට ගෙවිය යුතු අවසර පත්‍ර ගාස්තුවද ඔහු විසින් ගෙවිය යුතුය.

7. සියළුම හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති සතුය.

8. ටැන්ඩරය භාරගත් බව දැන්වූ විගස සහ අවශ්‍ය මුදල් තැන්පත් කළ වහාම කොන්ත්‍රාත්කරු ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති සමග ගිවිසුමකට බැඳිය යුතුය.

9. ගිවිසුම් ඔප්පුවට ගැසිය යුතු මුද්දර සඳහා යන වියදම් සාර්ථක ටැන්ඩර්කරු විසින් දැරිය යුතුය.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1965 සැප්තැම්බර් 17 දින,
කොළඹ, ආණ්ඩුවේ මුද්‍රණාලයේ දීය.

9–693—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### 1965–66 වර්ෂය සඳහා ටයර් සහ ටියුබ් සැපයීම

අංක 14,495 සහ 1965.9.3 දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ඉහත සඳහන් සැපයීම සම්බන්ධයෙන් පළවන ලද ගැසට් නිවේදනයට අමතරව වැඩි විස්තර පහත දැක්වේ :—

තවද මෙම සිංහල ගැසට් නිවේදනයේ 1 වෙනි ඡේදයේ 4 වෙනි පේළියේ " නොඅඩු මිළ ගණන් " යන වචන කපා හරින ලද බව කරුණාවෙන් සළකන්න.

රජයේ දෙපාර්තමේන්තුවලට වාර්ෂිකව අවශ්‍ය කරණ නා නා ප්‍රමාණවල ටයර් සහ ටියුබ් පිළිබඳ (ඒ) අක්ෂරය දරණ ඇස්තමේන්තු උපලේඛනය ටෙන්ඩර්කරුවන්ගේ දැනගැනීම සඳහා අමුණා ඇත. මිළ ගණන් ඉදිරිපත් කිරීමේදී " ඒ " අක්ෂරය දරණ උපලේඛනයේ දැක්වෙන ප්‍රමාණවලට පමණක් සීමා නොකර පළවෙනි සහ දෙවෙනි ඡේදවල දක්වා ඇති ආකාරයට තමන් නිතිපතා ආනයනය කරන්නාවූ සියළුම ප්‍රමාණයන් සඳහා ටෙන්ඩර මිළ ගණන් ඉදිරිපත් කරණ ලෙස ටෙන්ඩර්කරුවන්ගෙන් ඉල්වනු ලැබේ. උපලේඛනයේ දැක්වෙන ප්‍රමාණයන් සාමාන්‍යයෙන් ඇස්තමේන්තු කොට ඇති ප්‍රමාණය වන අතර ඒ සියල්ලම හෝ ඉන් කොටසක් හෝ එසේත් නොමැතිනම් එක් එක විෂය ඉදිරියෙන් දැක්වෙන සියළු ම ප්‍රමාණයන් හෝ ඉන් කොටසක් හෝ රජය විසින් ගනු්නේය යන්න ස්ථිර වශයෙන් ම කිය නොහැක. ඇස්තමේන්තු කර ඇති ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් අවශ්‍ය කරණ අවස්ථාවලදී ටෙන්ඩරකර ඇති මිළ ගණන් වලට ටෙන්ඩර්කරුවන් විසින් ටයර් සහ ටියුබ් සැපයීම කළ යුතුව ඇත.

### " ඒ " උපලේඛනය

#### මගීන්ගේ කාර්

| පරිමාණය | ප්ලයි රේටින් | ටයර් | ටියුබ් නැතිව පාවිච්චි කළහැකි ටයර් | ටියුබ්ස් |
|---|---|---|---|---|
| 5.20×13 | 4 ප්ලයි | 5 | — | 5 |
| 5.60×13 | 4 ප්ලයි | 60 | — | 50 |
| 5.90×13 | 4 ප්ලයි | 20 | — | 10 |
| 5.90×13 | 6 ප්ලයි | 15 | — | — |
| 6.40×13 | 4 ප්ලයි | 115 | 50 | 85 |
| 6.40×13 | 6 ප්ලයි | 25 | — | — |
| 6.50×13 | 4 ප්ලයි | 5 | — | 5 |
| 6.70×13 | 4 ප්ලයි | 35 | — | 35 |
| 6.70×13 | 6 ප්ලයි | 15 | — | 5 |
| 7.25×13 | 4 ප්ලයි | 5 | — | 5 |
| 5.20×14 | 4 ප්ලයි | 15 | — | 10 |
| 5.90×14 | 4 ප්ලයි | 70 | — | 75 |
| 7.50×14 | 4 ප්ලයි | 10 | — | 10 |
| 7.50×14 | 6 ප්ලයි | 20 | — | — |
| 5.00×15 | 4 ප්ලයි | 12 | — | 12 |
| 5.60×15 | 4 ප්ලයි | 110 | — | 120 |
| 5.90×15 | 4 ප්ලයි | 35 | — | 50 |
| 5.90×15 | 6 ප්ලයි | 60 | — | — |
| 6.40×15 | 4 ප්ලයි | 175 | — | 370 |
| 6.40×15 | 6 ප්ලයි | 325 | — | — |
| 6.70×15 | 4 ප්ලයි | 30 | — | 110 |
| 6.70×15 | 6 ප්ලයි | 125 | — | — |
| 7.10×15 | 6 ප්ලයි | — | 6 | — |
| 7.60×15 | 6 ප්ලයි | 100 | — | 100 |
| 5.25×16 | 4 ප්ලයි | 50 | — | 50 |
| 6.00×16 | 4 ප්ලයි | 60 | — | 50 |
| 6.50×16 | 6 ප්ලයි | 35 | — | 35 |
| 4.50×17 | 4 ප්ලයි | 5 | — | 5 |
| 5.00×17 | 4 ප්ලයි | 50 | — | 35 |
| 5.50×17 | 4 ප්ලයි | 15 | — | 15 |
| 155×380 | 4 ප්ලයි | 120 | — | 120 |
| 165×380 | 4 ප්ලයි | 45 | — | 45 |
| 185×400 | 4 ප්ලයි | 20 | — | 20 |

#### මෝටෝ සයිකල්ස්, ස්කූටර්ස් සහ මෝපෙඩ්ස්

| | | | | |
|---|---|---|---|---|
| 3.00×16 | 4 ප්ලයි | 25 | — | 25 |
| 3.25×16 | 4 ප්ලයි | 25 | — | 25 |
| 3.25×17 | 4 ප්ලයි | 250 | — | 250 |
| 3.50×17 | 4 ප්ලයි | 250 | — | 250 |
| 3.00×18 | 4 ප්ලයි | 5 | — | 5 |
| 2.75×19 | 4 ප්ලයි | 30 | — | 40 |
| 3.00×19 | 4 ප්ලයි | 5 | — | 5 |
| 3·25×19 | 4 ප්ලයි | 400 | — | 400 |
| 3.50×19 | 4 ප්ලයි | 560 | — | 530 |
| 3.50×8 | 4 ප්ලයි | 15 | — | 30 |

#### බර අඩු ට්‍රක්ස්

| පරිමාණය | ප්ලයි රේටිං | ටයර් | ටියුබ |
|---|---|---|---|
| 7.00×15 | 6 ප්ලයි | 45 | 45 |
| 7.00×15 | 8 ප්ලයි | 50 | 40 |
| 7.50×15 | 10 ප්ලයි | 65 | 20 |
| 6.00×16 | 6 ප්ලයි | 200 | 200 |
| 6.50×16 | 6 ප්ලයි | 150 | 210 |
| 6.50×16 | 8 ප්ලයි | 85 | — |
| 7.00×16 | 6 ප්ලයි | 45 | 25 |
| 7.00×16 | 8 ප්ලයි | 45 | 45 |
| 7.50×16 | 6 ප්ලයි | 190 | 190 |
| 7.50×16 | 8 ප්ලයි | 310 | 310 |
| 7.50×16 | 10 ප්ලයි | 20 | 20 |

#### ජීප් රථ

| | | | |
|---|---|---|---|
| 7.00×15 | 6 ප්ලයි | 10 | 10 |
| 6.00×16 | 6 ප්ලයි ට්‍රැක්ග්‍රිප් හෝ ඉක්විවලන්ට් | 1,285 | 1,400 |
| 6.00×16 ඩබල් පර්පස් | 6 ප්ලයි ට්‍රැක්ෂන් ලග් හෝ ඉක්විවලන්ට් | 560 | — |
| 7.00×16 | 6 ප්ලයි | 120 | 100 |
| 7.50×16 | 6 ප්ලයි | 220 | 250 |

#### ට්‍රක්ස්

| පරිමාණය | ප්ලයි | ටයර් | ටියුබ |
|---|---|---|---|
| 8.25×10 | 8 ප්ලයි | 5 | 5 |
| 10.50×13 | 10 ප්ලයි | 10 | 10 |
| 9.00×16 | 10 | 65 | 45 |
| 10.50×16 | 12 | 50 | 25 |
| 7.00×17 | 8 | 15 | 20 |
| 7.50×17 | 8 | 10 | 10 |
| 7.50×17 | 10 | 10 | — |
| 6.00×20 | 8 | 10 | 20 |
| 6.50×20 | 8 | 280 | 195 |
| 7.00×20 | 10 | 775 | 635 |
| 7.00×20 | 12 | 10 | — |
| 7.50×20 | 10 | 25 | 1,700 } |
| 7.50×20 ට්‍රැක්ෂන් ලග් හෝ ඉක්විවලන්ට් | 10 | 100 | 150 } |
| 7.50×20 | 12 | 975 | — |
| 7.50×20 ට්‍රැක්ෂන් ලග් හෝ ඉක්විවලන්ට් | 12 | 760 | — |
| 8.25×20 එම | 10 | 60 | 1,200 |
| 8.25×20 | 12 | 480 | — |
| 8.25×20 එම | 12 | 600 | — |
| 9.00×20 | 12 | 25 | 25 |
| 10.00×20 | 12 | 160 | 200 |
| 10.00×20 | 14 | 150 | — |
| 11.00×20 | 14 | 140 | 100 |
| 12.00×20 | 14 | 50 | 50 |
| 14.00×20 | 12 | 20 | 20 |
| 9.00×24 | 10 | 5 | 5 |
| 11.00×24 ට්‍රැක්ෂන් ලග් හෝ ඉක්විවලන්ට් | 14 | 35 | 30 |
| 18×7 | 6 | 5 | 5 |
| 7×9 | 10 | 5 | 5 |
| 6.00×9 | 6 | 5 | 5 |
| 25×6 | 8 | 10 | 10 |
| 29×8 | 12 | 10 | 10 |

#### ට්‍රැක්ටර්ස්

| | | | |
|---|---|---|---|
| 4.00×19 | 4 | 300 | 220 |
| 6.00×16 | 6 | 235 | 110 |
| 6.00×19 | 4 | 35 | 65 |
| 6.00×19 | 6 | 75 | — |
| 10×28 | 4 | 40 | 50 |
| 11×28 | 4 | 70 | 175 |
| 11×28 | 6 | 150 | — |
| 11×36 | 4 | 45 | 50 |
| 13.50×32 | 6 | 50 | 50 |
| 7.50×16 ට්‍රේලර් | 8 | 50 | 50 |

අර්ක්මුවර්ස්, ඩම්පර් සහ ග්‍රේඩර්

| පරිමාණය | ප්ලයි | ටයර් | ටියුබ් |
|---|---|---|---|
| 8.25 × 18 | 8 | 30 | 30 |
| 12.00 × 24 | 16 | 20 | 20 |
| 13.00 × 24 | 8 | 35 | 40 |
| 13.00 × 24 | 12 | 15 | — |
| 14.00 × 24 | 14 | 20 | 40 |
| 14.00 × 24 | 16 | 10 | — |
| 14.00 × 24 | 20 | 30 | — |
| 18.00 × 24 | 16 | 20 | 10 |
| 21.00 × 24 | 20 | 5 | 5 |
| 18.00 × 25 | 24 | 5 | 5 |
| 21.00 × 25 | 24 | 40 | 60 |
| 16.00 × 25 | 24 | 5 | 5 |
| 29.5 × 29 | 28 | 20 | 10 |
| 26.5 × 25 | 20 | 5 | 5 |
| 7.50 × 24 | 10 | 5 | 5 |
| | | 12,990 | 11,325 |

මෙම සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය 1965.10.12 නොව 1965.10.19 බව ටෙන්ඩර් කිරීමට බලාපොරොත්තු වන ටෙන්ඩර් කරුවන් කරුණාවෙන් සලකන්න.

ඇස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

කොළඹ, 1965.9.17.

9–747—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව

1965 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1966 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා කටුනායක ගුවන් තොටුපළෙහි පුවත්පත් විකිණීම හා පොත් සැලක් පවත්වා ගෙන යාම සඳහා ටෙන්ඩර් පත්‍ර 65.9.30 වැනි දින පෙ. ව. 10 දක්වා කොළඹ තැ. පෙ. 535, ලෝටස් පාරෙහි, සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ විසින් භාරගනු ලැබේ.

ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 25ක් ගෙවා සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ කාර්යාලයෙන් හෝ කොළඹින් බැහැර කච්චේරියකින් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල (දෙපිටපතකින් යුතුව) ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු වේ. වැඩි විස්තර සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ කාර්යාලයෙන් ලබාගත හැකිවේ.

ඩබ්ලිව්. ඇල්. පී. ද මැල්,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ.

1965.9.9 වන දින,
තැ. පෙ. 535,
කොළඹ 1.

9–662—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## 1965-66 මුදල් වර්ෂය තුළ බන්ධනාගාර හා සිරසැල්වල සිටින සිරකරුවන්ටත්, උසාවිවලට ඉදිරිපත් කරනු ලබන සිරකරුවන්ටත් පිසන ලද ආහාර සැපයීම

ඉහත සඳහන් කරුණ පිළිබඳව 1965 සැප්තැම්බර් මස 3 වැනි දින අංක 14,495 දරන ගැසට් පත්‍රයේ දෙවන කොටසෙහි ඉංග්‍රීසියෙන් සහ සිංහලෙන් පළ වූ නිවේදනය මෙයින් අවලංගු කළ බව සියළු දෙනා වෙත දැනුම් දෙමි.

පී. වී. පෙරේරා,
වැඩ බලන බන්ධනාගාර කොමසාරිස්.

1965 සැප්තැම්බර් මස 13 වැනි දින,
කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානය.

9–743—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## 1965.11.1 වැනි දින සිට 1966.4.30 වැනි දින දක්වා කෝපායි එළිමහන් සිරකඳවුරට කෑම ද්‍රව්‍ය සැපයීම

කෝපායි එළිමහන් සිරකඳවුරේ සිරකරුවන් 30 කට පමණ 1965.11.1 වැනි දින සිට 1966.4.30 වැනි දින දක්වා කෑම ද්‍රව්‍ය සැපයීම සඳහා ලාංකික යන්ගෙන් (ලාංකික යනුවෙන් අදහස් කරන්නේ පරම්පර වෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි) ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. ටෙන්ඩර් කරුවන් මිළ ගණන් ඉදිරිපත් කළ යුත්තේ, වෙළඳ ද්‍රව්‍ය වශයෙන් මිස "ආහාර" ක්‍රමයට නොවේ. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට කැමැති යම් උපලේඛනයට හෝ ලේඛනයන්හි දුහත සඳහන් සියලුම විෂයන් සඳහා මිළ ගණන් සඳහන් කල යුතුය. "අ" සිට "උ" දක්වා සඳහන් උපලේඛනයන්ගෙන් ඕනෑම එකකට හෝ වැඩි ගණනකට මිළ ඉදිරිපත් කිරීමට පුළුවන. ඒ ඒ උපලේඛනය වෙනුවෙන් වෙන වෙනම ටෙන්ඩර් බාර ගැනීමේ අයිතිය යාපනය බන්ධනාගාරයේ අධිකාරීතැන සතුය. සැපයිය යුතු ද්‍රව්‍ය පහත එන උපලේඛනයන්ගෙන් බලා ගත යුතුය:—

උපලේඛනය (අ)
- පාන්
- විස්කෝතු

උපලේඛනය (ආ)
- හරක් මස්
- එළු මස්
- ලිවර්
- කුකුල් මස්
- බිත්තර

උපලේඛනය (ඇ)
- පොල්
- කැබිලි

උපලේඛනය (ඈ)
- නොයෙක් වර්ගයේ මාළු
- නොයෙක් වර්ගයේ කරවල

උපලේඛනය (ඉ)
- කුළු බඩු

උපලේඛනය (ඊ)
- (අ) කොළ එළවලු
- (ආ) පළතුරු, එළවලු
- (ඇ) පිටි සහිත එළවලු
- (ඈ) අන්‍ය එළවලු

උපලේඛනය (උ)
- එළකිරි

සැලකිය යුතුයි.—(i) කරවල සහ අළුත් මාළු පිළිබඳ වෙන වෙනම ටෙන්ඩර් යාපනයේ බන්ධනාගාර අධිකාරී විසින් සලකා බලනු ඇත.

(ii) බිත්තර සහ අමු මිරිස් ඇතුලුව, එළවලු වර්ග කොන්ත්‍රාත්කරුවන් ගෙන් ගනු ලබන්නේ බන්ධනාගාර ගොවි පලවල් වලින් ලැබෙන බිත්තර සහ අමුමිරිස් ඇතුලුව එළවලු වර්ගවල අඩු පාඩු පිරවීම සඳහා පමණක්ය.

3. සියලුම ටෙන්ඩර් පත්‍ර අනු පිටපතක් සහිතව ලියුම් කවරයක දමා, සීල් තබා බන්ධනාගාර අධිකාරී, යාපනය කියා එවිය යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය. රෙජිස්ටර් තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර් කරුවා විසින් හෝ ඔහුගේ නියෝජිතයකු විසින් හෝ යාපනය බන්ධනාගාර අධිකාරී වෙත බාරදී ඒ ලැබුණු බවට ලියවිල්ලක් තබා ගත යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර බහාලූ කවරයේ වම් පැත්තේ, උඩ කෙළවරේ "කෝපායි එළිමහන් සිරකඳවුරට ........... උපලේඛනයේ සඳහන් බඩු සැපයීමේ ටෙන්ඩරය" කියා ලියා මෙහි 9 වන වගන්තියේ සඳහන් දින පෙරවරු 10.30 ට ප්‍රථම යාපනයේ බන්ධනාගාර අධිකාරී වෙත ලැබෙන සේ එවිය යුතුය. ටෙන්ඩර්කරුවනට උවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. මෙහි 9 වන වගන්තියේ සඳහන් වේලාවේදී යාපනය බන්ධනාගාර අධිකාරී කාර්යාලයේ දී ඒවා විවෘත කරනු ලැබේ.

6. ටෙන්ඩර් පෝරම යාපනය බන්ධනාගාර අධිකාරීතැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකිය. නියමිත පෝරමයේ ලියා නැති ටෙන්ඩර් පත්‍ර භාර ගනු නොලැබේ.

7. ටෙන්ඩර් බාර ගැනීම නැවැත්වූ දින සිට මාස 3 ක් යන තුරු ටෙන්ඩර් කරුවන් තම ටෙන්ඩර්පත්‍ර සැළකිල්ලට භාජන කිරීමට ඉඩ දිය යුතුයි.

8. ටෙන්ඩර්වල සියලුම වෙනස් කිරීම් සහ මැකීම් වලට ටෙන්ඩර්කරු විසින් තමාගේ කෙටි අත්සන යෙදිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද, පිළිගනු ලැබුවා වූද, දේවල් මුළු වියදමෙන් සියයට 5ක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂගේ නමින් තැන්පත් කිරීමටත්, පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව ඉටු කළ පසුවය. මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත්, ඔහුගේ ඇප මුදල රාජ සන්තක වෙනවා පමණක් නොව, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වෙනවාද ඇත.

9. ගිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත් කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වූ දින සිට, සති තුනක් යනතුරු ටෙන්ඩර් කරුවන් තම ටෙන්ඩර් පත්‍ර සැලකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුයි.

10. යම් කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර හෝ ප්‍රතික්‍ෂෙප කිරීමේත් ටෙන්ඩර් පත්‍රයක යම් කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්‍ෂ වෙත තබා ගනු ලැබේ.

11. පත් කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් යෙදවිය යුතුයි. "ලාංකික" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක්ය යන්නයි.

12. කොන්ත්‍රාත්කාරයාට භාර දිය යුතු සියළු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත්, හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් හෝ ඔහුගේ අතටම භාර දුන්නා ලෙස සළකනු ලැබේ.

13. 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥාපණත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත් ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

14. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරණු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුවා විසින් වැඩට ගැනීම ගැන විරුද්ධ වීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුව වෙත තබා ගනු ලැබේ.

15. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවේ නම් තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුලත්වූ හෝ තමාට සැහේ යයි පෙනී යන හේතුපිට කෘෂිකර්ම අධ්‍යක්‍ෂ තැන විරුද්ධ වන හෝ කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

16. වැඩි විස්තර පේරාදෙණියේ කෘෂිකර්ම විද්‍යාලයේ විද්‍යාලයාධිපතිගෙන් දැනගත හැකිය.

ඩී. සී. ඇල්. අමරසිංහ,
කෘෂිකර්ම අධ්‍යක්‍ෂ.

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදීය,
1965 සැප්තැම්බර් මස 7 දින දීය.

9–736—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### රිදියගම සත්ව ගොවිපලට කිරි මිදවීමේ ඇතිලි සැපයීම

1965-66 මුදල් වර්ෂයේදී, රිදියගම සත්ව ගොවිපලේ, කිරි මිදවීම සඳහා අවශ්‍ය ඇතිලි (හට්ටි) සැපයීම හා ගෙන ගොස් භාරදීම සඳහා පහත සඳහන් කොන්දේසිවලට අනුකූලව සීල් තබා එවන ටෙන්ඩර් පත්‍ර පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1965.9.29 දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුවාට හට්ටි (ඇතිලි) නිපදවීම සඳහා යෝග්‍ය පස ගොවිපලෙන් කපාගැනීමට අවසර දෙනු ලැබේ.

3. පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින්, කොන්ත්‍රාත්තුව භාරගත් පසු දළ වශයෙන් මසකට ඇතිලි (හට්ටි) 10,000 ටත් 15,000 ටත් අතර ප්‍රමාණයක් (දිනකට දළ වශයෙන් 500 ටත් 600 ටත් අතර ප්‍රමාණයක්) ගොවිපලේ කළමනාකාර තැන වෙත සැපයිය යුතුය.

4. හට්ටි (ඇතිලි) පිළිස්සීම සඳහා අවශ්‍ය දර ගොවිපලේ කැළෑවෙන් සපයා ගැනීමට පිළිගත් ටෙන්ඩර්කරුවාට අවසර දෙනු ලැබේ. ඒවා සපයාගැනීම එම කොන්ත්‍රාත්කරුවා විසින්ම කළ යුතුය.

5. කොන්ත්‍රාත්කරු විසින්, ගොවිපලේ කළමනාකාර තැන වෙත භාර දෙන ඇතිලි එම ගොවිපලේ කළමනාකාර තැන ළඟ ඇති ආදර්ශ ඇතිලිවලට අනුකූල විය යුතුය. ටෙන්ඩර් කරුවන්ට එම හට්ටි (ඇතිලි) පරීක්ෂාකර බැලීමට අවශ්‍යනම්, එම ගොවිපලේ කළමනාකාර තැනගෙන් කල් තබා ලබාගත් අවසරයක් ඇතිව පරීක්ෂාකර බැලිය හැකිය.

6. කොන්ත්‍රාත්කරු විසින් නිපදවන හට්ටි (ඇතිලි) නිපදවන ස්ථානයේ සිට ගොවිපලේ ගබඩාව වෙත ප්‍රවාහණය කළ යුතුය. ප්‍රවාහණය කිරීමේ පහසුකම් කොන්ත්‍රාත්කරු විසින්ම යොදා ගත යුතුය.

7. කොන්ත්‍රාත්කරු විසින් නිපදවා පුළුස්සා ගොවිපලේ කළමනාකාර තැන වෙත ගෙනගොස් භාර දෙන හට්ටි, එම ගොවිපල් කළමනාකාර තැන ළඟ ඇති ආදර්ශ හට්ටි (ඇතිලි) වලට අනුකූලවන බව ගොවිපල් කළමනාකාර තැන සෑහීමට පත්වන ඒවා විය යුතු අතර මනාව පිළිස්සුනු හොඳ තත්ත්වයේ ඒවා ද විය යුතුය. යම් ලෙසකින් කොන්ත්‍රාත්කරු විසින් ඉහත සඳහන් විස්තරවලට අනුකූල නොවන හට්ටි (ඇතිලි) ඉදිරිපත් කළ හොත් ඒවා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. මේ සඳහා පිළියෙල කෙරුනු ටෙන්ඩර් ආකෘති, කොළඹ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, සත්ව පාලන හා සෞඛ්‍ය අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ගෙන් ලබාගෙන ඒවායේ ටෙන්ඩර් පත්‍ර පිළියෙල කර එවිය යුතුයි. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලබන්නේ, එක් එක් ටෙන්ඩර් ආකෘතියක් වෙනුවෙන්, රුපියල් 10ක්, ඕනෑම කච්චේරියක හෝ කොළඹ මහා භාණ්ඩාගාරයේ නැතහොත් පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුයි.

9. එසේ ලබාගන්නා ලද ටෙන්ඩර් ආකෘතිය නිවැරදිව සම්පූර්ණ කර, ටෙන්ඩර්කරුගේ අත්සන යොදා කවරයක බහා සීල් තබා එම කවරයේ මුදුන් වම් කෙළවරේ "රිදියගම සත්ව ගොවිපලට කිරි ඇතිලි සැපයීම" යන්න ලියා, "සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙනිය" යන ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුය. අතින් ගෙනගොස් භාරදිය හැකි ටෙන්ඩර් පත්‍ර ද ඉහතකී ලෙස සකස් කර, පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන) තැන වෙත හෝ එම නිලධාරි විසින් බලය පවරා ඇති නිලධාරියකුට අතින්ම භාරදිය යුතුය.

10. ටෙන්ඩර් ආකෘති නිකුත් කරන අන්තිම දිනය 1965.9.28 දා දවල් 12න් අවසන් වෙනු ඇත.

11. ටෙන්ඩර් විවෘත කිරීම කරනුයේ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදී ටෙන්ඩර් භාරගැනීමට නියමිත අන්තිම දින; දක්වා ඇති වේලාවටය. ටෙන්ඩර් කරුවන්ට අවශ්‍ය නම් ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ ඉදිරියේ පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

12. ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවනු ලබන ටෙන්ඩර් ලැබුන බව, ටෙන්ඩර් විවෘත කළ දින සිට දින හතරක් ඇතුළතදී ටෙන්ඩර් කරුවන්ට දන්වනු නොලැබුවහොත්, ඒ ගැන, පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, නියෝජ්‍ය අධ්‍යක්‍ෂ (පරිපාලන) තැනගෙන් විමසිය යුතුය.

13. පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඒ බව දැන්වූ පසු, ටෙන්ඩර් කරුවා ඇප මුදලක් තැන්පත් කිරීමටත්, ගිවිසුම් පත්‍රයක් අත්සන් කිරීමටත් කැමති විය යුතුය. මේ ඇප මුදල තීරණය කරනු ලබන්නේ පිළිගනු ලබූ ටෙන්ඩර්කරුවා ඉදිරිපත් කරනු ලැබූ මිළ ගණන අනුව, කොන්ත්‍රාත්කාලය තුළදී සැපයිය යුතු උපරිම ඇතිළි ප්‍රමාණයේ වටිනාකමින් සියයට පහක ප්‍රමාණයකි. අවශ්‍ය ඇප මුදල තැන්පත් කර ගිවිසුම් පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

14. ඇප මුදල් තැන්පත් කිරීමටත්, ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමටත්, දැන්වූ දා සිට දින දහයක් ඇතුළතදී ටෙන්ඩර්කරුවාට නොහැකි වුවොත්, ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර, ඔහුගේ කොන්ත්‍රාත්තුව අවලංගු කර, ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරියවුන්ගේ නම් ලැයිස්තුවටද ඇතුළත් කිරීමට ඉඩ ඇත.

15. ගිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම ටෙන්ඩර් කරුවා විසින්ම දැරිය යුතුය.

16. නියමිත ආකෘතියෙහි ලියා නැති, නියමිත කොන්දේසි ඉටුවී නැති, කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සළකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලිව තීන්තෙන් ලකුණු කළ යුතුවාක් හැර, ඒවා සම්බන්ධයෙන් යම් වෙනස් කිරීමක් කළහොත්, ඒ ඒ ස්ථානවල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තබා සහතික කළ යුතුය. ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව නියමිත ස්ථානයේ ලිවිය යුතුය.

17. යම් කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටත්, ටෙන්ඩර් පත්‍රයකින් කොටසක් පිළිගැනීමටත් කෘෂිකර්ම අධ්‍යක්ෂට බලය පැවරේ.

## අධ්‍යාපන චාරිකාව සඳහා බසයක් සැපයීම

මාතර ගොවිපල පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් ස්ථානවලට ගොස් පැමිණීම පිණිස බසයක් සැපයීම සඳහා ටෙන්ඩර් 1965 ඔක්තෝබර් මස 6 වැනි දා පස්වරු 2.30 වන තෙක් බාරගනු ලැබේ.

බිබිල, බදුල්ල, බණ්ඩාරවෙල, වැල්ලවාය, වීරවිල, ලබුදූව, හොරණ, කොළඹ, අඹේපුස්ස, පේරාදෙණිය, කුණ්ඩසාලේ, බතලගොඩ, පැල්වැහැර, මහඉලුප්පල්ලම, පුලියන්කුලම, යාපනය, නාගදීපය, නිර්වේලි, වවුනියා, ත්‍රිකුණාමළය, පොළොන්නරුව හා අම්පාර.

මෙම චාරිකාවට පාසැල් සිසුන් 50 ක් පමණ හවුල්වන හෙයින් මගීන් 50 ක් ගෙනයාමට අවසර ලබාගෙන ඇති හොඳ තත්ත්වයේ බස් රිය හිමිකරුවන් පමණක් ටෙන්ඩර ඉදිරිපත් කළ යුතු අතර පහත සඳහන් කරුණු අනුවද මිළ ගණන් ටෙන්ඩරයේ සඳහන් කළ යුතුව ඇත :—

(1) ගමනේ තනි සැතපුමකට අයකෙරෙන ගාස්තුව.

(2) ගමනේ යෙදෙන කාලය ඇතුළත නවතා තිබෙන පැ. 24ක දිනකටද පැ. 12 කටද නොඅඩු වරුවකටද අයකෙරෙන ගාස්තු.

බිබිල ගොවිපල සිසුන් හවුල්වන මෙම අධ්‍යාපන චාරිකාව 1965 නොවැම්බර් මස අවසානයේදී හෝ දෙසැම්බර් මස මුලදී හෝ ඇරඹී දින 12 කදී පමණ අවසන් වීමට අවකාශ ඇත. ගමන ඇරඹෙන නියමිත දිනය පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුට යථා කල්හි දන්වනු ලැබේ. මෙම ගමනේ මුළු දුර ප්‍රමාණය සාමාන්‍යයෙන් සැතපුම් 1500 ක් පමණ වේ.

2. පෝරම කොළ මාතර ගොවිපල පාලනය සහ නිෂ්පාදන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගෙන් ලබාගෙන ඒවායේ ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් ද සහිතව ලියුම්කවරයක බහා සීල් තබා, එහි මුදුන් වම් කොනේ " බිබිල ගොවිපලේ සිසුන්ගේ අධ්‍යාපන චාරිකාව සඳහා බසයක් සැපයීමේ ටෙන්ඩරය " යන්න ලියා, මාතර ගොවිපල පාලනය සහ නිෂ්පාදන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුයි.

3. ටෙන්ඩර්පත්‍ර බාරගන්නා අවසාන දිනට පෙර දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත් කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 10 ක් ඇතුළත අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වනවාත් හැර, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්නට ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත රිජිස්ටර් තැපෑලෙන් නො එවුවහොත් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් හෝ මාතර, ගොවිපල පාලනය සහ නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිට ඒවා අතින්ම බාරදිය යුතුයි. රිජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේම දන්වනු ලැබේ. යම් ටෙන්ඩර්කරුවෙක් විසින් එවැනි දැන්වීමක් ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමව තිබූ දින සිට දින 4 ක් ඇතුළත නො ලැබුණේ නම් ඒ ගැන මාතර ගොවිපල පාලනය සහ නිෂ්පාදන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගෙන් වහාම විමසිය යුතුයි.

5. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ඉදිරියේ පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. ඉහත කියන ලද ටෙන්ඩර් බාරගැනීම නැවැත්වීමට නියමිත දිනයේ එකී වේලාවේදී මාතර, ගොවිපල පාලනය සහ නිෂ්පාදන කාර්‍යාලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත පෝරමයේ ලියා නැති හෝ එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති හෝ කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නො ලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

7. ටෙන්ඩර්කරුවන් විසින් තම ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයේ ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද, පිළිගනු ලැබුවා වූද, දේවල් මුළු වියදමෙන් සියයට 5 ක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමාගේ නමෙන් තැන්පත් කිරීමට පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීම වත් පත්කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. මෙම මුදල ආපසු දෙනු ලබන්නේ යථෝක්ත කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිමවූ විට පමණී. පත් කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා මෙම කොන්ත්‍රාත්තුව ඉටු නොකළ හොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වනවා පමණක් නොව, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වෙනවාද ඇත.

9. පොරොන්දු පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත් කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින්ම ගෙවිය යුතුයි.

10. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියළුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති තුනකටවත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය මාතර, ගොවිපල පාලනය සහ නිෂ්පාදන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත තබාගනු ලැබේ.

12. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත් වූ හෝ තමාට සැහේ,යැයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා විරුද්ධත්වය පල කරන හෝ කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවට බැඳෙනු නො ලැබේ.

13. වැඩි විස්තර මාතර ගොවිපල පාලනය සහ නිෂ්පාදන කාර්‍යාලයෙන් ද දැනගත හැකිය.

ඩී. සී. ඇල්. අමරසිංහ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1965 සැප්තැම්බර් මස 3 දින,
පේරාදෙණියේ දී ය.

9–737—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

මාතර ගොවිපල පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් අම්බලන්තොට රජයේ කපු වගාවේ ඇති, ඇට වෙන්කරන ලද වියලි මිරිස්පොතු හොණ්ඩර 37 යි, කාර්තු 1, රු. 10ක් මිළයට ගැනීම පිණිස ටෙන්ඩර් 1965 සැප්තැම්බර් 30 වැනි දා පස්වරු 2.30 වන තෙක් බාරගනු ලැබේ.

ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට පෙර අම්බලන්තොට රජයේ කපු වගාවේදී මෙම මිරිස්පොතු තොගය සතියේ කාර්යාල වේලාවලදී පරීක්ෂා කර බැලිය හැක.

පිළිගත් ටෙන්ඩර්කරු විසින් මිරිස්පොතු බැහැර කර ගැනීමට පෙර ටෙන්ඩරයේ සඳහන් සම්පූර්ණ මුදල අම්බලන්තොට කපු වගාවේ කළමනාකරුට ගෙවිය යුතුය.

2. පෝරම කොළ මාතර ගොවිපල පාලනය සහ නිෂ්පාදන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගෙන් ලබාගෙන ඒවයේ ටෙන්ඩර්පත්‍ර අනුපිටපතක්ද සහිතව ලියුම් කවරයක බහා සීල් තබා, එහි මුදුන් වම්කොනේ "අම්බලන්තොට කපු වගාවේ වියලි මිරිස්පොතු මිළයට ගැනීමේ ටෙන්ඩරය" යන්න ලියා, මාතර ගොවිපල පාලනය සහ නිෂ්පාදන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුයි.

3. ටෙන්ඩර්පත්‍ර බාරගන්නා අවසාන දිනට පෙර දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 10ක් ඇතුළත අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වනවාත් හැර, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්නට ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත රිජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත රිජිස්ටර් තැපෑලෙන් නො එවුවහොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් හෝ මාතර, ගොවිපල පාලනය සහ නිෂ්පාදන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිට ඒවා අතින්ම බාරදිය යුතුයි. රිජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර්පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේම දන්වනු ලැබේ. යම් ටෙන්ඩර්කරුවෙක් විසින් එවැනි දැන්වීමක් ටෙන්ඩර්පත්‍ර විවෘත කිරීමට නියමව තිබූ දින සිට දින 4ක් ඇතුළත නො ලැබුණේ නම් ඒ ගැන මාතර, ගොවිපල පාලනය සහ නිෂ්පාදන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගෙන් වහාම විමසිය යුතුයි.

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### නියමිත මිළ යෝජනා ක්‍රමය හා වී කෙටීම

කොළඹ 7, එඩින්බරෝ වන්ද්‍රවංක අංක 42 දරන ස්ථානයෙහි ගොවිජන සේවා දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත දක්වන ද්‍රව්‍ය ප්‍රමාණයන් මිල දී ගෙන යෑම සඳහා කැඳවනු ලබන මිල ගණන් (කෝටේෂන්ස්) 1965 සැප්තැම්බර් මස 27 වෙනි සඳුද අ.භා. 2.30 වන තෙක් භාරගනු ලැබේ:—

| ද්‍රව්‍ය | | අළු බර හො. කැ. රා. |
|---|---|---|
| රට කජු | ... | ... 48 3 15 |
| කල | ... | ... 190 0 03 |

2. මේ සඳහා ටෙන්ඩර් තැන්පත් මුදලක් අවශ්‍ය නොවන අතර විශේෂ ටෙන්ඩර් ආකෘති පත්‍ර මෙම කාර්යාලයෙන් නිකුත් කරනු නොලැබේ. ලියුම් කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ "ටියුනීසියා ගබඩාවේ ඇති නි.මි.යෝ.ක්‍ර. ද්‍රව්‍ය මිල ගණන්" යනුවෙන් සඳහන් කොට, සීල් තබා ඉහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ එම ස්ථානයෙහි ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතු ය.

3. මරදානේ ටියුනීසියා මධ්‍යම ගබඩාවේදී රාජකාරි වේලාවන්හිදී (දුරකථන අංක 5216) මෙම ද්‍රව්‍ය පරීක්ෂා කිරීමට පිළිවන.

කේ. සිත්තම්බලම්,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1965 සැප්තැම්බර් මස 6 වැනි දින,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
42, එඩින්බරෝ වන්ද්‍රවංක,
කොළඹ 7.

9-611—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### මාන්කුලමේ කෘෂිකර්ම ව්‍යාප්ති මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරීම

වවුනියාවේ කෘෂිකර්ම කාර්යාලයේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි විසින් පහත සඳහන් වැඩ සඳහා සීල් තබන ලද ටෙන්ඩර් 1965 සැප්තැම්බර් මස 27 දින පස්වරු 2.30 දක්වා බාරගනු ලැබේ.

| ව්‍යාප්ති මධ්‍යස්ථානයෙහි නම | කළ යුතු වැඩ |
|---|---|
| කෘෂිකර්ම ව්‍යාප්ති මධ්‍යස්ථානය (කෘෂිකර්ම උපදේශක තැනගේ කාර්යාලය), මාන්කුලම ... | අළුත් වැඩියා කිරීම. |

2. වවුනියාවේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර අනු පිටපතක් සහිතව අත්සන් කොට ලියුම් කවරවල බහා සීල් තබා "දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි, කෘෂිකර්ම කාර්යාලය, වවුනියාව" යන්න එහි පිට ලියා, එහිම මුදුනේ වම් කෙළවරෙහි "මාන්කුලමේ කෘෂිකර්ම ව්‍යාප්ති මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යන්න ලියා, ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. එසේ නො එවතොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර වවුනියාවේ දිස්ත්‍රික් කෘෂිකර්ම කාර්යාලයෙහි ටෙන්ඩර් ලිපිකරුහට අතින්ම භාරදිය යුතුයි. ලියා පදිංචි කළ තැපෑලෙන් එවනු ලබන ටෙන්ඩර් පත්‍ර ලැබුණ බව ඒවා විවෘත කරන දිනයේදීම සියළුම ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට නියමිත අවසාන දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර් කරුවකුට එවැනි දැන්වීමක් නොලැබුණොත් ඔහු වවුනියාවේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැන ගෙන් වහාම කරුණු විමසිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දින දවල් 12 වනතුරු ටෙන්ඩර් ෆෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් ෆෝර්මයක් වෙනුවෙන් රුපියල් 10 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ ඕනෑම කච්චේරියක හෝ කොළඹ මහා භාණ්ඩාගාරයෙහි හෝ කළ හැකිය. පෙරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත් කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 10 ක් ඇතුළත දී අවශ්‍ය ඇපය තැබීමට හෝ ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්නටද ඉඩ තිබේ.

4. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේ දී ඉදිරියේ සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වීමට නියමිත ඉහත කී දිනයේ ඉහත කී වේලාවේදී වවුනියාවේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනගේ කාර්යාලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

5. නියමිත ෆෝර්මයේ අනුපිටපතක් සහිතව ලියා නැති, නැත හොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයත් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතු ද වේ.

6. ටෙන්ඩර්කරුවන්ගේ නම්, ලිපිනය, පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

7. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද, පිළිගනු ලැබුවා වූද, දේවල මුළු ගණනින් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමාගේ නමින් තැන්පත් කිරීමටත්, ගිවිසුම් පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කර නිමවූ විට පමණකි. පත් කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළ හොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවා ද ඇත.

8. ගිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත් කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

9. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරනු ලබන සියළුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති 3 කට වත් වෙනස් නොවන ඒවා විය යුතුයි.

10. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත තබා ගනු ලැබේ.

11. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කාර්ය සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුයි. "ලාංකික" යන වචනයේ අර්ථය නම්, පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ රටවැසියෙක් වූ තැනැත්තෙක් ය.

12. කොන්ත්‍රාත්කරුවාට භාරදිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් හෝ ඔහුගේ අතටම භාර දුන්නා ලෙස සලකනු ලැබේ.

13. 1934 රේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥාපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ යම්කිසි සේවකයෙකු විසින් හෝ සේවකයෙකු වෙනුවෙන් හෝ වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත් ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරු විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

14. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවකු කොන්ත්‍රාත්කරු වැඩට ගැනීම ගැන විරුද්ධ වීමේ හෝ ඕනෑම කම්කරුවකු වැඩට ගැනීම ගැන විරුද්ධ වීමේ හෝ බලය ආණ්ඩුව වෙත තබාගනු ලැබේ.

15. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමඟ හෝ නම ඇතුළත් වූ හෝ තමාම සෑහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමා විරුද්ධවන හෝ කිසිවකු සමඟ හෝ කොන්ත්‍රාත්තුවකට බැදෙනු නොලැබේ.

16. වැඩි විස්තර වවුනියාවේ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනගෙන් දැන ගත හැකිය.

ඩී. සී. එල්. අමරසිංහ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1965 ක්වූ සැප්තැම්බර් මස 6 දින,
පේරාදෙණියේදිය.

9-623—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### නියමිත මිල යෝජනා ක්‍රමය හා වී කෙටීම

### ලූණු කුඩා මිටි 7,000 ක් සැපයීම

ඉහත සඳහන් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය 1965 ඔක්තෝබර් 8 වැනි සිකුරාදා අ. භා. 2.30 දක්වා දීර්ඝ කරන ලද බව ලංකාවේ සහ විදෙස් රටවල ටෙන්ඩර්කරුවන්ට මෙයින් දැනුම්දෙමි. ටැන්ඩරයේ අනිකුත් කොන්දේසි 1965 අගෝස්තු 20 වැනි දින රජයේ ගැසට් පතෙහි සඳහන් අයුරුමය.

ජේ. වී. ෆොන්සේකා,
ගොවිජන සේවා කොමසාරිස්.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
42, එඩින්බරෝ චන්ද්‍රවංක,
කොළඹ 7, 1965 සැප්තැම්බර් 17.

9-727—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

කොළඹ යුනියන් පෙදෙසෙහි අංක 330 ස්ථානයෙහි කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් පහත දක්වන ගෝනි, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට සැපයීම සඳහා 1965 ඔක්තෝබර් 1 වෙනි සිකුරාදා අ. භා. 2.30 වන තෙක් ටැන්ඩර් පත් බාරගනු ලැබේ.

බුසල් 3½ (සේරු 112) ප්‍රමාණයේ ගෝනි 100,000 ක් සඳහා.

බුසල් 2½ (සේරු 80) ප්‍රමාණයේ ගෝනි 100,000 ක් සඳහා.

2. දිවයිනේ කච්චේරියකට හෝ අංක 60, හෝර්ටන් පෙදෙසෙහි ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී තැනට රු. 200 තැන්පත් මුදලක් ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කොට ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අංක 42, එඩින්බරෝ චන්ද්‍ර වංකයෙහි පිහිටි ප්‍රධාන කාර්යාලයෙන් 1965 ඔක්තෝබර් 1 වැනි සිකුරාදා දවල් 12.00 වන තෙක් නිකුත් කරනු ලබන ටැන්ඩර් පත් ලබාගෙන අනු පිටපතක් ද සහිතව පුරවා එවිය යුතුයි.

3. වැඩි විස්තර පහත සඳහන් කාර්යාලයෙන් හෝ මරදානේ දුම්රියාංගණයෙහි පිහිටි විදුලිසියා ගබඩාවෙහි ගණකාධිකාරී තැනගෙන් විමසා දැනගත හැක.

කේ. සින්නම්බලම්,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
42, එඩින්බරෝ චන්ද්‍රවංකය, කොළඹ 7,
1965 සැප්තැම්බර් මස 9 වැනි දින දීය.

9-728—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## ආහාර දෙපාර්තමේන්තුව

**1965-66 වර්ෂය තුළදී, රත්නපුර දිස්ත්‍රික්කයේ ආහාර දෙපාර්තමේන්තුවට අයත් සැපයීම් ස්ථානවල ආහාර ද්‍රව්‍ය බෑම, පැටවීම සහ ප්‍රවාහනය**

රත්නපුර, ඇහැලියගොඩ, කහවත්ත සහ ඹපනායක සැපයීම් ස්ථානවල ආහාර ද්‍රව්‍ය බෑම, පැටවීම සහ ප්‍රවාහණය කිරීම විෂයෙහි ටෙන්ඩර් කොලඹ යුනියන් පෙදෙසේ අංක 330 දරණ ස්ථානයේ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1965. 9. 28 වෙනි දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර්කරුවන් විසින් එක් එක් සැපයීම් ස්ථානය වෙනුවෙන් වෙනම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

3. තමන් සන්තකව ලොරි රථ ඇති පුද්ගලයින්ගෙන් සහ/හෝ ප්‍රමාණවත් ලොරි සංඛ්‍යාවක් සැපයීමට හැකි පුද්ගලයින් ගෙන් පමණක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

4. කොළඹ 2, යුනියන් පෙදෙසේ අංක 330 දරණ ස්ථානයේ ආහාර කොමසාරිස් කාර්යාලයෙන් 1965.9.27 වෙනි දින දහවල් 12 දක්වා රු. 100ක මුදලක් ගෙවා ඉහත තුන්වෙනි ඡේදයෙන් ඉල්ලා ඇති කරුණ පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කොට ලබා ගත හැකි ෆෝර්ම් වල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

5. මෙම කාරණය ගැන වැඩිදුරටත් තොරතුරු සඳහා, කොළඹ ආහාර කොමසාරිස් හෝ රත්නපුර කච්චේරියේ නියෝජ්‍ය ආහාර පාලක විමසන්න.

පී. ඒ. සිල්වා,
ආහාර කොමසාරිස්.

1965. 9. 13 දින,
කොළඹ 2, යුනියන් පෙදෙසේ අංක 330,
ආහාර කොමසාරිස් කාර්යාලයේදීය.

9-720—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

මෙරටෙහි තනන ලද ආවරණ කළ බොඩි සහිත මධ්‍යම ප්‍රමාණයේ බර ගෙන යා හැකි ලොරි අටක් සැපයීම සඳහා කොළඹ 1, රජයේ වැඩ සහ තැපැල් අමාත්‍යාංශ ගැණුම්පත් මණ්ඩල සභාපති විසින් 1965 ඔක්තෝබර් මස 13 වෙනි දින පෙ. ව. 11 දක්වා ටැන්ඩර්පත් භාරගනු ලැබේ.

2. කොල්ලුපිටියේ, ගාලුපාරේ අංක 259 හි, ප්‍රධාන විදුලි සන්දේශ ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත් ෆෝර්ම වලින් පිටපත් දෙකකින් යුක්තව ටැන්ඩර්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් කාර්යාලයේදී ටැන්ඩර් ලියකියවිලි පරීක්‍ෂා කර බැලීමටද අවශ්‍ය විස්තර දැන ගැනීමටද පුළුවන.

3. තැපැල් කාර්යාලයක ටැන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රුපියල් 100ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක්, ප්‍රධාන විදුලි සන්දේශ ඉංජිනේරු කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමෙන් 1965 ඔක්තෝබර් මස 12 වෙනි දින ප. ව. 4 වන තෙක් බලාපොරොත්තු ටැන්ඩර් කරුවන්ට, ටැන්ඩර් ඉල්ලුම්පත් ලබාගත හැකි වේ.

ඒ. එල්. පෙරේරා,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සංදේශ අධ්‍යක්‍ෂ.

ප්‍රධාන තැපැල් කාර්යාලය,
කොළඹ,
1965.9.9.

9-702—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

## ලංකා ධීවර සංසථාව

### තංගල්ලේ "ඕ" වර්ගයේ ධීවර වරායක් ඉදිකිරීම

තංගල්ලෙහි ධීවර වරායක් ඉදිකිරීම සඳහා 1965 නොවැම්බර් 12 වෙනි සිකුරාදා දවල් 12 වන තෙක්, ලංකා ධීවර සංසථාවේ සභාපති තැන විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

මෙම කොන්ත්‍රාත්තුව පහත සඳහන් අයුරු සංයුක්ත වෙනවා ඇත :—

(අ) වෙරළින් ඈත්ව අඩි 700 ක් දිගැති ගල් බැමි දියකඩනයක් (බ්රේක් වෝටර්) සෑදීම සහ ඊට අදාල වැඩ තැනීම ;

(ආ) අඩි 240 ක් දිග ගල් වැටියක් (ග්‍රොයෝන්) සහ ඊට අදාල වැඩ තැනීම.

තංගල්ලට සැතපුම් 10 ක් පමණ ඈතින් කොළඹ-හම්බන්තොට මාගීය ඔස්සේ පිහිටි බටඅත්ත නැමැති ගමෙන් කළුගල් ලබාගැනීමේ සථාන සංස්ථාව මගින් සපයා දෙනවා ඇත.

මෙම ටෙන්ඩරයට අදාල විස්තර සියල්ලක් ම සෙනසුරාදා දිනයන්හි හැර සතියේ අනිකුත් වැඩකරන දිනයන්හි පෙරවරු 9 සිට පස්වරු 4 දක්වා මෙම සංස්ථාවේ ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි අතර සැලසුම් සහ ටෙන්ඩර් ලියකියවිලිද පරීක්ෂා කළ හැක.

ටෙන්ඩර්කරුවන් විසින් පහත දැක්වෙන අයුරු සංස්ථාවට පිළි ගැනීමට හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) මෙම කාර්ය භාර ගැනීමට සෑහෙන වත්කම් ඇති බව.

(ආ) සුදුසුකම් ඇති කාර්ය මණ්ඩලයක් සහ ක්‍රියාකාරී සංවිධානයක් ඇති බව.

(ඇ) සතුටුදායක, සීඝ්‍ර සහ දක්ෂ ලෙස වැඩ කිරීමට අවශ්‍ය යන්ත්‍රෝපකරණ ඇති බව.

වර්ෂ 1965 ඔක්තෝබර් මස 15 වෙනි සිකුරාදා දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම සහ ලියකියවිලි නිකුත් කරනවා ඇත. එය ලබා ගැනීමට ධීවර සංස්ථාවේ මුදල් පාලක තැන වෙත රු. 250 ක් ගෙවා තැන්පතුයක් ඉදිරිපත් කළයුතුය. ටෙන්ඩර් කොන්දේසි 17 වෙනි වගන්තිය අනුව එකී තැන්පත් මුදල ආපසු ලබා ගැනීමට හැකි වෙනවා ඇත.

සභාපති,
ලංකා ධීවර සංසථාව.

තැ. පෙ. 558,
ගාලු මුවදොර, කොළඹ 3,
1965.9.3.

9–644—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### ආහාර පාලන දෙපාර්තමේන්තුවේ බෙදාහැරීමේ ගබඩාවල සිට ප්‍රදේශයේ පාසල් වෙත "ඇදිහැස" පිටි කිරි කාටන්ස් ගෙනගොස් භාරදීම සඳහා කැඳවන ටෙන්ඩර්—1965/66

රත්නපුර අධ්‍යාපන කායර්‍යාලයයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් ඉහත සඳහන් සේවය සඳහා පිටපත් දෙකකින් යුත් ලාකඩ සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර 1965 ඔක්තෝබර් 7 දින පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට පෙර අපේක්ෂක ටෙන්ඩර් කරුවන් විසින් යටත්පිරිසෙයින් රු. 15,000 ක වටිනා නිශ්චල දේපළ පිළිබඳව රත්නපුර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂකට පිළිගත හැකි සහතිකයක්ද, ටෙන්ඩර් කරුගේ නමට ලියාපදිංචි කර ඇති 1965 වර්ෂයට ලයිසන් කරන ලද ලොරි බලපත්‍රයක්ද ඉදිරිපත් කළ යුතුය. අනුමත කරන ලද සමූපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කම්කරු සමූපකාර සමිති මෙම වැඩය භාරගෙන කළහැකි බවට ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම 1965 ඔක්තෝබර් 6 දින දවල් 12 තෙක් නිකුත් කරනු ලැබේ.

3. රත්නපුර අධ්‍යාපන කායර්‍යාලයයෙන් ලබාගත හැකි මේ සඳහා නියමිත ටෙන්ඩර් පෝර්ම වල පහත දැක්වෙන එක් එක් සැපයීම් මධ්‍යස්ථාන සඳහා වෙන වෙනම මෙකී සේවය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට ප්‍රථම ටෙන්ඩර් කරුවන් විසින් රු. 50 ඇප මුදලක් රත්නපුර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැන වෙත තැබිය යුතුය. ටෙන්ඩර් කරුවන් මේ සේවය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේදී රාත්තල් 54 රේ කිරි පිටි කාටන් එකක් දුර ප්‍රමාණය ගැන නොසලකා පාසල දක්වා ගෙනගොස් පාසලේ ප්‍රධානියාට භාරදීමට අය කරන ගාස්තුව දැන්විය යුතුය. නමුත් යම් හෙයකින් රාත්තල් 100 කිරි පිටි කාටන් ප්‍රවාහනය කිරීමට සිදු වුවහොත් ඒ සඳහා අය කරන ගාස්තුවද සඳහන් කළ යුතුය.

**සැපයීම් මධ්‍යස්ථාන :**

1. රත්නපුර
2. කහවත්ත
3. ඹපනායක
4. ඇහැළියගොඩ

4. ටෙන්ඩර් කරුවන් ඉහත සඳහන් ආහාර පාලන දෙපාර්තමේන්තුවේ බෙදා හැරීමේ ගබඩාවල සිට "ඇදිහැස" කිරි පිටි සැපයෙන එම ප්‍රදේශයේ පාසල් වෙත පිටිකිරි ගෙන ගොස් භාරදිය යුතුවේ. සාමාන්‍යයෙන් එක් පාසල් වාරයකට එක් වාරයක් බෙදා හැරීම කළයුතු යයි බලාපොරොත්තු වනු ලැබේ.

5. ටෙන්ඩර් පිළිබඳ විස්තර සහ වෙනත් අවශ්‍ය තොරතුරු රත්නපුර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂතැන වෙතින් ලබාගත හැක.

ඩී. එස්. කලුගම්පිටිය,
රත්නපුර සහාය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1965.9.6,
රත්නපුර,
අධ්‍යාපන කාර්යාලයයේදීය.

9–604—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## මුළුතැන්ගෙයි කුණු කසල විකිණීම

1965 නොවැම්බර මස 1 වෙනි දින සිට 1966 සැප්තැම්බර 30 වෙනි දින දක්වා අංගොඩ මානසික රෝහලේ මුළුතැන්ගෙයි කුණු කසළ මිලදී ගෙන ඉවත්කර ගැනීම සඳහා ටෙන්ඩර් පත් 1965 ඔක්තෝබර මස 8 වෙනි දින පෙරවරු 10 තෙක්, අංගොඩ මානසික රෝහලේ වෛද්‍ය අධිකාරි තැන විසින් බාර ගනු ලැබේ.

ඉහත සඳහන් දිනයේදී හා වේලාවේදී මානසික රෝහලේ වෛද්‍ය අධිකාරි කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරණ අතර එම අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට එම ස්ථානයේ පෙනී සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරණ ලද මිළ ගණන් පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ.

මිළ ගණන් ඉදිරිපත් කරණ සියලුම ටෙන්ඩර් පත් මුද්‍රා තබන ලද ලියුම් කවරයක බහා කවරයේ වම් පස උඩ කෙළවරේ "අංගොඩ මානසික රෝහලේ කුණු කසළ මිලදී ගැනීම" යයි සඳහන් කර, අංගොඩ මානසික රෝහලේ වෛද්‍ය අධිකාරි තුමා වෙත එවිය යුතුයි.

ඉදිරිපත් කරණු ලබන මිළ ගණන් මාසයක කුණු කසල සඳහා විය යුතුය. සෑම මාසයකම මුලදී මේ සඳහා මුදල් ගෙවිය යුතුය. සාර්ථකවූ ටෙන්ඩර්කරු රු. 25 ක මුදලක් ඇපයක් වශයෙන් තැන්පත් කොට කොන්ත්‍රාත්තුවට ඇතුළත් විය යුතුයි.

මෙම කුණු කසල වලට ප්‍රධාන වශයෙන් පොල් කුඩු ඇතුළත් වන අතර වෛද්‍ය අධිකාරි තුමාගේ කැමැත්ත පරිදි මාළු වරල්, වලිග, ඉවත්කරණ ලද එළවළු හා රොඩු ආදියද ඇතුළත් වේ.

ජේ. ඇස්. පී. අබයවර්ධන,
වැඩ බලන වෛද්‍ය අධිකාරී.

1965 සැප්තැම්බර් 11 වෙනි දින,
අංගොඩ මානසික රෝහලේ දීය.

9–744—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කුරුණෑගල දිස්ත්‍රික්කය

### අයිතිකම් නොකියන ලද මිනී සහ අජීව උපත් වැළලීම හා අස්කිරීම

1965.7.30 වැනි දින අංක 14,464 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකර ඇති දැන්වීම අනුව, ඉහත සඳහන් සේවය සඳහා ටෙන්ඩර් පත්‍ර බාරගැනීමේ අවසාන දිනය 1965.9.28 වැනි දින පෙරවරු 10 දක්වා දීර්ඝ කර ඇති බැව් මෙයින් දන්වමි.

වී. ඇ. පොන්සේකා,
කුරුණෑගල සෞඛ්‍ය සේවා අධිකාරී.

1965.9.3 වැනි දින,
කුරුණෑගල, සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදීය.

9–461—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

යොමු අංකය. එෆ්.ටී. 43/65.

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

### සොලියුබල් ඇස්ප්‍රින් ආදිය සැපයීම සඳහා ටෙන්ඩර්

මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි සඳහන් පරිදි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනට සොලියුබල් ඇස්ප්‍රින් සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1965 දෙසැම්බර් 21 වැනි අඟහරුවාදා උදේ 10 දක්වා බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. අවශ්‍ය ටෙන්ඩර් ආකෘති පත්‍ර කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 දරණ තැන පිහිටි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනගේ (සැපයීම් අංශය) කාර්යාලයෙන් ලබා ගත හැක. මෙම දැන්වීමේ 5 වන හා 6 වන ඡේදයන්හි සඳහන් කරුණු අනුව 1965 දෙසැම්බර් 20 වැනි සඳු දින උදේ 10 දක්වා ඉල්ලුම්කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්, සීල් තබන ලද කවරයක බහා, සභාපති තැන, ටෙන්ඩර් මණ්ඩලය, සෞඛ්‍ය අමාත්‍යාංශය, තැ.පෙ. 500, පළමුවන මහළ, මහා ලේකම් ගොඩනැගිල්ල, ගාලු මුවදොර, කොළඹ යන ලිපිනයට එවිය යුතු වෙයි. සීල් තබන ලද ටෙන්ඩර් පත් බහා ලන ලද කවරයේ වම් කෙළවරේ උඩ, "සොලියුබල් ඇස්ප්‍රින් ආදිය සැපයීම සඳහා ටෙන්ඩර්, 1965.12.21 දින උදේ 10 ට" යනුවෙන් සඳහන් කළ යුතු වෙයි.

4. ටෙන්ඩර්, ගාලු මුවදොර මහා ලේකම් ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය අමාත්‍යාංශයේ, කාමර අංක 155 හේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීම හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ එවීම කළ හැක. එහෙත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන්, තමන්ට අවශ්‍යයයි හැඟේ නම්, සීල් තබන ලද ටෙන්ඩර් පත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ උප ලේකම් තැන වෙත පුද්ගලිකව ගෙනැවිත් බාරදීම ද කළ හැක. එසේ බාර දෙන සීල් තබන ලද කවරයේ, එය කිනම් සැපයීමක් සඳහා ද යන වග හා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. එම ටෙන්ඩර් පත් බාර ගැනීම සඳහා ඉහතකී නිලධාරි තැනට බලය ඇත. සීල් තැබූ ටෙන්ඩර් පත් බාර ගත් බවට කුවිතාන්සියක් එවිට ටෙන්ඩර්කරු වෙත ඔහු විසින් නිකුත් කරනු ලැබේ.

5. සුප්‍රසිද්ධ නිෂ්පාදන සමාගමක ඒජන්තවරයෙකුට හෝ වෙළෙඳ නියෝජිතයෙකුට වුවද ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. එහෙත් අයදුම්කරු නම් කරන ලද නිෂ්පාදන සමාගමේ නියෝජිත ඒජන්තවරයෙකු බව සහතික කළ යුතු වෙයි. (මේ සඳහා නියෝජිතත්වය ඔප්පු කිරීමක් ඉදිරිපත් කළ යුතු වෙයි.)

6. 1955 ඔක්තෝබර් 28 වෙනි දින අංක 10,854 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ සඳහන් අයුරු, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 1949 සහ අංක 25 දරණ ආහාර හා ඖෂධ පණත යටතේ පනවන ලද රෙගුලාසි අනුව, ඖෂධ විකිණීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනගෙන් ලබා ගත් වලංගු බලපත්‍රයක් ඇති, බලයලත් වෙළෙඳුන්ගෙන් පමණක් මෙම සැපයීම සඳහා ටෙන්ඩර් පත් බාරගනු ලැබේ. ලාංකික සම්බන්ධතා ඇති රටවල් වූ ඇල්බේනියාව, ඔස්ත්‍රියාව, බල්ගේරියාව, චීන මහජන සමූහාණ්ඩුව, චෙකොස්ලොවේකියාව, ටායිවාන්, ජර්මන් පෙඩරල් සමූහ ආණ්ඩුව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව, හන්ගේරියාව, ජපානය, කොරියාව, පෝලන්තය, රුමේනියා මහාජන සමූහ ආණ්ඩුව, ස්පාඤ්ඤය, සෝවියට් රුසියාව, යූගෝස්ලේවියාව, වියට්නාම් ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව ආදි රටවලින් මෙම සැපයීම ආනයනය කර සැපයීමට බලාපොරොත්තු වන ටෙන්ඩර්කරුවන් වෙතොත්, ඔවුන් ලියාපදිංචි කරන ලද වෙළෙන්දන් විය යුතු අතර ආනයන පාලක තැන විසින් නිකුත් කරන ලද සාමාන්‍ය බඩු ගෙන්වීමේ වලංගු බලපත්‍රයක් ලත් ඇත්තෝ විය යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලීමේදී ඉහත සඳහන් බලපත්‍රයක් හිමි බව ඔප්පු කළ යුතු වෙයි.

7. ටෙන්ඩර් කොන්දේසි සහ අනිකුත් විස්තර මෙම දැන්වීමේ 2 වන ඡේදයේ සඳහන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයෙන් (කොන්ත්‍රාත් හා සැපයීම් අංශය) ලබා ගත හැක. මෙම කාර්යාලයෙන් ලබා ගත් ආකෘති පත්‍ර, කොන්දේසි පත්‍ර ආදිය භාවිතා කළ හැක්කේ ස්වදේශීය ටෙන්ඩර්කරුවන්ට පමණි.

8. මෙහි පළමු වන ඡේදයෙහි සඳහන් පරිදි ටෙන්ඩර්කරු විසින් ස්වකීය ගණන් යෝජනාව ටෙන්ඩර් බාරගැනීමේ අවසාන දින සිට යටත් පිරිසෙයින් මාස 2 ක්වත් විවෘතව තැබිය යුතුය.

9. කෙලින්ම ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමැති විදේශීය නිෂ්පාදක මූලිකවරුන් වෙත ඔවුන්ගේ ලංකා නියෝජිතයන් සහ ඒජන්තවරුන් විසින් ටෙන්ඩර් කොන්දේසි, උපලේඛන හා මෙම ටෙන්ඩරය පිළිබඳ සියළුම විස්තර පහත සඳහන් රටවල සිටින ලංකාණ්ඩුවේ නියෝජිතයන්ගෙන් ලබා ගත හැකි බව දැන්විය යුතුය. මහා බ්‍රිතාන්‍ය, ඇමරිකා එක්සත් ජනපදය, ඉතාලිය, පකිස්ථානය, ජපානය, ප්‍රංශය, බටහිර ජර්මනිය, චීන මහාජන සමූහ ආණ්ඩුව, සෝවියට් රුසියාව, කැනඩාව, නෙදර්ලන්තය, බෙල්ජියම, හංගේරියාව, බල්ගේරියාව, නැගෙනහිර ජර්මනිය, එක්සත් අරාබි සමූහ ආණ්ඩුව, බුරුමය, අයර්ලන්තය, අයිරානය, ඉරාකය, මාල දිවයින, උතුරු කොරියාව, ස්පාඤ්ඤය සහ ඉන්දියාවේ බොම්බාය සහ ඔස්ට්‍රේලියාවේ සිඩ්නිහි සිටින ලංකා වෙළෙඳ කොමසාරිස් සහ ලංකාවේ සිටින විදේශීය ආණ්ඩුවල නියෝජිතවරු සහ ඉන්දියාවේ දිල්ලියේ සිටින ලංකාවේ විදේශීය නියෝජිතයන්ගෙන්.

10. ටෙන්ඩර්කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර සමග නිකුත් කරන ටෙන්ඩර් කොන්දේසිවල 11 වෙනි ඡේදය කෙරෙහි ටෙන්ඩර්කරුවන්ගේ අවධානය යොමු කරනු ලැබේ. කොළඹ රජයේ බෙහෙත් ගබඩා අධිකාරිට යැවිය යුතු මෙම බඩුවල ආදර්ශ භාණ්ඩ (සැම්පල්ස්) සම්බන්ධ විස්තර එම ඡේදයෙහි සඳහන් කර ඇත. ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුත්තේ ටෙන්ඩර් පත් පමණි. ආදර්ශ භාණ්ඩ (සැම්පල්ස්) එහි තැන්පත් නොකළ යුතුය. ටෙන්ඩර් පත් සමාප්ත කරන දිනයේ නියම වේලාවට ප්‍රමාදව ලැබුණු සැම්පල්ස් සැලකිල්ලට භාජනය කරනු නොලැබේ.

11. මෙහි 1 වන ඡේදයේ සඳහන් ස්ථානයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේ සෑම ටෙන්ඩර්කරුවෙකුටම එම ස්ථානයේ සිටීමට අවසර තිබේ. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ මිළ ගණන් එහි පැමිණ සිටි ටෙන්ඩර්කරුවන්ට කියවනු ලැබේ. ලැබී තිබුණ ටෙන්ඩරයක් පරීක්ෂා කර බැලීමට යම්කිසි ටෙන්ඩර්කරුවෙකුට අවශ්‍ය නම්, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන සමඟ කටයුතු පිළියෙළ කර ගැනීමෙන් පසු එසේ පරීක්ෂා කර බැලීමට ඉඩ දෙනු ලැබේ.

12. ටෙන්ඩර්කරුවන් විසින් රුපියලේ වටිනාකම හා විදේශීය විනිමය වටිනාකම වෙන වෙනම තමන්ගේ මිළ ඉදිරිපත් කිරීම්වල සෑම විෂය අංකයක් වෙනුවෙන් ම සඳහන් කළ යුතු වන්නේය.

එස්. බාලක්‍රිෂ්ණන්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1965 සැප්තැම්බර් මස 8 වැනි දින,
කොළඹ, 10,
ඩීන්ස් පාරේ අංක 355 දරණ තැන පිහිටි,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) කාර්යාලයේදී.

### අදාල උපලේඛනය

| විෂය අංකය | විස්තරය | ඇස්තමේන්තු කළ අවශ්‍යතා | | අවශ්‍ය කරන ඇසිරීම |
|---|---|---|---|---|
| 1. | සොලියුබල් ඇස්ප්‍රින් බී.පී. (ඇසිටිල්සැලිසිලික් ඇසිඩ් සොලියුබල් බී.පී. පෙති) සෑම පෙත්තකම පහත දක්වෙන දෑ අඩංගු විය යුතුය. ඇසිටිල්සැලිසිලික් ඇසිඩ් 300එම්ජී.එම්., එන්හයිඩ්‍රස් සයිට්‍රික් ඇසිඩ් 30එම්ජීඑම්, කැල්සියම් කාර්බොනේට් 100 එම්ජීඑම්, සැක්රීන් සෝඩියම් 3 එම්ජීඑම් | පෙති 24,000,000 | ... | වාතය ඇතුළුවීමෙන් හා තෙත් බැසීමෙන් තොර කළ ඉටි සහිත කිරල මූඩියෙන් වැසූ පෙති 1,000 බැගින් අඩංගු බෝතල තුළ |
| 2. | සොලියුබල් ඇස්ප්‍රින්, ළදරුවන් සඳහා බී.පී.සී. (ඇසිටිල්සැලිසිලික් ඇසිඩ් සොල්යුබල් බී.පී.සී. පෙති ළදරුවන් සඳහා) සෑම පෙත්තකම පහත සඳහන් දෑ අඩංගු විය යුතුය. ඇසිටිල්සැලිසිලික් ඇසිඩ් 150 එම්ජීඑම්, එන්හයිඩ්‍රස් සයිට්‍රික් ඇසිඩ් 15එම්ජීඑම්, කැල්සියම් කාර්බොනේට් 50එම්ජීඑම්, සැක්රින් සෝඩියම් $1\frac{1}{2}$ එම්ජීඑම් | පෙති 15,000,000 | ... | එම |

| විෂය අංකය | විස්තරය | ඇස්තමේන්තු කළ අවශ්‍යතා | අවශ්‍ය කරන ඇසිරීම |
|---|---|---|---|
| 3. | සෝඩියම් බී.පී. ක්‍රිස්ටලින් පෙලෙක්ස් ... ... ... | රා. 10,000 | ... රා. 1 බැගින් සීල් පොලිතීන් කවරවල බහා කාඩ්බෝඩ් පෙට්ටි තුළ |
| 3.ඒ. | එම ... ... ... ... | රා. 20,000 | ... එම රා. 2 ඇසිරීම් වලින් |
| 3.බී. | එම ... ... ... ... | රා. 30,000 | ... එම රා. 5 ඇසිරීම් වලින් |
| 3.සී. | එම ... ... ... ... | රා. 40,000 | ... රාත්. 50 හේ තෙත්වීමෙන් තොර කළ පොලිතීන් ෆයිබර් කෙග්ස්වල |
| 4. | සෝඩියම් බයිකාබොනේට් බී.පී. ... ... ... | හො. 1,500 | ... එම හො. 1 ක් ඇසිරීම්වල |
| 5. | ඇප්ලිකේෂන් බෙන්සිල් බෙන්සොඒට් බී.පී. ... ... | රා. 3,000 | ... වැස්සීමෙන් තොර කළ රා. 1 ක් බෝතල තුළ |
| 5.ඒ. | එම ... ... ... | රා. 7,000 | ... වැස්සීමෙන් තොරකළ රා. 5හේ බෝතල තුළ |
| 6. | ඇමෝනියම් බයිකාර්බනේට් බී.පී.සී. ... ... ... | රා. 5,000 | ... (වාතය ඇතුළු නොවන අයුරින්) ඉටි සහිත කිරල මූඩියන් වසා දති සහිත මූඩියන් ආවරණය කරන ලද රා. 1 ක් බෝතල තුළ |
| 6.ඒ. | එම ... ... ... | රා. 7,000 | ... එම ආකාරයෙම රා.2 බෝතල තුළ |
| 6.බී. | එම ... ... ... | රා. 12,000 | ... එම ආකාරයෙම රා. 5 බෝතල් තුළ |
| 7. | පොටෑසියම් සයිට්‍රේට් බී.පී. ... ... ... | රා. 60,000 | ... රා. 2ක් හොඳට වසන ලද බෝතල් තුළ |
| 7.ඒ. | එම ... ... ... | රා. 1,20,000 | ... එම රා. 5හේ බෝතල් තුළ |
| 8. | මැග්නීසියම් සල්ෆේට් බී.පී. ... ... ... | හො. 2,500 | ... හො. 1ක් තෙත්වීමෙන් තොර කළ ඝන ගෝනි යුගල වල |
| 9. | පොටෑසියම් බ්‍රොමයිඩ් බී.පී. ... ... ... | රා. 5,000 | ... රා. 1 ක් බෝතල් තුළ |
| 9.ඒ. | එම ... ... ... | රා. 10,000 | ... රා. 5 හේ බෝතල් තුළ |

බාරදීමේ ක්‍රමය—

විෂයයන් 1 සිට 9ඒ දක්වා ඇති සම්පූර්ණ තොගයම සමාන කොටස් තුනක් වශයෙන් කොළඹ, රජයේ බෙහෙත් ගබඩාවට ගෙනැවිත් බාර දිය යුතුය. පළමු කොටස ඇනවුම් කරන ලද දින සිට මාස 3 ක් ඇතුළතද්දී, ඉතිරි කොටස් 2, එතැන් සිට මාස තුනෙන් තුනටද සැපයිය යුතුය.

ටෙන්ඩර්කරු ණයවර ලිපියක් විවෘත කරන ලෙස රජයෙන් ඉල්ලා සිටින්නේ නම්, ඇසිරීම් හා අනිකුත් සියළුම වියදම් ඇතුළුව භාණ්ඩවල මිල සහ කොළඹට ගෙනඒමේ ගාස්තුව බඩු නිෂ්පාදන රටෙහි මුදලින් ද සඳහන් කළ යුතු වෙයි. නැව් මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ.

සැපයීමේදී, සෑම විෂයකම, සෑම භාජනයකම " ඔටුන්න ලකුණ " හා " ඒ/සීඑම්එස් 2618/65-66 " යනුවෙන් සඳහන් කර තිබිය යුතුය.

9—756—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## 1965-66 මුදල් වර්ෂය තුළ බන්ධනාගාර හා සිර සැල්වල සිටින සිරකරුවන්ටත් උසාවිවලට ඉදිරිපත් කරනු ලබන සිරකරුවන්ටත් පිසනලද ආහාර සැපයීම

බන්ධනාගාර හා සිරසැල්වල සිටින සිරකරුවන්ටත්, උසාවිවලට ඉදිරිපත් කරනු ලබන සිරකරුවන්ටත්, 1965 නොවැම්බර් මස 1 ද සිට 1966 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා මුළු කාලය තුළ පිසනු ලැබූ ආහාර සැපයීම සඳහා 1965.10.8 දින පෙරවරු 10 දක්වා ඒ ඒ බන්ධනාගාර අධිකාරීන් විසින් ටෙන්ඩර්, ලාංකිකයන්ගෙන් (ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙ හෝ රටවැසියකු වූවෙකි). භාරගනු ලැබේ. එම දිනවල පෙරවරු 10.05 ට ටෙන්ඩර් විවෘත කරනු ලබනවා ඇත. ටෙන්ඩර් විවෘත කරන වේලාවේ දී එහි පෙනී සිටීමට ටෙන්ඩර්කරුවනට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර්කරුවන් ආහාර සඳහා මිළ ගණන් ඉදිරිපත් කිරීමේදී ඉලක්කමින් මෙන්ම වචනයෙන් ද ඒවා සඳහන් කළ යුතුව ඇත. ඉලක්කමින් සඳහන් මිළ ගණන් වචනයෙන් සඳහන් කිරීමේදී අසමානත්වයක් ඇතිවී තිබුණහොත් හෝ මිළ ගණන් වචනයෙන් සඳහන් වී නැති නම් හෝ එබඳු ටෙන්ඩර් ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇත්තේය.

3. ආහාර සැපයීම පිළිබඳ විස්තර පහත සඳහන්වේ :—

උදය ආහාරය :

(අ) ආප්ප හෝ ඉදිආප්ප (අවුන්ස 6 කට නොඅඩු විය යුතුයි) ;

(ආ) භකුරු අවුන්ස එකක් හෝ සම්බෝල ;

(ඇ) සීනි දමන ලද තේ කෝප්පයක්.

දිවා නෝස්ටරු භෝජනය :

(අ) හාල් අවුන්ස 8 ප්‍රමාණයේ තැම්බූ බත් පිහානක් ;

(ආ) හරක් මස් හෝ මාලු හෝ කරවල අවුන්ස 2 යි ;

(ඇ) එළවළු ව්‍යංජන දෙකයි. එක ව්‍යංජනයක් අවුන්ස 2 ප්‍රමාණය විය යුතුයි.

සැ.යු.—(i) සලාක කිරීම නිසා නොහොත් වෙනත් ප්‍රමාණවත් හේතුවක් නිසා සම්පූර්ණ ආහාර ප්‍රමාණයක් හෝ ඉන් කොටසක් හෝ සැපයිය නොහැකි නම්, අධිකාරි තැනගේ අභිමතය පරිදි කොන්ත්‍රාත්තුවට බැඳී ඇති වෙළඳ මිළ ප්‍රමාණයට සැහෙන සේ ආදේශක ආහර සැපයීමට කොන්ත්‍රාත්කරුවනට පිළිවන.

(ii) කොන්ත්‍රාත්කරුවන්ගෙන් උදය ආහාරය ලබාගනු ලබන්නේ ආයතනය මගින් එය අඩු මිලකට සපයා ගැනීමට නොහැකි වූවහොත් පමණකි.

4. සියළුම ටෙන්ඩර් පත්‍ර අනු පිටපතක් සහිතව ලියුම් කවරයක බහා සීල් තබා උපලේඛනයේ සඳහන් අධිකාරි තැන වෙත රෙජිස්ටර් තැපෑලෙන් යැවිය යුතුයි. රෙජිස්ටර් තැපෑලෙන් නොයවන ටෙන්ඩර් පත්‍ර එම අධිකාරි තැනට හෝ ඔහු විසින් උත් කරන ලද බලයලත් නියෝජිතයෙකු වේ නම් ඔහුට හෝ භාරදී එය භාරගත් බවට ලියවිල්ලක් ලබා ගත යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර බහ ලූ කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ "1965-66 වර්ෂය තුළ බන්ධනාගාර සහ සිරසැල්වල සිටින සිරකරුවන්ටත්, උසාවිවලට ඉදිරිපත් කරනු ලබන සිරකරුවන්ටත් පිසනලද ආහාර සැපයීමේ ටෙන්ඩරය" යැයි ලියා උපලේඛනයෙහි සඳහන් දිනවල මෙහි 1 වැනි ඡේදයේ සඳහන් වේලාවට ප්‍රථම නියමිත අධිකාරි තැනට ලැබිය යුතු සේ එවිය යුතුයි.

6. ටෙන්ඩර් සඳහා නියමිත පෝර්ම ඒ ඒ ආයතන භාර අධිකාරීවරුන්ගේ කාර්යාල වලින් ලබා ගත හැකිය. නියමිත පෝර්මයේ ලියා නැති ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

7. ටෙන්ඩර් භාර ගැනීම නතර කළ දින සිට සති 8ක් යන තුරු ටෙන්ඩර්කරුවන් තමන්ගේ පත්‍ර සැළකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුයි.

8. ටෙන්ඩර් වල සියලුම වෙනස් කිරීම් හා මැකීම්වලට ටෙන්ඩර්කරුවන් විසින් තම කෙටි අත්සන යෙදිය යුතුයි.

9. මෙහි පහත උපලේඛනයෙහි සඳහන් පරිදි ටෙන්ඩර් පත්‍ර සඳහා තැන්පත් කළ යුතු මුදල් බන්ධනාගාර අධිකාරින්ගේ කාර්යාලවල හෝ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ (කොළඹ කච්චේරිය හැර) වෙන ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝරම ලබා ගත හැකිය.

යමෙකුට ඔහුගේ ටෙන්ඩරය පිළිගත් බව ලියමනකින් දන්වනු ලැබීමෙන් දින 10ක් ඇතුළත දී අවශ්‍ය ඇප මුදල් ඉදිරිපත් කිරීම පුළුවන් නොවිනි නම් හෝ එසේ කිරීමෙන් වැළැකී සිටිනම් හෝ තැන්පත් කරන ලද මුදල් රාජසන්තක වෙනවා ඇත. ඉන්පසු රජය සම්බන්ධ කවර කොන්ත්‍රාත්තුවකට හෝ බැඳීමට නොහැකි වනසේ ඔහුගේ නම් කොන්ත්‍රාත් කඩකරන්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනවා ඇත. තවද, කොන්ත්‍රාත්තුව කඩ කිරීමේ අලාභ වශයෙන් ලංකාවේ වලංගු මුදලෙන්, ඒ ඒ කොන්ත්‍රාත්තුවට තබා ඇති ඇප මුදලට සමාන මුදලක් රජය වෙනුවෙන් බන්ධනාගාර කොමසාරිස්වරයාට ගෙවීමට එම ටෙන්ඩර්කරුවනට සිදු වෙනවා ඇත. මෙම මුදල අලාභ වශයෙන් නීති මාර්ගයෙන් අයකර ගැනීමේ බලය බන්ධනාගාර කොමසාරිස්වරයා වෙත පැවරී ඇත.

ටෙන්ඩරය පිළිගත් බව දන්වන නිවේදනය ටෙන්ඩර්කරු විසින් දෙනු ලබන ලිපිනයට තැපැලෙන් යවනු ලැබුවහොත් හෝ නො එසේව එහි ගෙන ගොස් භාරදුනහොත් හෝ එම නිවේදනය ටෙන්ඩර්කරුවා වෙත ලැබුණු ලෙස සලකනු ලැබේ. අන්‍ය සියලු තැන්පත් මුදල්, කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු ආපසු ගෙවනු ලැබේ.

10. ටෙන්ඩර් පිළිගැනීමෙන් පසු, එසේ පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුවෝ කොන්ත්‍රාත්තුව මනා අන්දමින් ඉටු කරන වගට ඇපකරුවන් වශයෙන් ඔවුන් වෙනුවෙන් පෙනීසිටීමට කැමති වග කිවයුතු පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් ඉදිරිපත් කළ යුතුයි. කොන්ත්‍රාත්කරුවන් විසින් වැඩෙහි යෙදවිය යුත්තේ ලාංකිකයන් පමණකි.

11. සේවය නිසියාකාර ඉටු කිරීමේ දී දත යුතු සියලුම අවශ්‍ය කරුණු දැන ගැනීම සඳහා උපලේඛනයේ සඳහන් අධිකාරිවරුන් ගෙන් විමසනු මැනවි.

12. ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනීසිටින බන්ධනාගාර කොමසාරිස් වරයා සමග කොන්ත්‍රාත්තුවට අත්සන් තැබිය යුතුයි. එබඳු නිලධාරියෙකුගේ පදවි නාමයෙන් අදහස් කළ යුත්තේ ද ගිණිය යුත්තේ ද ලංකාණ්ඩුව යටතේ දැනට එම පදවිය දරන්නා වූද නිලධාරියා ද, ඔහුට පසු එම පදවිය දරන්නාවූ නිලධාරියාද වේ.

පී. වී. පෙරේරා,
වැඩබලන බන්ධනාගාර කොමසාරිස්.

1965 සැප්තැම්බර් මස 13,
කොළඹ 9,
බන්ධනාගාර මූලස්ථානයේ දී ය.

## උපලේඛනය

| | ආයතනය | | | | ටැන්ඩර් සඳහා තැන්පත් මුදල රුපියල් | | ඇප මුදල රුපියල් | | ටෙන්ඩර් භාරගන්නා නිලධාරියා |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | වාවාකච්චේරිය සිරසැල සහ උසාවිය | ... | ... | ... | 5 | ... | 25 | ... | යාපනයේ බන්ධනාගාර අධිකාරි |
| | යාපනය බන්ධනාගාරය සහ උසාවිය | ... | ... | ... | 25 | ... | 100 | ... | එම |
| | කයිට්ස් සිරසැල සහ උසාවිය | ... | ... | ... | 5 | ... | 25 | ... | එම |
| | මන්නාරම් සිරසැල සහ උසාවිය | ... | ... | ... | 5 | ... | 25 | ... | එම |
| | මල්ලාකම් සිරසැල සහ උසාවිය | ... | ... | ... | 5 | ... | 25 | ... | එම |
| | මුලතිව් සිරසැල සහ උසාවිය | ... | ... | ... | 5 | ... | 25 | ... | එම |
| | පොයින්ට් පේද්‍රු සිරසැල සහ උසාවිය | ... | ... | ... | 5 | ... | 25 | ... | එම |
| | වවුනියා සිරසැල සහ උසාවිය | ... | ... | ... | 5 | ... | 25 | ... | එම |
| 2. | මාතර බන්ධනාගාරය ... | ... | ... | ... | 25 | ... | 100 | ... | මාතර බන්ධනාගාර අධිකාරි |
| | තංගල්ල බන්ධනාගාරය සහ උසාවිය | ... | ... | ... | 10 | ... | 50 | ... | එම |
| | තිස්ස සිරසැල සහ උසාවිය | ... | ... | ... | 5 | ... | 25 | ... | එම |
| 3. | බණ්ඩාරවෙල මහෙස්ත්‍රාත් උසාවිය | ... | ... | ... | 5 | ... | 25 | ... | බදුල්ල බන්ධනාගාර අධිකාරි |
| | මොනරාගල ... | ... | ... | ... | 5 | ... | 25 | ... | එම |
| | නුවරඑළිය සිරසැල සහ උසාවිය | ... | ... | ... | 10 | ... | 50 | ... | එම |
| 4. | කළුතර සිරසැල සහ උසාවිය | ... | ... | ... | 10 | ... | 50 | ... | කොළඹ රිමාන්ඩ් අධිකාරි |
| 5. | මහර බන්ධනාගාරය ... | ... | ... | ... | 25 | ... | 100 | ... | මහර බන්ධනාගාර අධිකාරි |

9–750—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

යොමු අංකය : එෆ්ටී. සී. 61/65

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

### පී ඒ එස් පෙති ආදිය සැපයීම සඳහා ටෙන්ඩර්

මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි සඳහන් පරිදි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනට පීඒඑස් පෙති සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1965.12.21 අඟහරුවාද උදේ 10 දක්වා බාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. අවශ්‍ය ටෙන්ඩර් ආකෘති පත්‍ර කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 දරණ තැන පිහිටි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනගේ (සැපයීම් අංශය) කාර්යාලයෙන් ලබා ගත හැක. මෙම දැන්වීමේ 5 වන හා 6 වන ඡෙදයන්හි සඳහන් කරුණු අනුව 1965. 12.20 සඳු දින උදේ 10 දක්වා ඉල්ලුම්කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්, සීල් තබන ලද කවරයක බහා, සභාපති තැන, ටෙන්ඩර් මණ්ඩලය, සෞඛ්‍ය අමාත්‍යාංශය, තැ.පෙ. 500 පළමුවන මහල, මහා ලේකම් ගොඩනැගිල්ල, ගාලු මුවදොර, කොළඹ යන ලිපිනයට එවිය යුතු වෙයි. සීල් තබන ලද ටෙන්ඩර් පත් බහා ලන ලද කවරයේ වම් කෙළවරේ උඩ, " පීඒඑස් පෙති ආදිය සැපයීම සඳහා ටෙන්ඩර්, 1965.12.21 දින උදේ 10 ට " යනුවෙන් සඳහන් කළ යුතු වෙයි.

4. ටෙන්ඩර්, ගාලු මුවදොර මහා ලේකම් ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය අමාත්‍යාංශයේ, කාමර අංක 155 හේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීම හෝ ලියා පදිංචි තැපැලෙන් එවීම හෝ කළ හැක. එහෙත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන්, තමන්ට අවශ්‍යයයි හැඟේ නම්, සීල් තබන ලද ටෙන්ඩර්පත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපලේකම් තැන වෙත පුද්ගලිකව ගෙනැවිත් බාරදීම ද කළ හැක. එසේ බාර දෙන සීල් තබන ලද කවරයේ, එය කිනම් සැපයීමක් සඳහාද යන වග හා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. එම ටෙන්ඩර්පත් බාර ගැනීම සඳහා ඉහතකී නිලධාරි තැනට බලය ඇත. සීල් තැබූ ටෙන්ඩර් පත් බාර ගත් බවට කුවිතාන්සියක් එවිට ටෙන්ඩර්කරු වෙත ඔහු විසින් නිකුත් කරනු ලැබේ.

5. සුප්‍රසිද්ධ නිෂ්පාදන සමාගමක ඒජන්තවරයෙකුට හෝ වෙළෙඳ නියෝජිතයෙකුට වුවද ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. එහෙත් අයදුම්කරු නම් කරන ලද නිෂ්පාදන සමාගමේ නියෝජිත ඒජන්තවරයෙකු බව සහතික කළ යුතු වෙයි. (මේ සඳහා නියෝජිතත්වය ඔප්පු කිරීමක් ඉදිරිපත් කළ යුතු වෙයි.) නැතහොත්,

6. 1955 ඔක්තෝබර් 28 වෙනි දින අංක 10,854 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ සඳහන් අයුරු, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 1949 සහ අංක 25 දරණ ආහාර හා ඖෂධ පනත යටතේ පනවන ලද රෙගුලාසි අනුව, ඖෂධ විකිණීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත් වලංගු බලපත්‍රයක් ඇති, බලයලත් වෙළෙඳුන්ගෙන් පමණක් මෙම සැපයීම සඳහා ටෙන්ඩර් පත් බාර ගනු ලැබේ. ලාංකික සම්බන්ධතා ඇති රාජ්‍යවූ ඇල්බේනියාව, ඔස්ත්‍රියාව, බල්ගේරියාව, චීන මහජන සමූහාණ්ඩුව, චෙකොස්ලොවැකියාව, ටායිවාන්, ජර්මන් ෆෙඩරල් සමූහ ආණ්ඩුව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව,

හන්ගේරියාව, ජපානය, කොරියාව, පෝලන්තය, රුමේනියා මහාජන සමූහආණ්ඩුව, ස්පාඤ්ඤය, සෝවියට් රුසියාව, යුගෝස්ලේවියාව, වියට්නාම් ප්‍රජාතන්ත්‍රවාදී සමූහආණ්ඩුව, ආදී රටවලින් මෙම සැපයීම ආනයනය කර සැපයීමට බලාපොරොත්තු වන ටෙන්ඩර්කරුවන් වෙනොත්, ඔවුන් ලියාපදිංචි කරන ලද වෙළෙන්දන් විය යුතු අතර ආනයන පාලක තැන විසින් නිකුත් කරන ලද සාමාන්‍ය බඩු ගෙන්වීමේ වලංගු බලපත්‍රයක් ලත් ඇත්තෝ විය යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලීමේදී ඉහත සඳහන් බලපත්‍රයක් හිමි බව ඔප්පු කළ යුතු වෙයි.

7. ටෙන්ඩර් කොන්දේසි සහ අනිකුත් විස්තර මෙම දැන්වීමේ 2 වන ඡේදයේ සඳහන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයෙන් (කොන්ත්‍රාත් හා සැපයීම් අංශය) ලබාගත හැක. මෙම කාර්යාලයෙන් ලබාගත් ආකෘති පත්‍ර, කොන්දේසි පත්‍ර ආදිය භාවිතා කළ හැක්කේ ස්වදේශීය ටෙන්ඩර්කරුවන්ට පමණි.

8. මෙහි පළමු වන ඡේදයෙහි සඳහන් පරිදි ටෙන්ඩර්කරු විසින් ස්වකීය ගණන් යෝජනාව ටෙන්ඩර් බාරගැනීමේ අවසාන දින සිට යටත් පිරිසෙයින් මාස 2 ක් වත් විවෘතව තැබිය යුතුය.

9. කෙලින් ම ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමැති විදේශීය නිෂ්පාදක මූලිකවරුන් වෙත ඔවුන්ගේ ලංකා නියෝජිතයන් සහ ඒජන්තවරුන් විසින් ටෙන්ඩර් කොන්දේසි, උපලේඛන හා මෙම ටෙන්ඩරය පිළිබඳ සියළුම විස්තර පහත සඳහන් රටවල සිටින ලංකාණ්ඩුවේ නියෝජිතයන්ගෙන් ලබාගත හැකි බව දැන්විය යුතුය. මහා බ්‍රිතාන්‍ය, ඇමරිකා එක්සත් ජනපදය, ඉතාලිය, පකිස්ථානය, ජපානය, ප්‍රංශය, බටහිර ජර්මනිය, චීන මහාජන සමූහආණ්ඩුව, සෝවියට් රුසියාව, කැනඩාව, නෙදර්ලන්තය, බෙල්ජියම, හංගේරියාව, බල්ගේරියාව, නැගෙනහිර ජර්මනිය, එක්සත් අරාබි සමූහආණ්ඩුව, බුරුමය, අයර්ලන්තය, අයිරානය, ඉරාකය, මාලදිවයින, උතුරු කොරියාව, ස්පාඤ්ඤය සහ ඉන්දියාවේ බොම්බාය සහ ඔස්ට්‍රේලියාවේ සිඩ්නිහි සිටින ලංකා වෙළෙඳ කොමසාරිස් සහ ලංකාවේ සිටින විදේශීය ආණ්ඩුවල නියෝජිතවරු සහ ඉන්දියාවේ දිල්ලියේ සිටින ලංකාවේ විදේශීය නියෝජිතයන්ගෙන්.

10. ටෙන්ඩර්කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර සමග නිකුත් කරන ටෙන්ඩර් කොන්දේසිවල 11 වෙනි ඡේදය කෙරෙහි ටෙන්ඩර්කරුවන්ගේ අවධානය යොමු කරනු ලැබේ. කොළඹ, රජයේ බෙහෙත් ගබඩා අධිකාරිට යැවිය යුතු මෙම බඩුවල ආදර්ශ භාණ්ඩ (සැම්පල්ස්) සම්බන්ධ විස්තර එම ඡේදයෙහි සඳහන් කර ඇත. ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුත්තේ ටෙන්ඩර් පත් පමණි. ආදර්ශ භාණ්ඩ (සැම්පල්ස්) එහි තැන්පත් නොකළ යුතුය. ටෙන්ඩර් පත් සමාප්ත කරන දිනයේ නියම වේලාවට ප්‍රමාදව ලැබුණු සැම්පල්ස් සැළකිල්ලට භාජනය කරනු නොලැබේ.

11. මෙහි 1 වන ඡේදයේ සඳහන් ස්ථානයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේ සැම ටෙන්ඩර්කරුවෙකුටම එම ස්ථානයේ සිටීමට අවසර තිබේ. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ මිළ ගණන් එහි පැමිණ සිටි ටෙන්ඩර්කරුවන්ට කියවනු ලැබේ. ලැබී තිබුණ ටෙන්ඩරයක් පරීක්ෂා කර බැලීමට යම්කිසි ටෙන්ඩර්කරුවෙකුට අවශ්‍ය නම්, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන සමග කටයුතු පිළියෙළ කර ගැනීමෙන් පසු එසේ පරීක්ෂා කර බැලීමට ඉඩ දෙනු ලැබේ.

12. ටෙන්ඩර්කරුවන් විසින් රුපියලේ වටිනාකම හා විදේශීය විනිමය වටිනාකම වෙන වෙනම තමන්ගේ මිළ ඉදිරිපත් කිරීම්වල සැම විෂය අංකයක් වෙනුවෙන් ම සඳහන් කළ යුතු වන්නේය.

එස්. බාලක්‍රිෂ්ණන්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1965. 9.8 වනදා,
කොළඹ, 10,
ඩීන්ස් පාරේ අංක 355 දරණ තැන පිහිටි,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම) කාර්යාලයේදී.

## අදාල උපලේඛනය

| විෂය අංකය | විස්තරය | ඇස්තමේන්තු කළ අවශ්‍යතා | | අවශ්‍ය ඇසුරුම් |
|---|---|---|---|---|
| 1. | සෝඩියම් ඇමිනො-සැලිසිලේට් බි.පි. 1963 (සීනිදවටන) සුගර් කෝටඩ් නොව එන්ටරික් කොඩ්. සැම පෙත්තකම සෝඩියම් ඇමිනෝ-සැලිසිලේට් ග්‍රෑම් 0·5 අඩංගු විය යුතුය | පෙති 1,00,000,000 | ... | පෙති 1,000 බැගින් ලිවර් මූඩි සහිත ටින් තුළ |
| 2. | ස්ට්‍රෙප්ටොමයිසින් සල්ෆේට් බි.පි. සැම කුප්පියකම ස්ට්‍රෙප්ටොමයිසින් බේස් ග්‍රෑම්ස් 5 බැගින් අඩංගු වන සේ | කුප්පි 2,00,000 | ... | පහසු ක්‍රමයක ඇසිරීමක් |
| 3. | අයිසොනියසිඩ් සහ තයසිටසෝන් සංකලනය (කොම්බිනේෂන්) සැම පෙත්තකම අයිසොනියසිඩ් මි.ග්‍රෑ. 75 ක් සහ තයසිටසෝන් මි.ග්‍රෑ. 37·5 ක්ද අඩංගු විය යුතුය. | පෙති 50,00,000 | ... | පෙති 1,000 බැගින් බෝතල් තුළ |

බාරදීමේ ක්‍රමය.—

මෙහි අංක 1–3 දක්වා ඇති විෂයයන්ගේ සම්පූර්ණ තොගය සමාන තොග 3 කින් රජයේ බෙහෙත් ගබඩාවට ගෙනැවිත් බාර දිය යුතුවෙයි.

ටෙන්ඩර්කරු ණයවර ලිපියක් විවෘත කරන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලා සිටින්නේ නම් සඳහන් කළ මිළ ගණන, මිළ සහ කොළඹට ගෙන ඒමේ ගාස්තු සහ ඇහිරුම් හා අනිකුත් සියළුම ගාස්තු ඇතුළුව මිළ ඖෂධ නිෂ්පාදන රටේ මුදලින් හා ලංකා මුදලින් ද සඳහන් කළ යුතුය. නැව් මාරුවට ඉඩ දෙනු නොලැබේ.

මෙම සැපයීමේ සැම විෂයයක්ම හා ඒවා බහා එවන සැම භාජනයකම '' ඔටුන්න ලකුණ '' හා සි/සිඑම්එස් 2656/65–66 යනුවෙන් සඳහන් කර තිබිය යුතුය.

9–755—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ 1965 ඔක්තෝබර් මස 8 වෙනි දින පෙ. ව. 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර මාතලේ අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාසලේ නම | | කළයුතු වැඩය |
|---|---|---|
| (1) මා/තිත්තවැල්ගොල්ල විද්‍යාලය | ... | පාසල් ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ |
| (2) මා/මොරගොල්ල විද්‍යාලය | ... | පාසල් ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ |
| (3) මා/ඉහල දිග්ගල විද්‍යාලය | ... | පාසල් ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ |

සංලක්ෂ්‍යය : මා = මාතලේ දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කාර්යාලයේ රු. 100ක තැන්පත් මුදලක් සඳහා කුවිතාන්සියක් මාතලේ අධ්‍යාපන නිලධාරිතැන වෙත ඉදිරිපත් කිරීමේදී, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අංක 1 සඳහා රු. 10,000 හෝ ඊට වැඩි මුදලකටද, අංක 2 සහ 3 සඳහා රු. 15,000 හෝ ඊට වැඩි මුදලකටද ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වූ අයට 1965 ඔක්තෝබර් මස 7 වැනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඕඩර්, තැපැල් ඕඩර් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල් සඳහා මුදල් ගෙවීමේ කුවිතාන්සි කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන අධ්‍යක්ෂක පාසල් ගොඩනැගිලි අංශයෙන්, හෝ මාතලේ අධ්‍යාපන නිලධාරිතැනගෙන් ලබාගත යුතුය. ඉහත සඳහන් මුදල් ප්‍රමාණයන් සඳහා ලියාපදිංචිවූ බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් මුදල් ගෙවීමේ කුවිතාන්සි ලබාගත හැකි බව සිතට ගත යුතුය.

3. පූර්වෝක්ත 2 වැනි ඡේදයේ නියමිත වශයෙන් දක්වෙන මුදල් ප්‍රමාණයන් සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ලියාපදිංචි වී තිබේ නම් මෙකී වැඩ සඳහා අනුමත කළ සමිතිවලටද ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ හැකිවේ. අනුමත කළ සමිතිවලට විශේෂ ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන බැවින් ඔවුන්ගේ

ටෙන්ඩරය එකී පෝරමයේ ලියා ඉල්ලුම් කළ යුතුය. ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවීමෙන් අනුමත කරනු ලැබූ සමිති නිදහස්ය. යථෝක්ත 2 වැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයන් සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් ඒවාට විශේෂ ටෙන්ඩර් පෝරම් නිකුත් කරනු ලැබේ.

4. සියළුම විස්තර හා තොරතුරු ලබාගත හැකිවූද, ඔවුන්ගේ කායසීලයේදී සැලැස්ම බලාගත හැකිවූද මාතලේ අධ්‍යාපන නිලධාරී තැනගෙන් පූර්වෝක්ත 2 හා 3 ඡේදයන්හි සඳහන් කර තිබෙන ටෙන්ඩර් පත්‍ර ලබාගෙන පිටපත් 2කින් යුක්තව ලියාපදිංචි කළ තැපැලෙන් ඉදිරිපත් කළ යුතුය. තැපැල් මගින් එවනු ලබන ටෙන්ඩර් පත්‍ර මාතලේ අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවන් විසින් ලියාපදිංචි කළ තැපැලෙන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අකමැති වන්නේ නම්, ටෙන්ඩර්කරුගේ සේවා විස්තර, නම, ලිපිනය කවරයේ දක්වෙන සේ සීල් තැබූ ටෙන්ඩර් තමන් විසින් හෝ තමාගේ නියෝජිතයෙකු විසින් හෝ මාතලේ අධ්‍යාපන කාර්යාලයේ කායසීල සහකාරතුමා වෙත පුද්ගලිකව ඉදිරිපත් කොට එතුමාගෙන් ටෙන්ඩරය භාරදුන් බවට ලියවිල්ලක් ලබා ගත යුතුය.

5. 1965 ඔක්තෝබර් මස 8 වැනි දින පෙ. ව. 10.30 ට මාතලේ අධ්‍යාපන කාර්යාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමේ දී ටෙන්ඩර්කරුවන්ට එහි පෙනීසිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන නිලධාරිතැන විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් වෙත දනුම් දෙනු ලැබේ.

6. ටෙන්ඩර් පත්‍ර අවසන් වන දින සිට සති 6ක කාල පරිච්ඡේදයක් දක්වා තමන් ඉල්ලුම් කළ මිළ ගණනට වැඩය භාරගැනීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුය.

7. තව දුරටත් අවශ්‍ය විස්තර, ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කිරීම පිණිස මාතලේ අධ්‍යාපන කායසීලයෙන් ලබාගත හැකිය.

8. උළු සෙවිලි කළ යුතු ගොඩනැගිලිවලට මෙරට උළු යෙදිය යුතුය. මෙම උළුවල තරාතිරම නියත වශයෙන් දනගැනීමට පරීක්ෂණයක් අවශ්‍ය නම්, එය පැවැත්වීම සපයන්නාගේ වියදමෙන් විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ලංකා ආයතනය මගින් කර ගත හැකිවේ.

පී. බී. රත්නායක,
මාතලේ අධ්‍යාපන නිලධාරී.

අධ්‍යාපන කායසීලය,
මාතලේ, 1965.9.9 වැනි දින.

9–667—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

**මහනුවර අරුප්පොල නිවාස ක්‍රමයේ සිව් මහල් කොටස් වශයෙන් තට්ටු නිවාස 128 ක් ඉදිකිරීම**

1965 අගෝස්තු 27 දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වෙනි කොටස (II) වැනි ඡේදයෙහි 1161 වෙනි පිටුවෙහි ගැසට් නිවේදනයට ඔබේ අවධානය යොමු කරවන අතර, යථෝක්ත කාර්යය සඳහා ටෙන්ඩර් භාරගැනීම 1965 ඔක්තෝබර් 1 වෙනි සිකුරාදා පෙරවරු 10 වනතුරු දීර්ඝ කර ඇති බව දන්වා සිටිමි. 1965 සැප්තැම්බර් මස 28 වෙනි අඟහරුවාදා දහවල් 12.00 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

ඊ. අයි. මුනසිංහ,
ජාතික නිවාස කොමසාරිස් වෙනුවට.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
ත. පෙ. නො. 44,
කොළඹ 2.
1965 සැප්තැම්බර් 7.

9–590—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## සමාජසේවා දෙපාර්තමේන්තුව

පහත සඳහන් උපලේඛනවල පෙන්නුම්කර ඇති ද්‍රව්‍ය සීදූවේ අඳ බිහිරි වැඩපළට සැපයීම සඳහා 1965 සැප්තැම්බර් මස 30 වන දින පෙරවරු 10.00 වන තෙක් පහත අත්සන් කර ඇති ම විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. ද්‍රව්‍ය සැපයිය යුතු කාලය 1965.10.1 සිට 1966.9.30 දක්වා (දෙදිනම ඇතුළත්ව) :—

**අවශ්‍ය ද්‍රව්‍ය විස්තරය**

### උපලේඛනය 1

(1) 2/30 සුදු (බිළිච්ඩ්) නූල්
(2) සුදු (බිළිච්ඩ්) නූල්
(3) 1/50 සුදු (බිළිච්ඩ්) නූල්
(4) 2/100 සුදු (බිළිච්ඩ්) නූල්
(5) 2/20 ග්‍රේ නූල්
(6) 2/30 ගේ නූල්
(7) 2/40 ගේ නූල්
(8) 1/20 ගේ නූල්
(9) 1/16 ගේ නූල්
(10) 1/20 පාට නූල්
(11) 2/20 පාට නූල්
(12) 2/30 පාට නූල්
(13) 2/40 පාට නූල්
(14) 2/100 පාට නූල්
(15) 1/16 පාට නූල්
(16) 1/20 පාට නූල්
(17) 1/50 පාට නූල්

### උපලේඛනය 2

(1) සිංගප්පූරු වේවැල්
(2) මා වේවැල්

### උපලේඛනය 3

(1) 3 ප්ලයි ගෙතුම් නූල්
(2) 2 ප්ලයි ගෙතුම් නූල්
(3) 4 ප්ලයි ගෙතුම් නූල්
(4) ගොතන නූල්

2. ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට ප්‍රථම මෙම කාර්යාලයේ හෝ දිසාපති කාර්යාලයක හෝ රු. 50 ක ඇප මුදලක් තැන්පත් කළ යුතුය. දිසාපති කාර්යාලයක ඇප මුදල් තැන්පත් කළහොත් ටෙන්ඩර් පෝර්ම ලබාගැනීම සඳහා ඇප මුදල් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය. 1965 සැප්තැම්බර් මස 30 වන දින උදේ 10.00 දක්වා ටෙන්ඩර් පෝර්ම භාරදීමට ඉඩ ලැබේ.

3. ටෙන්ඩර් පිටපත්වලට අමුණා ඇති උපලේඛනවල මිළ ගණන් වචනයෙන් සහ ඉලක්කම්වලින් පැහැදිලිව සටහන් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක බහා සීල් තබා සමාජසේවා අධ්‍යක්ෂකතුමාගේ කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීම හෝ තැපැලෙන් එවනවානම් ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ කළයුතුය. සෑම ටෙන්ඩරයක්ම බහා එවන ලියුම් කවරයේ වම් පස උඩ කෙළවරෙහි " සීදූවේ අඳ බිහිරි වැඩපළට භාණ්ඩ සැපයීම " යනුවෙන් සඳහන් කළ යුතුයි.

5. පිළිගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් මා නියෝග කරණු ලබන දින සිට සති දෙකක් ඇතුළතදී ද්‍රව්‍යයන් සැපයිය යුතුයි. යමෙක් එය පැහැර හැරියහොත් හෝ සැපයීමට අසමත් වුවහොත් ඔහුගේ තැන්පත් මුදල් රාජසන්තක වනවාත් හැර ඔහුගේ නම රජයේ කොන්දේසි කඩ කළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නේය.

6. ඉල්ලුම්කරුවන්ට උවමනානම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී එනම් 1965.9.30 වන දින ප. ව. 2.00 ට පැමිණ සිටිය හැක.

7. වැඩි විස්තර උවමනානම් එය සමාජසේවා අධ්‍යක්ෂතුමාගෙන් හෝ සීදූවේ අඳ බිහිරි වැඩපළේ සාමාන්‍යාධිකාරිගෙන් ලබාගත හැක.

දොස්තර ආර්. ඇල්. තිරුචෙල්වම්,
සමාජසේවා අධ්‍යක්ෂ.

1965 සැප්තැම්බර් 13,
කොළඹ.

9–770/1—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

## සමාජ සේවා දෙපාර්තමේන්තුව

**අද බිහිරි වැඩපොල, සීදූව**

1965 ඔක්තෝබර් මස 1 වෙනිදා සිට 1966 සැප්තැම්බර් මස 30 වෙනි දින ඇතුළත් කාලය තුළ සීදූවේ අද බිහිරි වැඩපොළට අයත් නේවාසිකාගාරයට අප්ප සහ රසකැවිලි සැපයීම සඳහා සිල් තබන මුද්‍රාකළ ටැන්ඩර් පත්‍ර 1965 සැප්තැම්බර් මස 30 වෙනි දින උදය 10 දක්වා පහත අත්සන් තැබූ අය විසින් භාරගනු ලැබේ.

ඕනෑම කච්චේරියක රුපියල් 25ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් පහත අත්සන් තැබූ අයවෙත ඉදිරිපත් කළ විට ටැන්ඩර් ආකෘතිපත්‍ර ලබාගත හැක.

ඇස්. ඇස්. සූරියගොඩ,
වැඩ බලන සාමාන්‍යාධිකාරි තැන.

1965 සැප්තැම්බර් 13 වෙනි දින,
අද බිහිරි වැඩපොල, සීදූව.

9-770/2—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

## සමාජ සේවා දෙපාර්තමේන්තුව

**අද බිහිරි වැඩපොල, සීදූව**

1965 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1966 සැප්තැම්බර් මස 30 වෙනි දින ඇතුලත් කාලය තුල මෙම ආයතනයේ කිලුටු රෙදි පිරිසිදු කිරීම සඳහා සිල් තබන මුද්‍රාකල ටෙන්ඩර් පත්‍ර 1965 සැප්තැම්බර් මස 30 වෙනි දින දවල් 10 දක්වා පහත අත්සන් තැබූ අය විසින් බාරගනු ලැබේ.

ඕනෑම කච්චේරියක රුපියල් 25 තැන්පත් කල බවට කුවිතාන්සියක් පහත අත්සන් තැබූ අය වෙත ඉදිරිපත් කල විට ටැන්ඩර් ආකෘති පත්‍රයක් ලබාගත හැක.

ඇස්. ඇස්. සූරියගොඩ.
වැඩබලන සාමාන්‍යාධිකාරි තැන.

1965 සැප්තැම්බර් 13 වෙනි දින,
අද බිහිරි වැඩපොල, සීදූව.

9-770/3—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය

**ගාල්ලේ සිමෙන්ති ඇඹරීමේ හා ඇහිරීමේ යන්ත්‍රාගාරය කාර්යාල සහ පරීක්ෂණාගාර ගොඩනැගිල්ල**

1. ගාල්ලේ කාර්යාල සහ පරීක්ෂණාගාර ගොඩනැගිල්ල ඉදි කිරීම පිළිබඳ ටෙන්ඩර් ලේඛන සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

2. ටෙන්ඩර් ලේඛන නිකුත් කොට බාරගනු ලබනුයේ—

(i) රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ 'ඒ' හෝ 'බී' කොටස යටතේ ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් හෝ නැතහොත්

(ii) මෙම ස්වභාවයේ වැඩ කිරීම සම්බන්ධයෙන් සිය හැකියාව පිළිබඳව මෙම සංයුක්ත මණ්ඩලය සෑහීමට පත් කරන පිළිගත් කොන්ත්‍රාත්කාර සමාගම්වලින් පමණී.

3. ටෙන්ඩර් ලේඛන සඳහා අයදුම්පත් සමග—

(i) තමන් විසින් දැනට කර ඇති කොන්ත්‍රාත්තු පිළිබඳ විස්තර සහ

(ii) රු. 100 ක ආපසු ගෙවිය හැකි තැන්පත් මුදලක්ද ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් භාර ගැනීම 1965 නොවැම්බර් 19 වැනි සිකුරාදා ප. ව. 2.00 ට අවසන් වෙයි. ටෙන්ඩර් ලේඛන සහ වෙනත් විස්තර කොළඹ 3, ගාලු පාරේ අංක 287 (තැ. පෙ. 1382) ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලයේ සැලසුම් හා ඉදිකැරුම් අංශයෙන් ලබා ගත හැකිය.

ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය,
තැ. පෙ. 1382,
287, ගාලු පාර,
කොළඹ 3.

ටෙලිෆෝන් : 2375/76.
1965 සැප්තැම්බර් 6.

9-708—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## හම්බන්තොට දිස්ත්‍රික්කයේ නියඟින් පෙළෙන ගම්වලට බීමට ජලය සැපයීම

1965 ඔක්තෝබර් මස 1 වන දින සිට 1966 සැප්තැම්බර් මස 30 වන දින දක්වා කාලය තුළ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගම්වලට සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තැන විසින් මින් මතු නියම කරනු ලබන ගම්වලට බීමට ජලය සැපයීම සඳහා ලොරි අයිතිකරුවන්ගෙන් 1965 සැප්තැම්බර් මස 29 වන බදාදා ප. ව. 2.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. ඉහත කී වේලාවෙන් පසු ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලබන හෙයින් ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

2. ටෙන්ඩර් ෆෝර්ම ලබා ගැනීම සඳහා හම්බන්තොට දිසාපති කායර්‍යාලයේ හෝ වෙනත් කච්චේරියක රු. 10 ක් තැන්පත් කොට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි. 1965 සැප්තැම්බර් 25 වෙනි සෙනසුරාදා පෙ. ව. 11.00 දක්වා ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර්පත්‍ර කවරයක බහා මුද්‍රා තබා කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ "හම්බන්තොට දිස්ත්‍රික්කයේ බීමට ජලය සැපයීම" යනුවෙන් සටහන් කොට, කච්චේරියේ ටෙන්ඩර් පෙට්ටියේ බහාලීම හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම හෝ කළ යුතුයි. ටෙන්ඩර්පත්‍ර පිටපත් දෙකකින් යුක්ත විය යුතුයි. තනි ගැනැප්මකට අය කරන ගාස්තුව පමණක් ටෙන්ඩර්පත්‍රවල අකුරෙන් හා ඉලක්කමෙන් ලිවිය යුතුයි.

4. ජලය සැපයීමට තෝරා ගනු ලබන ටෙන්ඩර්කරු විසින් එක ගමනකට යටත් පිරිසෙයින් වතුර ගැළුම් 800 ක් පමණ ගෙනා යුතුයි. දිසාපති තැනගේ නියමයන් අනුව සතුටුදායක ලෙස ජලය සැපයීම සඳහා රු. 500 ක ඇප මුදලක් හම්බන්තොට කච්චේරියේ තැන්පත් කළ යුතු වේ. තෝරාගත් ටෙන්ඩර්කරුට සතුටුදායක ලෙස ජලය සැපයීමට නොහැකි වුවහොත් ඉහත කී ඇප මුදල රාජසන්තක කරනු ලැබේ.

5. ජලය සැපයීමට තෝරා ගනු ලබන ටෙන්ඩර්කරු විසින්, දිසාපති තැනගේ නියමයන් අනුව ජලය සැපයිය යුතු වේ. දිනපතාම ජලය සැපයිය යුතුදැයි ස්ථිර වශයෙන්ම කිව නොහැකිය. ජලය සැපයීම පෙ. ව. 6.00—ප. ව. 6.00 දක්වා කාලය තුළ කළ යුතුය.

6. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු තමන් විසින්ම සපයා ගනු ලැබූ පිරිසිදු ගැල්වනයිස් ටැංකිවල හෝ බවුසරවල වතුර පුරවා ගෙන යා යුතුයි. සාමාන්‍යයෙන් අම්බලන්තොට ජලය සැපයීමේ මධ්‍යස්ථානයේ සිට ජලය ගෙන යා යුතුවේ. අවශ්‍ය වුවහොත් අන් කිසි ස්ථානයක සිට වුව ද ජලය ගෙන යන ලෙස ආණ්ඩුවේ ඒජන්ත තැන විසින් නියම කරනු ඇත.

7. බෙදීමේ ප්‍රමාණය එක් පුද්ගලයෙකුට දිනකට ගැ. 1/2 ක් වන අතර, පවුලකට ගැ. 5 කට නොවැඩි වන ලෙසය. සෑම ගමකටම දින දෙකකට වරක් වතුර බෙදිය යුතු අතර, කලින් කල හම්බන්තොට දිසාපති විසින් නියම කරනු ලබන ගම්වලට වතුර බෙදිය යුතුය.

8. තෝරා ගනු ලබන ටෙන්ඩර්කරු විසින් සතුටුදායක ලෙස ජලය සැපයීම සඳහා පොරොන්දු පත්‍රයක අත්සන් තැබිය යුතුයි. නිසියාකාර මෙම කාර්‍යය කිරීමට, තෝරගත් ටෙන්ඩර්කරුට නොහැකි වූ විට හෝ නිසියාකාර එය කළ නොහැකි බව ඔහු විසින් ලියවිල්ලකින් දැන්වීමෙන් පසු ඔහුගේ තැන්පත් මුදල යම්කිසි ටෙන්ඩර් කරුවෙකුට තම අභිමත පරිදි වැඩය භාර දීමට ආණ්ඩුවේ ඒජන්ත තැනට බලය තිබේ.

9. කිසිදු කරුණක් නොපෙන්වා ටෙන්ඩර්පත්‍ර එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ බලය ආණ්ඩුවේ ඒජන්ත තැන සතුය.

ඩබ්ලිව්. ලයනල් ප්‍රනාන්දු,
වැඩ බලන හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1965 සැප්තැම්බර් මස 8 වන දින,
හම්බන්තොට දිසාපති කාර්යාලයේදී ය.

9-716—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

## පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

1965-66 මුදල් වර්ෂය තුළදී කොළඹ 7, එඩින්බරෝ චන්ද්‍රවංක හී පිහිටි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සිට සහ එහි වෙත ලොරි/කරත්ත මගින් ගබඩා බඩු හා වෙනත් ද්‍රව්‍ය ප්‍රවාහණය කිරීම සඳහා කැඳවන ටෙන්ඩර් පත්‍ර පුරාවිද්‍යා කොමසාරිස් තැන විසින් 1965 ඔක්තෝබර් මස 7 වැනි බ්‍රහස්පතින්දා දවල් 12 වන තෙක් භාරගනු ලැබේ.

2. 1965 ඔක්තෝබර් මස 6 බදාදා පස්වරු 3.00 තෙක් පුරාවිද්‍යා කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්‍ර පිටපත් දෙකකින් යුක්තව එවිය යුතුයි. රු. 25 ක මුදලක් මෙම කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත්කොට ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් පසු මෙම ආකෘතිපත්‍ර නිකුත් කරනු ලැබේ.

3. වැඩි විස්තර පුරාවිද්‍යා කොමසාරිස් තැනගෙන් ලබාගත හැකිය.

චාල්ස් ගොඩකුඹුරේ,
පුරාවිද්‍යා කොමසාරිස්.

1965 සැප්තැම්බර් මස 8 වැනිදා,
කොළඹ 7,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ දීය.

9-732—65.9.17 දින අ ක 14,508 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

ජනසතු සේවා අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1965 නොවැම්බර් මස 24 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවට හොපර් බාජ්ස් දෙකක් සපයා භාර දීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1965 නොවැම්බර් මස 24 වෙනිදා පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට එහි පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛන කොළඹ වරාය කොමිෂන් සභා කායසීලයේදී පරීක්ෂා කළ හැක. රු. 100 ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 15 ක මුදලක් ලියකියවිලි ගාස්තු වශයෙන් වරාය කොමිෂන් සභා කාර්යාලයේදී තැන්පත්කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොළ ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසිවලට අනුව රු. 100 ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ. ලියකියවිලි ගාස්තු වශයෙන් තැන්පත් කරන රු. 15 ආපසු ගෙවනු නොලැබේ.

3. ඉහත සඳහන් අන්දමට ලබාගත් පෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත්කළ යුතුය. 1965 නොවැම්බර් මස 22 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත්කරනු ලැබේ.

4. අවලංගු කරන ලද ටෙන්ඩර් ලියකියවිලි හෝ විස්තර සටහන් පත්‍රිකා නිකුත්කරනු නොලැබේ.

ඇල්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

1965 සැප්තැම්බර් 17 දින,
කොළඹ වරාය කොමිෂන් සභා කායසීලයේදීය.

9-754—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාතීමේන්තුව

වාත්තු යකඩ සුන්බුන් ටොන් 100 ක් සැපයීමට සහ ගෙනැවිත් බාර දීමට ටෙන්ඩර් පත් රජයේ වැඩ හා තැපැල් අමාත්‍යාංශයෙහි ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1965 ඔක්තෝබර් මස 13 වැනි බදාදා පෙරවරු 11 වන තෙක් බාර ගනු ලැබේ.

2. කොලොන්නාවේ රජයේ කර්මාන්තශාලා ඉංජිනේරු තැනගේ කායසීලයෙහි දී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කළ හැක. රජයේ වැඩ දෙපාතීමේන්තුවේ ප්‍රධාන කායසීලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක, ටැන්ඩර් තැන්පත් මුදල වශයෙන් රුපියල් 50 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කර කර්මාන්ත ශාලා ඉංජිනේරු තැනගෙන් ඉල්ලුම් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් ලබාගත හැක. තැන්පත් කළ මුදල ආපසු ගෙවීම ටෙන්ඩර් කොන්දේසි අනුව කරනු ලැබේ.

මෙහි පහත සඳහන් ආයතනවලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අනවශ්‍යය :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය,
(ආ) වෙන ආණ්ඩුවල රාජ්‍ය වෙළඳ සංවිධාන. නිදර්ශන—චීන ජාතික යන්ත්‍රෝපකරණ ආනයන සංස්ථාව,
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කරණ ලද ග්‍රාම සංවර්ධන සමිති, සහ
(ඈ) සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කළ සමූපකාර සමිති.

3. මෙහි ඉහත සඳහන් පරිදි ලබාගත හැකි ආකෘති පත් වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. 1965 ඔක්තෝබර් මස 8 වෙනි සිකුරාදා දවල් 12.00 වන තෙක් ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කරනු ලැබේ.

4. " ලාංකික කරණ ලද මූලාංශ වලින් " එනම්, ජපානය, ජර්මනිය, චීනය, ඇල්මේනියාව, ඔස්ත්‍රියාව, බල්ගේරියාව, චෙකොස්ලෝවැකියාව, ඇස්තෝනියාව, හන්ගේරියාව, ලැට්වියාව, ලිතුඇනියාව, පෝලන්තය, රුමේනියාව, ස්පාඤ්ඤය, සෝවියට් සමාජවාදී එක්සත් සමූහාණ්ඩුව සහ යුගෝස්ලේවියා ආදී රටවලින් බඩු ගෙන්වා සැපයීමට බලාපොරොත්තු වන ටෙන්ඩර් කරුවන් ආනයන පාලක තැන විසින් නිකුත් කරන ලද පොදු ආනයන බල පත්‍රයක් ඇති ලියා පදිංචි කළ ලාංකික වෙළඳුන් විය යුතුය.

ඇස්. සෙල්ලදුරෙයි,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ 1, 1965 සැප්තැම්බර් 13.

9-771—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම්

## කැලෑ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසියේ විකිණීමයි

කැලෑ දෙපාර්තමේන්තුවේ දකුණු දිසාව භාර කැලෑ නිලධාරී විසින් බූස්සේ මධ්‍යම දැව ගබඩාවෙහි තිබෙන කඳන් තොග 33 ක් 1965 සැප්තැම්බර් මස 24 වන දින පෙරවරු 9.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසියේදී දැව ඉල්ලුම් කිරීමට අදහස් කරන්නන්ට ඒ ඒ ස්ථානයන් වෙත ගොස් දැව පරීක්ෂා කිරීමට අවසර දෙනු ලැබේ.

වෙන්දේසියේදී දැව ඉල්ලුම් කිරීමට අදහස් කරන අය වෙන්දේසි අවස්ථාවේදී කියවනු ලබන කොන්දේසි වලට අනුකූලව ක්‍රියා කළ යුතුය. මෙම වෙන්දේසිය සම්බන්ධයෙන් වැඩිදුරටත් විස්තර අවශ්‍ය අයට දකුණු දිසා භාර කැලෑ නිලධාරි කාර්යාලයෙන් හෝ බූස්සේ මධ්‍යම දැව ගබඩාවේ විශේෂ වන පාලක නිලධාරී තැනගෙන් හෝ පැමිණ ලබාගත හැක.

ඊ. ඩබ්ලිව්. සෙනෙවිරත්න,
දකුණු දිසා වන නිලධාරී, ගාල්ල.

1965 සැප්තැම්බර මස 1 වන දින,
ගාල්ලේ දිසා වන නිලධාරී කාර්යාලයේ දීය.

9-700—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

## කැලෑ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසියේ විකිණීමයි

තේක්ක, හල්මිල්ල, කොළන්, හුලන්හික් යන විශීයෙන් කඳන් 58 කින් සමන්විත ඝන අඩි 676.6 ගොඩවල් 13 කින් යුත් දැව තොගයක් 1965 ඔක්තෝබර් මස 4 වෙනි සඳුදා උදේ 10 ට ඒරාවූර් දුම්රිය අංගනයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉල්ලුම්කරුවන්ට දැව වෙන්දේසි කිරීමට පෙර පරීක්ෂා කර බැලිය හැක.

වැඩි විස්තර සඳහා පහත අත්සන් කරන මාගෙන් හෝ ඒරාවූර් දුම්රිය අංගනයේ සිටින වන ඔවසියර්ගෙන් හෝ විමසන්න.

කේ. අරුල්වෙල්ම්,
නැගෙනහිර දිසාවේ දිසා වන නිලධාරී.

1965 සැප්තැම්බර් 3 දින,
මඩකලපුව දිසා වන කාර්යාලයේ දීය.

9-701—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

## කැලෑ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසියේ විකිණීමයි

කැලෑ දෙපාර්තමේන්තුවට අයත්, කොළඹ, ඌරුගොඩවත්ත අංක 2 දරණ මධ්‍යම දැව ගබඩාවේ ඇති ඝන අඩි 2495.7 ක් පමණ ඇති ඉරූ දැව තොග 33 ක් 1965 සැප්තැම්බර් මස 24 වෙනි දින උදේ 10.00 ට එම දැව ගබඩාවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දැව වෙන්දේසියේ මිළදී ගැනීමට බලාපොරොත්තු වන අය එම ස්ථානයට ගොස් දැවවල තත්ත්වය හා ප්‍රමාණය ගැන බලා සෑහීමට පත්විය යුතුය. සෑම තොගයක් සඳහාම වැඩිම ලංසුව තබන්නා, එම දැව වෙන්දේසිය අවසන් වූ වහාම දැව වල සම්පූර්ණ මුදල් ගෙවිය යුතු අතර, එම දැව වෙන්දේසියේ විකුණනු ලැබූ දින සිට, රජයේ වැඩ කරන දින 3 ක් ඇතුළතදී ඉවත්කර ගත යුතුය.

වැඩි විස්තර කොළඹ, වන සංරක්ෂණ කායඹාලයෙන් හෝ කොළඹ ඌරුගොඩවත්ත දැව ගබඩාවේ ගබඩා පාලකගෙන් හෝ පැමිණ ලබාගත හැක.

වී. ජෝ. වීරරත්න,
වැඩ බලන වන සංරක්ෂක වෙනුවට.

වන සංරක්ෂණ කායඹාලයය,
තැ. පෙ. 509,
කිව්පාර, කොළඹ 2.
1965 සැප්තැම්බර් මස 14 දින.

9–798—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### අංගොඩ මානසික රෝහල් කිරි පට්ටියේ ගවයින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පහත සඳහන් ගවයින් 1965 ඔක්තෝබර 6 වැනි බුද දින පෙරවරු 10.00 ට අංගොඩ මානසික රෝහල් කිරි පට්ටියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ:—

| ගවයාගේ අංකය | | විස්තරය | | වර්ගය |
|---|---|---|---|---|
| 105 | ... | එළදෙන | ... | අයර්ෂයර් දෙමුහුන් |
| 113 | ... | එම | ... | එම |
| 131 | ... | එම | ... | එම |
| 134 | ... | එම | ... | එම |
| 143 | ... | එම | ... | එම |
| 145 | ... | එම | ... | එම |
| 164 | ... | එම | ... | එම |
| 188 | ... | එම | ... | ජර්සි දෙමුහුන් |
| 201 | ... | එම | ... | එම |
| 167 | ... | ගොනා | ... | ජර්සි තුමුහුන් |
| 194 | ... | එම | ... | ජර්සි තෙමුහුන් |
| 147 ජී | ... | වසු පැටවා | ... | එම |
| 150 ඊ | ... | එම | ... | එම |
| 154 ඊ | ... | එම | ... | එම |
| 154 එෆ් | ... | එම | ... | එම |
| 154 ජී | ... | එම | ... | එම |
| 156 එෆ් | ... | වසුපැටවා | ... | ජර්සි තෙමුහුන් |
| 157 බී | ... | එම | ... | එම |
| 171 ඊ | ... | එම | ... | එම |
| 191 බී | ... | එම | ... | එම |
| 204 ඒ | ... | එම | ... | එම |
| 204 බී | ... | එම | ... | එම |
| 209 ඒ | ... | එම | ... | එම |

මේ සතුන් අංගොඩ මානසික රෝහලේ කිරි පට්ටියේදී පරීක්ෂාකර බැලීමට කිරි පට්ටි කළමනාකරු සමඟ සතියේ දිනවල දී (රජයේ ප්‍රසිද්ධ නිවාඩු දින හැර) විධි විධාන යොදාගත හැක.

2. ජයග්‍රාහක ගැනුම්කරුවන් වෙන්දේසිය අවසන් වූ වහාම සම්පූර්ණ මුදල් ගෙවා සතුන් ගෙන යා යුතුය.

3. මෙම වෙන්දේසිය අවලංගු කිරීමට, කල් දැමීමට හෝ කවර ගැනුම් කරුවකු හෝ ඉවත් කිරීමට වෛද්‍ය අධිකාරී වෙත සම්පූර්ණ බලය ඇත.

4. වැඩිමනත් විස්තර අංගොඩ මානසික රෝහලේ කිරි පට්ටි කළමනාකාර තැනගෙන් ලබාගත හැක.

ජේ. එස්. පී. අබේවර්ධන,
වැඩ බලන වෛද්‍ය අධිකාරී.

1965 සැප්තැම්බර 10 වැනිදා,
අංගොඩ මානසික රෝහලේ දී යැ.

9–745—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## ලංකා සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව—දෙහිවල

### ඇතින්න පැටවෙකු වෙන්දේසියේ විකිණීම

1965 ඔක්තෝම්බර් මස 2 වෙනි සෙනසුරාදා පෙරවරු 10.30 ට දෙහිවල සත්වෝද්‍යානයේ දී අඩි 4, අඟල් 10ක් උසැති, වම් ඇස තුවාල වී ඇති, ඇතින්න පැටවෙක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම සතා, කවර දිනකදී වුවත් පෙ. ව. 9.00 සිට ප. ව. 4.30 දක්වා වූ කාලය තුළදී සත්වෝද්‍යානයේ දී පරීක්ෂා කර බැලිය හැකිය. වෙන්දේසිය අවසන් වූ විගස සම්පූර්ණ මුදල් ගෙවා සතා ඉවතට ගෙන යා යුතුය.

ඩබ්. එල්. ඊ. ද අල්විස්,
අධ්‍යක්ෂ.

1965 සැප්තැම්බර් මස 7 වැනිදා,
දෙහිවල, සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේදීය.

9–696—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

## රේගුවේ වෙන්දේසියයි

පහත සඳහන් බඩු රේගුවේ ප්‍රධාන නිවාරණ නිලධාරි තුමාගේ කායඹාලයෙහි 1965 සැප්තැම්බර් මස 24 වෙනි සිකුරාදා පෙරවරු 9.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ඇත.

මෙම බඩු 1965 සැප්තැම්බර් මස 23 වෙනි දින පස්වරු 1 සිට 4 දක්වා ගැණුම් කරුවන්ට සෝදිසි කර බැලිය හැක. මෙදිනට විකිණීමට තිබෙන සම්පූර්ණ බඩු ලැයිස්තුව මෙම කායඹාලයෙහි තිබෙන නාම පුවරුවෙහි දක්වා ඇත. වෙන්දේසි කොන්දේසි සහ වැඩි විස්තර මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිවාරණ නිලධාරි තුමාගෙන් විමසන්න :—

ෆ්‍රාන්සිස් බා රේඩියෝ 2 යි.
කපු සහ නයිලෝන් රෙදි පිළි බඩු.
ගිණිගල් පීන්.
කමිස් බොත්තන්.
මෝටෝ උපකරන සහ වෙනත් බඩු යනාදිය.

බී. අයි. ගුණතුංග,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

1965 සැප්තැම්බර් මස 9 වෙනි දින,
කොළඹ රේගු දෙපාර්තමේන්තුවේ,
නිවාරණ කායඹාලයේදීය.

9–650—65.9.17 දින අංක 14,508 දරණ ගැසට් පත්‍රය

---

## ග්‍රාමසංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

### වෙන්දේසියේ විකිණීමක්

තිබීමෙන් නරක්වුනු සහ අලාභ හානි සිදුවුනු අත්කම් භාණ්ඩ හා වෙනත් ගෘහ කර්මාන්ත නිෂ්පාදන තොගයක් කොළඹ යෝක් වීදියේ පිහිටි "ලක්සලේ" දෙවන මාලයේදී, 1965 සැප්තැම්බර් මස 20 වැනි දින සිට 1965 සැප්තැම්බර් මස 25 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් අන්දමට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :—

1965 සැප්තැම්බර් 20 වැනි සඳුදා සිට සැප්තැම්බර් 22 වැනි බදාදා දක්වා—ප. ව. 2 සිට ප. ව. 4.30 දක්වා.

1965 සැප්තැම්බර් මස 23 වැනි බ්‍රහස්පතින්දා සිට 24 වැනි සිකුරාදා දක්වා—පෙ. ව. 9 සිට ප. ව. 4.30 දක්වා.

1965 සැප්තැම්බර් 25 වැනි සෙනසුරාදා පෙ. ව. 9 සිට ප. ව. 1 දක්වා.

පී. එච්. පී. ද සිල්වා,
ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත
දෙපාර්තමේන්තුව, කොළඹ 7,
1965 සැප්තැම්බර් මස 6 වැනි දින.

9–974—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

අංකය : ඊ. එක්ස්. 4204

## රටබීම තැබැරුම් රේන්ද නැවත විකිණීම, 1965–66—කොළඹ දිස්ත්‍රික්කය

රජයෙන් අනුමත කරන ලද පහත සඳහන් එක්එක් ප්‍රාදේශික ප්‍රදේශයන්හි සුදුසු ස්ථානයක 1965 ඔක්තෝබර් 1 වැනිදින සිට 1966 සැප්තැම්බර් 30 වැනි දින දක්වා තනි අයිතිය පිට පහත සඳහන් කොන්දේසිවලට යටත්ව රටබීම (මෙරට සාදන ධාන්‍ය මත්පැන් ඇතුළුව) විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

(i) 1964 ජූනි මස 26 වැනි දින නො. 14,080 දරණ රජයේ ගැසට් පත්‍රයේ පෙනෙන රටබීම තැබැරුම් රේන්ද විකිණීමේ කොන්දේසි ;

(ii) සුරාබදු බලපත්‍රකරුවන් කාටත් ගැලපෙන දනට වලංගුව පවතින පොදු කොන්දේසි.

2. කොළඹ කච්චේරියෙන් ලබාගත හැකි නියමිත පෝරම මාර්ගයෙන් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ, පහත දක්වෙන (එෆ්) තීරයේ දක්වා තිබෙන නියමිත මුදල් භාණ්ඩාගාරයේ හෝ කච්චේරියේ තැන්පත් කිරීමෙන් ලබාගත් කුවිතාන්සියක් සමගය.

3. මුද්‍රාව තැබූ කවරයක බහනලද එක් එක් ටෙන්ඩර් පත්‍රය ඇතුළත් කවරයෙහි උඩ වම් කෙළවරේ මෙසේ සඳහන් කළ යුතුයි : " 1965–66 වර්ෂයේ කොළඹ දිස්ත්‍රික්කයේ අංක—— දරණ රටබීම තැබැරුම සඳහා ටෙන්ඩර් පත්‍රයයි ". ටෙන්ඩර් පත්‍ර තැබැරුමේ නමට කෙළින් පහත දී තිබෙන වේලාවන් සහ දිනයන්හිදී ලැබෙන සේ කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තුමාට එවිය යුතුයි.

ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාර ගන්නා අවසාන වේලාවේ දී කච්චේරියට පැමිණිය යුතුයි.

4. තෝරාගත් ටෙන්ඩර් කරු ඒ මොහොතේම ගැනුම්කරු වශයෙන් දනුම් දෙනු ලබන අතර, ඉහත පෙනෙන රටබීම රේන්ද විකිණීමේ කොන්දේසි ප්‍රකාර, 9 වැනි කොන්දේසියේ වරප්‍රසාදය යටතේ විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම සඳහා නියම කරනු ලබන මුදලක් තැන්පත් ඇප මුදල් වශයෙන් ආණ්ඩුවේ ඒජන්තතුමාට ගෙවිය යුතුයි.

5. මිලයට ගන්නා හැටියට වරප්‍රසාදය ලැබූ යම් ටෙන්ඩර්කරුවෙක් විකිණීම පිළිබඳ කොන්දේසිවලට අත්සන් කිරීම ප්‍රතික්ෂෙප කිරීමෙන් හෝ උවමනා කරන ඇප මුදල නියමිත අවස්ථාවේදී ඉදිරිපත් කිරීමට අපොහොසත්වීමෙන් ඔහු විසින් තබන ලද ටෙන්ඩර් තැන්පත් මුදලට අහිමියෙක් වන අතර වරදකරුවෙක් වශයෙන් ඔහුගේ නම සුරාබදු බලපත්‍ර සම්බන්ධ වරදකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නට ද පුළුවන. මෙයට විශේෂයක් වශයෙන් සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් විකිණීම සම්බන්ධ කොන්දේසි අත්සන් කළ පසු, ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ මුදල් ආපසු දීම සහ ඉහතකී සාර්ථක ටෙන්ඩර් කරු හෝ ලන්සුකරු විසින් තබන ලද ඇපය ද ආපසු ගෙවනු ලැබේ.

6. කිසි කරුණක් නොදක්වාම, එකක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීමේ බලය ආණ්ඩුවේ ඒජන්තතුමාට තිබේ.

7. අනුමත කරන ලද රටබීම තැබැරුම් ලැයිස්තුව පහත දක්වේ :—

කොළඹ නාගරික සභාව

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) කොට්ඨාශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (තැබැරුමට අයත්වියයුතු පෙදෙස) | (ඩී) විවෘත කරන වේලාව | (ඊ) වසන වේලාව | (එෆ්) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල | (ජී) ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව | (එච්) විකිණීම කරන දිනය |
|---|---|---|---|---|---|---|---|
| 1 ... | නො. 2 කොට්ඨාශය මෝදර | පෙදෙස මෙසේ සීමාවී තිබේ :—උතුරට : අළුත් මාවත පාරේ සහ මෝදර වීදියේ සන්ධිය දක්වාද, එම සන්ධියේ සිට මාදම්පිටිය පාරේ දකුණු පෙදෙසද ; නැගෙනහිරට : පහල සාන්ත ඇන්ඩෲගේ පෙදෙසේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වාද, එම සන්ධියේ සිට අළුත්මාවත පාරේ බටහිර පෙදෙසද ; දකුණට : සාන්ත ඇන්ඩෲගේ පාරේ සහ අළුත්මාවත පාරේ සන්ධිය දක්වාද, එම සන්ධියේ සිට පහල සාන්ත ඇන්ඩෲගේ පෙදෙසේ උතුරු පෙදෙසද ; බටහිරට : මාෂල් වීදියේ සහ පහළ සාන්ත ඇන්ඩෲගේ පෙදෙසේ සන්ධිය දක්වාද, එම සන්ධියේ සිට සාන්ත ඇන්ඩෲ පාරේ නැගෙනහිර පෙදෙස සහ මාදම්පිටිය හා මාෂල් වීදියේ සන්ධිය දක්වා එම සන්ධියේ සිට වූ මෝදර වීදියේ නැගෙනහිර පෙදෙසත්ය. | පෙ.ව. 8 ... | ප.ව. 7 ... | රු. 2,000... | පෙ.ව. 10 ... | 65.9.21 |

8. වැඩි විස්තර කොළඹ කච්චේරියෙන් ඉල්ලා යැවීමෙන් ලබාගත හැක.

1965 සැප්තැම්බර් 6 වැනි දින,
කොළඹ කච්චේරියේ දීය.

ඩබ්ලිව්. ඩී. ඩී. මහතන්තිල,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

9–536—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඊ. එක්ස්. 4203

## අරක්කු රේන්ද නැවත විකිණීම—කොළඹ දිස්ත්‍රික්කය—1965–66

1965 ඔක්තෝබර් 1 දින සිට 1966 සැප්ත ම්බර් 30 දින දක්වා තනි අයිතිය පිට පහත පෙනෙන කොන්දේසිවලට යටත්ව මතු දක්වෙන අරක්කු තැබැරුම් වල සිල්ලරට අරක්කු විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

(1) 1965 මැයි 28 දින අංක 14,407 දරන රජයේ ගැසට් පත්‍රයේ දක්වෙන අරක්කු රේන්ද විකිණීම පිළිබඳ කොන්දේසි ;

(2) සුරාබදු බලපත්‍ර සම්බන්ධ දනට වලංගුව පවතින පොදු කොන්දේසි ද ඇතුළත්ය.

2. පහත දක්වෙන කාර්යාලයන්ගෙන් ලබාගත හැකි නියමිත පෝරම මාර්ගයෙන් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ පහත දක්වෙන (එච්) තීරයේ දක්වා තිබෙන නියමිත මුදල් තැන්පත් කළ බවට කච්චේරියෙන් ලබාගත් කුවිතාන්සියක් සමගය :—

(ඒ) ඕනෑම කච්චේරියකින්,
(බී) සුරාබදු කොමසාරිස්තුමාගේ කාර්යාලය, කොළඹ 6,
(සී) කොළඹ සුරාබදු මණ්ඩල කාර්යාලය,
(ඩී) කළුතර සුරාබදු මණ්ඩල කාර්යාලය,
(ඊ) හලාවත සුරාබදු මණ්ඩල කාර්යාලය.

ලංකා පුරවැසියන් නොවූ කිසිම කෙනෙකුගේ ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ. (ඉහත කී අරක්කු රේන්ද විකිණීම පිළිබඳ කොන්දේසි 6 (1) (ඒ) බලන්න).

3. මුද්‍රාව තැබූ කවරයක බහන ලද එක් එක් ටෙන්ඩර්පත්‍රය ඇතුළත් කවරයෙහි උඩ වම් කෙළවරේ මෙසේ සඳහන් කළ යුතුය : "කොළඹ දිස්ත්‍රික්කයේ 1965–66 වර්ෂ අංක——දරණ අරක්කු තැබැරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය"...........ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනයත් සහ පහත දක්වෙන නියමිත වෙලාවටදී හෝ ඊට පෙර කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තුමාට ලැබෙන සේ එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාවේ දී කොළඹ කච්චේරියට පැමිණිය යුතුයි.

4. තෝරාගත් ටෙන්ඩර්කරු ඒ මොහොතේම ගැනුම්කරු වශයෙන් දනුම් දෙනු ලබන අතර, විකිණීම සඳහා කොන්දේසි අත්සන් කිරීමට අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි අනුව 9 (1) (ඒ) කොන්දේසි යටතේ නියමිත තැන්පත් ඇප මුදල ආණ්ඩුවේ ඒජන්ත තුමාට ගෙවිය යුතුයි.

5. මිලයට ගන්නා හැටියට වරප්‍රසාදය ලැබූ යම් ටෙන්ඩර්කරුවෙක් විකිණීම පිළිබඳ කොන්දේසිවලට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කිරීමෙන් හෝ උවමනා කරන ඇප මුදල නියමිත අවස්ථාවේදී ඉදිරිපත් කිරීමට අපොහොසත්වීමෙන් ඔහු විසින් තබන ලද ටෙන්ඩර් තැන්පත් මුදලට අහිමියක් වන අතර වරදකරුවෙක් වශයෙන් ඔහුගේ නම සුරාබදු බලපත්‍ර සම්බන්ධ වරදකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නට ද පුළුවන. මෙයට විශේෂයක් වශයෙන්, සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් විකිණීම සම්බන්ධ කොන්දේසි අත්සන් කළ පසු, ටෙන්ඩර්කරුවන් විසින් තැන්පත් කළ මුදල් ආපසු දීම සහ දෙවැනි සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් තබන ලද ඇපය ද ආපසු ගෙවනු ලැබේ.

6. කිසි කරුණක් නොදක්වාම එකක් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය ආණ්ඩුවේ ඒජන්ත තුමාට තිබේ.

7. තැබැරුම් භාරගත් අය විසින් තැබිය යුතු ඇපය පොළිපිට ණය දෙන ලංකාණ්ඩුවේ (පොළියට ණය දෙන යුද්ධ ණය මුදල්ද ඇතුළුව) ඕනෑම පොරොන්දු පත්‍රයක මාර්ගයෙන් ඉදිරිපත් කළ හැකිය. මේ ණය මුදල්වලට බැංකුවල ස්ථිර තැන්පත් මුදල්වලටත් වඩා වැඩි පොළියක් ගෙවන අතර රජය මගින් අර්ධ–වර්ෂ වශයෙන් පොළි ගණන් බලා මුදල් හිමියාට ගෙවනු ලැබේ. රේන්දු කාලය අවසන්වූ පසු එය ආපසු ලබාගත හැකිවාක් මෙන්ම එය ඊට පසු රජයේ ටෙන්ඩර් කිරීමේ රේන්දුයක් හෝ ගිවිසුමක් සඳහා ඇපය වශයෙන් එම සහතික ඉදිරිපත් කළ හැකි අතර, ඔහුගේ වෙන රේන්දුයක් හෝ ගිවිසුමක් රජය සමග නොමැති නම් එම සහතිකවල වටිනාකම කිසිත් අපහසුවක් නොමැතිව ලෙහෙසියෙන්ම ආපසු ලබාගත හැක. බැංකුවද මේ සහතික වැඩිමනත් ගැනීමේ ඇප වශයෙන් බාරගනු ලැබේ.

8. වැඩි විස්තර කොළඹ කච්චේරියෙන් ඉල්ලා යැවීමෙන් ලබාගත හැක.

ඩබ්ලිව්. ඩී. ඒ. මහකන්තිල,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

කොළඹ කච්චේරිය,
1965 සැප්තැම්බර් මස 11 වෙනි දින.

### කොළඹ දිස්ත්‍රික්කය

### ඉහත දක්වූ අනුමත කළ තබැරුම් ලැයිස්තුව

#### රේන්ද ප්‍රදේශය—කොළඹ නාගරික සභාව

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) ප්‍රදේශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (තැබැරුමට අයත් විය යුතු පෙදෙස) | (ඩී) විකිණීම කරන දිනය | (ඊ) ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව | (එෆ්) තැබැරුම් විවෘත කරන වේලාව | (ජී) තැබැරුම් වසන වේලාව | (එච්) ටෙන්ඩරය සඳහා තැන්පත් කළයුතු මුදල |
|---|---|---|---|---|---|---|---|
| 3 ... | නො. 2 කොට්ඨාශය, මෝදර | පෙදෙස මෙසේ සීමා වී තිබේ :—උතුරට : මෝදර වීදියේ සන්ධියේ සිට වෙරළාසන්න පෙදෙස සහ එම සන්ධියේ සිට ටෙම්පල් පාරේ දකුණු පෙදෙස ද, අළුත් මාවත පාර සහ මෝදර වීදියේ සන්ධිය දක්වාද, එහි සිට මාදම්පිටිය පාරේ දකුණු පෙදෙස ; නැගෙනහිරට : මාළල් වීදියේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වාද, එහි සිට අලුත්මාවත පාරේ බටහිර පෙදෙස ; දකුණට : වෙරළාසන්න පෙදෙසේ සිට අලුත් මාවත පාරේ සන්ධිය දක්වා සහ එහි සිට මාළල් වීදියේ උතුරු පෙදෙසද ; බටහිරට : මාළල් වීදිය සහ ටෙම්පල් පාර අතර වූ වෙළාසන්න කොටස ද වේත්. | 65.9.21 | ...දවල් 11.00 | ...පෙ.ව.8.00 | ...ප.ව. 7.00 ... | රු. 4,000 |

#### කොළඹ දිස්ත්‍රික්කය (නාගරිකයෙන් පිටත)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 8 ... | උතුරු අලුත්කුරු කෝරළේ (ඒ) | කුඩාපාඩුව ... | 21.9.65 | ...පෙ.ව. 11.30 | ...ප.ව. 10.00 | ...පෙ.ව. 9.00... | රු. 500 |
| 9 ... | එම ... | පෙරියමුල්ල ... | 21.9.65 | ...දවල් 12.00 | ...පෙ.ව.10.00 | ...ප.ව. 9.00... | රු. 2,000 |
| 11 ... | එම ... | පිටිපන ... | 21.9.65 | ...ප.ව. 2.00 | ...පෙ.ව. 8.00 | ...ප.ව. 7.00... | රු. 1,000 |
| 12 ... | එම ... | කුරණ ... | 21.9.65 | ...ප.ව. 2.30 | ...පෙ.ව.10.00 | ...ප.ව. 9.00... | රු. 2,000 |
| 13 ... | උතුරු අළුත්කුරු කෝරළේ (බී) ... | දංගොත්ත ... | 21.9.65 | ...ප.ව. 3.00 | ...පෙ.ව. 8.00 | ප.ව. 7.00... | රු. 500 |
| 20 ... | උතුරු අලුත්කුරු කෝරළේ 'ඒ' සහ දකුණු අළුත්කුරු කෝරළේ ... | කැපුන්ගොඩ (Kepungoda) ... | 21.9.65 | ...ප.ව. 3.30... | එම ... | එම ... | රු. 500 |
| 21 ... | බටහිර සියනෑ කෝරළේ අ.ස. ... | නුවරපාරෙන් හැරී යාර 400 කට නො අඩු දුරින් කඩවත රාගම පාරේ දෙපස පිහිටි කරගහමුනේ පළාත ගමේ සමණක් ... | 21.9.65 | ...ප.ව. 4.00... | එම ... | එම ... | රු. 3,000 |

## 1965/66 වර්ෂයේ අරක්කු තැබැරුම් නැවත වෙන්දේසියේ විකිණීම—පුත්තලම් පාලන දිස්ත්‍රික්කය

1965 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1966 සැප්තැම්බර් මස 30 වෙනි දින තෙක්වූ කාලසීමාව තුළ පහත සඳහන් ස්ථානයන්හි අරක්කු සිල්ලරයෙන් විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිළදී ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍රිකා පුත්තලමේ දිසාපති තැන විසින් පුත්තලමේ දිසාපති කාර්යාලයේදී භාරගනු ලැබේ. මෙම ටෙන්ඩර් පත්‍රිකා භාරගනු ලබන්නේ 1965.7.16 දින අංක 14,452 දරණ රජයේ ගැසට් පත්‍රයේ සඳහන් 1965/66 වර්ෂයේ අරක්කු තැබැරුම් වෙන්දේසි සම්බන්ධව නිකුත් කරන ලද කොන්දේසිවලට යටත්වය.

ටී. ඒ. ඇල්. ලුඩොවයික්,
පුත්තලමේ දිස්ත්‍රික්කයේ දිසාපති.

දිසාපති කාර්යාලය,
පුත්තලම, 1965 සැප්තැම්බර් 8.

### උපලේඛනය

| අනුක්‍රමික අංකය | කොට්ඨාශය | ග්‍රාමය | ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අන්තිම දිනය | හා වේලාවන් |
|---|---|---|---|---|
| 3 | පුත්තලම් පත්තුව | තේත්තපොල නැමැති ගම | 65.9.22 | පෙ.ව. 9.30 |
| 4 | එම | කන්දතොඩුවාව | එම | පෙ.ව. 10.00 |
| 7 | එම | කට්ටෙහිකාඩු | එම | පෙ.ව. 10.30 |
| 8 | එම | ඕත්තහානි (පෙරිය) ගම | එම | පෙ.ව. 11.00 |
| 10 | එම | ආඩිමුනෙයි | එම | පෙ.ව. 11.30 |
| 12 | කල්පිටිය | ඒතාලේ | එම | මධ්‍යාහ්න 12.00 |
| 16 | උතුරු පිටිගල් කෝරළය | වෙල්ලාවල | එම | ප.ව. 1.30 |
| 17 | එම | රාජකදළුවා | එම | ප.ව. 2.00 |
| 18 | එම | කරුක්කුපොනේ | එම | ප.ව. 2.30 |
| 19 | එම | දෙමටපිටිය | එම | ප.ව. 3.00 |
| 20 | එම | බණ්ඩාරවත්ත | එම | ප.ව. 3.30 |
| 21 | එම | පම්බල | 65.9.23 | පෙ.ව. 9.30 |
| 22 | එම | අඹකන්දවිල | එම | පෙ.ව. 10.00 |
| 29 | දකුණු පිටිගල් කෝරළය | පහලතල්ගස්අගාර | එම | පෙ.ව. 10.30 |
| 31 | එම | මුදුකටුව | එම | පෙ.ව. 11.00 |
| 32 | එම | දෙමටපිටිය | එම | පෙ.ව. 11.30 |
| 33 | එම | මොරකැලේ | එම | මධ්‍යාහ්න 12.00 |
| 35 | එම | උල්හිටියාව | එම | ප.ව. 1.30 |
| 37 | එම | බොරලැස්ස | එම | ප.ව. 2.00 |
| 38 | එම | වයික්කාල | එම | ප.ව. 2.30 |
| 39 | එම | නන්ජුන්ඩන්කරේ | එම | ප.ව. 3.00 |
| 42 | එම | ලුණුවිල | එම | ප.ව. 3.30 |
| 14 | දෙමළ හත්පත්තුව | ඉහළ මන්ඩලාන | එම | ප.ව. 4.00 |

9-629—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

### රජයේ වැඩ දෙපාර්තමේන්තුව

**1967 කැනඩාවේ, මොන්ට්‍රිල් හිදී පැවැත්වෙන ජාත්‍යන්තර ප්‍රදර්ශනයේ ලංකා ජාතික මණ්ඩපයට, විචිත්‍ර පිඟන් ගල්කැට ඇල්ලූ බිත්ති පනේලයක් සඳහා**

### තරඟය

පිඟන් ගල්කැට යොදා අවසානයේදී නිමකළ යුතු වෛවර්ණ බිත්ති පනේලයක් සඳහා ලාංකික කලාකරුවන්ගෙන් කෘතීන් 65.11.30වැනි අඟහරුවාදා ප. ව. 4.30 දක්වා බාරගනු ලැබේ. මෙම පනේලය ලංකා ජාතික මණ්ඩපයට පිටතින්, ප්‍රධාන දොරටුව අසල, තනිව සිටුවා තබනු ඇත. එය අඩි 27ක් දිගින්ද, අඩි 10 ක් උසින්ද යුක්ත වේ. මෙය, මනාව සකස්කළ සැලැස්මක් විය යුතු අතර, එහි ලෝකය හා සැසඳෙන ලෙස ලංකාවේ පිහිටීම සිතියම් මාර්ගයෙන් අලංකාර ලෙස දක්වෙන පරිදි සහ ලංකාවේ භෞතික සහ වෙනත් ලක්ෂණ මෙන්ම රටේ ඇති චිත්තාකර්ෂණීය දේවල් ද එම නිර්මාණය තුලම, වඩාත් විශාල පරිමාණයකින් පෙන්නුම් කළ යුතු ය.

මේ සඳහා උසස් තත්ත්වයෙන් යුත් සැලැස්මක් සහ නිර්මාණයක් බලාපොරොත්තුවන අතර, ජය ග්‍රාහක සැලැස්ම ලංකාවට ගෞරවයක් වන එකක් මෙන්ම මෙරට කලා කෞෂල්‍යය විදහා දක්වෙන එකක් වනු ඇතැයිද බලාපොරොත්තු වනු ලැබේ.

මේ සඳහා පහත සඳහන් තෑගි පිරිනැමේනු ඇත:—

පළමුවන තෑග්ග රු. 2,500

දෙවැනි තෑග්ග රු. 1,000

තුන්වැනි තෑග්ග රු. 500.

වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් වහාම විමසන්න:—

ප්‍රධාන නිර්මාන ශිල්පී,
රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ 1.

9–769—65.9.17 දින අංක 14,508 දරන ගැසට් පත්‍රය

---

**සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දයක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දයක මුදල් භාරගනු නොලැබේ.**

ලංකාවේ වැලව්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි